
# යොවුන් දහම් පාසල



**කතෝලික දහම් පාසල් අවසාන විභාගයේ අත්පොත**

ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

# යොවුන් දහම් පාසල

**කතෝලික දහම් පාසල් අවසාන විභාගයේ අත්පොත**

# පටුන


පිටුව

1. ගරු ජාතික අධ්‍යක්ෂ පියතුමාගේ පණිවුඩය 3

2. ලේඛකතුමාගෙන් 4

3. විෂය නිර්දේශය 5

4. I ඒකකය (කතෝලික විශ්වාසය) 9

5. II ඒකකය (කතෝලික ජීවිත පැවැත්ම) 33

6. III ඒකකය (සදාචාරාත්මක ජීවිතය) 68

7. IV ඒකකය (යාච්ඤාවේ ජීවිතය) 89

8. ප්‍රශ්න පත්‍ර 110

දයාබර සොයුරු සොයුරියනි, ආදර දරුවනි,

රජය මගින් හඳුන්වා දී ඇති කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය පිළිබඳව මේ වනවිට අපගේ මීසම භාර පූජා ප්‍රසාදීන් වහන්සේලා, දහම් ගුරු භවතුන් හා දරුවන් දැනුම්වත් වී තිබෙන බවට සැකයක් නැත. මෙම විභාගයට මුහුණ දී සමත් වන දරුවන්ට විද්‍යා පීඨවලට ඇතුලත්වීමේ දී මෙන්ම රජයේ රැකියාවන් සඳහා යොමු වීමේ දී යම් ලකුණක් ලබා ගැනීමට හිමිකම් ලැබී ඇත.

කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සඳහා නියමිත අත්පොත මෙලෙස ඔබ වෙත ඉදිරිපත් කරමි. එම විභාගයේ දී දරුවන්ට මුහුණ දීමට සිදුවන කතෝලික විශ්වාසය, කතෝලික ජීවිත පැවැත්ම, සදාචාරාත්මක ජීවිතය හා යාච්ඤාවේ ජීවිතය යන ප්‍රශ්න පත්‍ර හතර සඳහා අදාළ විෂය නිර්දේශය හා ප්‍රශ්න පත්‍ර කීපයක් මෙහි අන්තර්ගත වේ. මෙම ග්‍රන්ථය පරිශීලනය කිරීමෙන් තම දැනුම පමණක් නොව ආකල්ප හා කුසලතා වර්ධනය කරගෙන ජීවිත ඉලක්ක ජය ගැනීම සඳහා අප දරුවන් යොමුවනු ඇතැයි විශ්වාස කරමි.

මෙම සත්කාර්ය සඳහා දායක වූ ගරු සිරිල් එස් පෙරේරා පූජා ප්‍රසාදීන් වහන්සේ ඇතුළු අනෙකුත් අධ්‍යක්ෂ පූජා ප්‍රසාදීන් වහන්සේලාගේ මෙන්ම අතිගරු පියල් ජානක ප්‍රනාන්දු පූජා ප්‍රසාදීන් වහන්සේගේ කැපවීම ද අගය කරමි. එමෙන්ම මෙම පාඩම් මාලාව සකස් කළ ඔස්ටින් ඩයස් මහතාව ද කෘතගුණ පූර්වකව මතක් කරමි. ඔබ සැමට ජේසු පිහිටයි!

**ගරු බෙනට් ශාන්ත ප්‍රනාන්දු පියතුමා,**
ජාතික ධර්මෝපදේශ හා බයිබල් සේවා අධ්‍යක්ෂ

## කතෝලික ධර්මෝපදේශයේ නව ප්‍රවේශය

අයදුම්කරුවන් විසිදහසක් පමණ වාර්ෂිකව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ කතෝලික ධර්මය විෂයට පෙනී සිටිති. එයින් උසස් පෙළ සඳහා ක්‍රිස්තු ධර්මය විෂය හදාරන්නේ 4% ක් පමණය. ඉතිරි බහුතරයේ ආගමික අධ්‍යාපන වර්ධනය සඳහා මෙතෙක් විධිමත් වැඩ පිළිවෙළක් තිබුණේ නැත.

මේ ගැන දැඩි අවධානය යොමු කළ ජාතික ධර්මෝපදේශ කොමිසම යොවුන් දහම් පාසල පිළිබඳ සංකල්පය ක්‍රියාත්මක කළ යුතු යයි තීරණය කර දියත් කළ වැඩ පිළිවෙළේ එක් ප්‍රතිඵලයකි, මේ යොවුන් දහම් පාසල. අනෙක් ප්‍රතිඵලය වන්නේ අපේ යොවුන් පිරිස් වෙනුවෙන් වාර්ෂිකව විභාගයක් පැවැත්වීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය ලැබීම ය.

විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන අනෙක් ආගමික දහම් පාසල් අවසාන විභාග හා සමගාමී වියයුතු නිසා අපේ දහම් පාසල් අවසාන විභාගය සඳහා ද ප්‍රශ්න පත්‍ර සතරකි. මේ විෂය නිරර්දේශයේ අරමුණ වන්නේ දහම් දැනුම ලබාදීම ම නොවේ. කතෝලික යොවුන් ප්‍රජාව නිපුණතා පූර්ණ ක්‍රියාකාරී පිරිසක් වශයෙන් සභාවටත් සමාජයටත්, රටටත් වැඩදායක සම්පතක් බවට පත් කිරීම ය. ඒ සඳහා ඉදිරිපත් කර ඇත්තේ සරල විෂය මාලාවකි.

මේ වැඩ පිළිවෙල නොකඩවා පවත්වාගෙන යාමට වැඩිහිටියන් විසින් යොවුන් පරපුර මෙහෙයවනු ලැබීම කාලයේ අවශ්‍යතාවක් බව සැලකුව මැනවි.

**ඔස්ටින් ඩයස්**

## විෂය නිර්දේශය

## කතෝලික විශ්වාසය

**1. කතෝලික විශ්වාසය**

**1.** 1 මැවුම්කරුවාණෝ
1. විශ්වයේ ප්‍රභවය
2. මැවිල්ලේ අසිරිය
3. මැවිල්ල සුරැකීම (උත්පත්ති 1.2.3)

**1. 2. ගැලවුම්කරුවාණෝ**
1. ජේසුස් වහන්සේ (ජොහාන් 1:1-14)
2. දේව රාජ්‍යය පිළිබඳ ඉගැන්වීම් (මතෙව් 5.6.7)
3. උපමා (මතෙව් 13:1-52)
4. ප්‍රාතිහාර්ය (ජොහාන් 11:38-45, ලූක් 8:26-39, මාක් 2:1-12, මාක් 4:35-41)

**1. 3 ශුද්ධාත්මයාණෝ**
1. ක්‍රියාකාරීත්වය (ජොහාන් 7:37-39, 14:15-31, 16:5-15, 1 කොරින්ති 12:4-11)

**1. 4 කිතුනු සභාව**
1. ඒකත්වය, ශුද්ධත්වය, සාධාරණත්වය, අපෝස්තලිකත්වය
2. සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ලෙස රෝම 12:4-21, 1 කොරින්ති 12:12-31
3. සභාවේ පාලන සැලැස්ම
4. නිල බලය ලත් සේවය
5. පැවිදි සේවාවන්
6. ගිහි සේවාවන්

**1. 5 රූපාන්තර පරිවර්තනය**
1. මනුෂ්‍යයාගේ අවසාන සිද්ධි
2. අලුත් අහසක්, අලුත් පොළොවක් (එළිදරව් 21:1-4)

## II කතෝලික ජීවිත පැවැත්ම

### 2. 1 කතෝලික ජීවිත පැවැත්මට පන්නරය ලැබෙන ජනවන්දනාව

1 දිව්‍ය පූජාව සහ පූජා පිළිවෙත
2 පාස්කු අබිරහස
**3.** දේව වරප්‍රසාදය
4. ප්‍රසාද නිධාන පොදු ලක්ෂණ

**5. ආරම්භක ප්‍රසාද නිධාන**

- ප්‍රසාද ස්ථාපනය
- අභිවෘධි ආලේපය
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

**6. සුවය ලබා ගැනීමේ ප්‍රසාද නිධාන**

- සමගි සන්ද්‍රානය
- රෝගීන් ආලේපය

**7. සේවය සඳහා ස්ථාපිත ප්‍රසාද නිධානය**

- පූජකවරය
- ආශිර්වාදකාර බන්ධනය

## III කතෝලික සදාචාරාත්මක ජීවිතය

**3. කතෝලික සදාචාරය**

1 දසපණත සහ ප්‍රේමයේ පණතේ පැතිකඩ දෙක

2. දස පණත පූර්ණත්වයට පත් කළ ක්‍රිස්තුන් වහන්සේ

(මතෙව් 5:21-47)

3 තැනිතලා ස්ථානයේ දේශනය (ලුක් 6:17-49)

4. බුද්ධිය නිදහස් කැමැත්ත සහ හැඟීම්

5. දේව සම්බන්ධ ධර්ම ගුණ

6. හෘදය සාක්ෂිය

7. දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම (1-3 දේව පණත්)

8. අසල් වැසියාට ප්‍රේම කිරීම (4-10 දේව පණත්)

9. දසපණත තුළින් මතුවිය යුතු සාරධර්ම

10. කතෝලික අනන්‍යතාවය

## IV යාච්ඤාවේ ජීවිතය

**4. දේව සබඳතා ගොඩනැගෙන යාච්ඤාව**

**1. පුරාණ ගිවිසුමේ යාච්ඤාව**

- ආබ්‍රහම්
- මෝසෙස්

**2. නව ගිවිසුමේ යාච්ඤාව**

- ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළ විශේෂ අවස්ථා
- යාච්ඤාව පිළිබඳ විශේෂ ඉගැන්වීම් (ලූක්: 11:1-13)

**3. සභා ජීවිතය තුළ යාච්ඤාව**

- ප්‍රශංසාව
- තුති පිදීම
- යැදුම

- මැදහත් යැදුම
- භාවනාත්මක යාච්ඤාව

## 4. ස්වාමිවාක් ආරාධනයේ ඉල්ලීම් හත

- ඔබගේ නාමයට ප්‍රශංසා වේවා
- ඔබගේ රාජ්‍යය පැමිණේවා
- ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් මෙලොවෙහි ඉටු වේවා.
- අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව.
- අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව.
- පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදුන මැනව.
- අයහපතින් අප මුදා ගත මැනව.

## 5. විවිධ භක්ති අභ්‍යාස

- ජපමාලය
- නුවාන
- ශුද්ධ පැය

# 1 ඒකකය - කතෝලික විශ්වාසය

## ප්‍රවේශයඃ

දෙවියන් පිළිබඳ සම්බන්ධතාවක් මනුෂ්‍යයා තුළ සහජයෙන් ම පිහිටා ඇත්තේ ය. තමන්ට පැමිණෙන විපතකදී ආපදාවකදී ඔහු නිතැතින් ම හඬ ගසන්නේ දෙවියන්ට ය. මෙය සැම ආගමිකයකුටම පොදු පැවැත්මකි.

බොහෝ අය නො දැන නමස්කාර කරන ඒ දෙවියන් පිළිබඳව පාවුළුතුමා ග්‍රීසියේ ඇතැන්සයේ විද්වතුන් දැනුවත් කර ඇත්තේ මෙසේ ය.

,ඔබ නො දැන නමස්කාර කරන ඒ දෙවියන් මම ඔබට ප්‍රකාශ කරමි. ලෝකය ද, එහි සියල්ල ද මවා වදාළ දෙවියන් වහන්සේ ස්වර්ගයටත්, පොළොවටත් ස්වාමීව සිටින බැවින් ඔවුන් වහන්සේ, මිනිස් අතින් සාදන ලද මාලිගාවල නො වසන සේක. උදව් උපකාරයෙන් යැපෙන අයකු සේ ඔවුන් වහන්සේ මිනිස් අත්වලින් උපස්ථාන නො ලබන සේක. මන්ද සියල්ලන්ට ජීවනය ද, හුස්ම ද, අන් සියලු දේ ද දෙන්නේ ඔවුන් වහන්සේ ය. ඔවුන් වහන්සේ එක් මිනිසෙකුගෙන් සකල මිනිස් සංහතිය මවා වදාළ සේක. මිහිපිට වාසය කරන පිණිස නියමිත කාලයන් ද, වාසස්ථානවල සීමාව ද නියම කළ සේක. මෙසේ කළේ අතපත ගා යමින් වත් දෙවියන් වහන්සේ සම්බවන ලෙස ඔවුන් වහන්සේ සොයනු පිණිස ය. ඔවුන් වහන්සේ අප එකිනෙකාට නුදුරු ය. අපි ඔවුන් වහන්සේ තුළ ජීවත්වෙමු. හැසිරෙමු. පවතිමු. අපි ඔවුන් වහන්සේගේ දරුවෝ වෙමු. අප දේව දරුවන් වන බැවින්, දේවත්වය වනාහි මිනිස් කලා ශිල්පයෙන් සහ දක්ෂකමින් කැටයම් කළ රිදියටවත්, ගලකටවත් සමාන යයි නොසිතිය යුතු ය, (ක්‍රියා 12:23-29).

* දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට කථා කරන සේක. ආදි පිතුරුවරුන් මගින් ද, දිවැසිවරුන් මගින් ද, ස්වකීය පුත්‍රයාණන් මගින් ද මානව ඉතිහාසය තුළ ඔවුන් වහන්සේ කථා කර ඇත.
* දෙවියන් වහන්සේ සත්‍යවාදී ය. විශ්වාසවත් ය. සදාතනික ය.
* දෙවියන් වහන්සේ මනුෂ්‍යයා ගැන සුවිශේෂ සැලකිල්ලක් දක්වන සේක.
* දෙවියන් වහන්සේ සැම තැනම වැඩ වසන සේක. සියල්ල දන්නා සේක.

* දෙවියන් වහන්සේ පරිශුද්ධ ය. සාධාරණ ය.
* අයහපත අතුරෙන් යහපත උදාකරන සේක.
* දුක් වේදනා මගින් අප ගැලවීම කරා ගෙන යන සේක.
* සර්වබලධාරී ය. සර්ව ප්‍රඥාවත් ය.
* පව්කාරයන් කෙරෙහි කරුණාවන්ත වන සේක.
* මවන ලද ලෝකය මාර්ගයෙන් ඔවුන් වහන්සේ ප්‍රකාශ වන සේක.

## <u>1.1 මැවුම්කරුවාණෝ</u>

**විශ්වයේ ප්‍රභවය:**

ආරම්භයේ දී දෙවියන් වහන්සේ අහස ද, පොළොව ද මැවූ සේක. ඔවුන් වහන්සේ ආලෝකය ද, ආකාශය ද මැවූ සේක. ගොඩබිම ද, මුහුද ද මැවූ සේක. අහසෙහි තාරකා සහ ග්‍රහලෝක ද, පොළවේ සතුන් ද මැවූ සේක. දෙවියන් වහන්සේ තමන් විසින් මවන ලද සියල්ල බලා වදාරා එය යහපත් බව දුටු සේක. (උත්පත්ති 1)

ලෝකය සැමදා ම නො තිබිණි. එයට පටන් ගැන්මක් විය. එය ඉබේ ඇතිවූවක් නො වේ. දෙවියන් වහන්සේ වෙතින් පැමිණිනු දෙයකි. (විාඥයන්ගේ මතය අනුව අවුරුදු කෝටි 450 කට පමණ පෙර ඇතිවූවකි.) කිසිවකුගේ හෝ කිසිවක උපකාරයක් නැතිව දෙවියන් වහන්සේ ලෝකය මැවූ සේක.

තමන් වහන්සේගේ අසීමිත උත්තම ගුණ සමුදාය එළිදරව් කරනු සඳාහ ද, එය අනුන් සමග බෙදා ගනු සඳහා ද දෙවියන් වහන්සේ ලෝකය මැවූ සේක. එසේම තමන් වහන්සේගේ මහිම ප්‍රතාපය සඳහා ද, මැවිල්ලේ යහපත සඳහා ද ලෝකය මැවූ සේක.

දෙවියන් වහන්සේ ලෝකයට ප්‍රේම කරන සේක. ලෝකයේ පැවැත්ම සලසන සේක. තම බල පරාක්‍රමය ද, ප්‍රඥාව ද, ගුණ සමුදාය ද මැවිල්ලේ යහපත සඳහා යොදවන සේක. මානව ඉතිහාසය නිශ්චය කරන සේක. මෙලෙස ඔවුන් වහන්සේ ලෝකය පාලනය කරන සේක.

දෙවියන් වහන්සේ තමන් ස්වරූපය අනුව, ස්ත්‍රිය ද, පුරුෂයා ද වශයෙන් මනුෂ්‍යයා මැවූ සේක. මනුෂ්‍යයාට ආත්මයක් සහ ශරීරයක් ද, හෘදයක් සහ හෘද සාක්ෂියක් ද, බුද්ධියත් සහ අධිෂ්ඨානයක් ද ඇත්තේ ය. මනුෂයයා ආත්මයෙන් දේව සමානකම දරණ නිසා හෙතෙම ලෝකයේ අන් සියලු මැවිලි වලට වඩා උසස් ය. උතුම් ය.

**මැවිල්ලේ අසිරියඃ**

දෙවියන් වහන්සේ ලෝකය මවමින් එහි විශ්මය ජනක ක්‍රියා පටිපාටියක් සහ සැලැස්මක් ස්ථාපිත කළ සේක. දෙවියන් වහන්සේගේ ප්‍රඥාවේ සහ බල පරාක්‍රමයේ තරම ස්වභාව ධර්මය තුළින් ප්‍රකාශ වේ. තාරකාවලින් බබලන ගුවන් තලය පොළොව මත ඇත්තා වූ ගස් කොළන් සහ සතුන් විශ්මයජනක අන්දමින් ගැලපුණු අඟ පසඟ ඇති අපේ ශරීර සහ එහි ක්‍රියාකාරිත්වය ආදි සියල්ලෙන් ම ප්‍රකාශ වන්නේ දෙවියන් වහන්සේගේ සර්ව ප්‍රඥාවත් සර්ව බලධාරිත්වයත් ය.

මැවිල්ල තුළ අපට ජීවත්වීමට අවශ්‍ය සැම දෙයක්ම ඇත්තේ ය. පොළොව මතුපිට ඇති පරිසරයෙන් අපේ ආහාරපාන ඇතුළු සියලුම ජීවිත අවශ්‍යතාවන් පිරිමසා ගත හැකි ය. පොළොව තුළ රන් රිදී ඇතුළු විවිධ ඛණිජ වර්ග තැන්පත් කර ඇත. ගස්වැල් වලින්, විවිධ ශාකවලින්, මහ මුහුදෙන් අපට ලැබෙන සම්පත් අපමණ ය.

මැවිල්ල තුළින් මැවුම්කරුවාණන් හඳුනාගැනීමට අපට හැකි විය යුතු ය.

ඉතාම චමත්කාරජනක දර්ශනයක් වූ දේදුන්න ගැන සිතා බලන්න. මනුෂ්‍යයා කෙරෙහි ඇති දිව්‍ය සංරක්ෂණය පිළිබඳ පණිවුඩය දේදුන්නෙන් අපට ලැබෙන්නේ ය.

**මැවිල්ල සුරැකීමඃ**

,පුරුෂයා ද, ස්ත්‍රිය ද වශයෙන් මනුෂ්‍යයන් මැවූ දෙවියන් වහන්සේ ඔවුන්ට ආසිරි පතමින්, 'නුඹලා දරු සම්පත් ලබා වැඩි වර්ධනය වී පොළොව පුරා පැතිර එය යටත් කර ගන්න. මුහුදේ මසුන් කෙරෙහි ද, පොළොවේ සැරිසරන සියලු සතුන් කෙරෙහි ද, අහසේ පක්ෂීන් කෙරෙහි ද බලය පවත්වන්නැ. යි ඔවුන්ට වදාළ සේක., (උත්පත්ති 1:28).

මේ අනුව මිහිපිට ජීවත්වන මනුෂ්‍යයාට පරිසරය පිළිබඳව පැවරෙන වගකීම් කීපයක් ඇත්තේ ය.

- මැවිල්ල ආරක්ෂා කිරීම ද,
- සංවර්ධනය කිරීම ද,
- මැවිල්ල තුළ ඇති සම්පත් බෙදා හදා ගැනීම ද ඔහුට පැවරෙන වගකීම් ය.

නූතන මනුෂ්‍යයා මේ වගකීම් කොතෙක් දුරට ඉටු කරන්නේ ද. යි විමසා බැලීම අවශ්‍ය ය. තරුණ පෙළ මේ සඳහා පුරෝගාමී විය යුත්තෝ ය. පරිසරය මනුෂ්‍යයාගේ ජීවතයේම කොටසකි. එය විනාශ කිරීමෙන්, දූෂණය කිරීමෙන්, අනිසි ලෙස පරිහරණය කිරීමෙන් අද ලෝකය තුළ කොපමණ ගැටළු උද්ගතව ඇත් ද. යි සිතා බලන්න.

**ගැලවුම්කරුවාණෝ:**

,දේවදූතයා ඔවුන්ට කථා කොට .බිය නොවන්න, මෙන්න සකල ජනයා හට බොහෝ ආනන්දජනක මංගල පුවතක් මම ඔබ වෙත ගෙන එමි. කුමක් නිසා ද ස්වාමින් වන ක්‍රිස්තුන් නම් ගැලවුම්කාරයෙක් ඔබ හට දාවිත්ගේ නුවර අද උපන් හ. රෙදිවලින් ඔතා ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ඔබට සම්බ වන්නේ ය. එය ඔබට සලකුණ ය. යි කීය, (ලූක් 2:10-12).

ලූක්තුමා සඳහන් කරන මේ ගැලවුම්කරුවාණන් පිළිබඳව, ජොහාන්තුමා තම සුපුවත ආරම්භයෙහි ඉදිරිපත් කරන අදහස් අධ්‍යයනය කිරීම අවශ්‍ය ය.

,ජොහාන්තුමා ධර්මයාණන් වශයෙන් හඳුන්වන්නේ මිනිස්බව ගෙන මෙලොව ඉපදුන ශුද්ධ ත්‍රිත්වයේ දෙවන තැනැන් වහන්සේ වන දේව පුත්‍රයාණන් ය, (ජොහාන් 1:1-14)

ධර්මයාාණන් යනු දේව වචනයයි. ජොහාන් තුමා ඉදිරිපත් කරන මේ සංකල්පයත්, ශුද්ධ වූ බයිබලයේ උත්පත්ති පොතේ ආරම්භක වැකි කීපයත් අතර ඇති සම්බන්ධතාව ඔබට දැනගත හැකි ය.

ආරම්භයේ දී ධර්මයාණෝ සිටි සේක. ධර්මයාණෝ දෙවියන් වහන්සේ සමග සිටි සේක. අනාදියේ දී ඔවුන් වහන්සේ දෙවියන් වහන්සේ සමග

සිටි සේක. සියල්ල ඔවුන් වහන්සේ විසින් මවන ලදී. මවන ලද කිසිවක් ඔවුන් වහන්සේ නොමැතිව නො මවන ලදී. මවන ලද සියල්ල ඔවුන් වහන්සේගේ ජීවයෙන් ම විය, (ජොහාන් 1:91-4).

,ආරම්භයේදී දෙවියන් වහන්සේ අහසත්, පොළොවත් මැවූ සේක. පොළොව හිස්ව පාළුව තිබුණි. මහ සයුර මත අන්ධකාරයක් විය. දේවාත්මානුභාවය ජලය මතුපිට හැසුරුණේ ය. එවිට දෙවියන් වහන්සේ ආලෝකය වේවා’ යි වදාළ සේක. ආලෝකය විය, (උත්පත්ති 1-3).

ජේසුස් වහන්සේ මිනිස් බව ගෙන මෙලොව උපදින්නට පෙර ධර්මයාණෝ (වචනය තෙම) මුළු මිනිස් සංහතියට මඟ පෙන්වූ ප්‍රභාමත් ආලෝකය විය. ඒ බව හිතෝපදේශයේ සඳහන්ව ඇත්තේ මෙසේ ය.

,සමිඳාණෝ තමන් මැවූ සැම දෙයට ම පෙර, සියලු මැවිලිවල පළමුවැන්නා මෙන් මා මැවූ සේක. දුරාතීතයේ මහ පොළොව ඇතිවන්නට පෙර, ආරම්භයේ දී මම මවනු ලැබුවෙමි. සත් සමුදුර ඇතිවන්නට පෙර ජලය පිරුණු උල්පත් නොවූ සමයෙහි මම ජනිත වුනෙමි. ගිරිකුළු සහ කඳුවැටි නියම තැන්වල පිහිටෙන්නට පෙර මාගේ උපත විය. සමිඳාණන් මහ පොළොව සහ කෙත් වතු මවන්නට පෙර, ප්‍රථම පස් පිඩැල්ල සාදන්නට පෙර මම ඉපිද සිටියෙමි, (හිතෝපදේශ 8:22-26).

මේ අදහස සනාථ කරමින් ජොහාන්තුමා ධර්මයාණන් තුළින් ආරම්භ වූ මැවීමේ කාර්යය පෙන්වාදෙයි. (සියල්ල ඔවුන් වහන්සේ විසින් මවන ලදී.) එසේම මුළු මැවිල්ලේ ජීවය දේව වචනය බව ද අවධාරණය කර ඇත.

ඊළඟට ජොහාන්තුමා ආලෝකයත්, ජීවිතයත් අතර ඇති සම්බන්ධතාවය පෙන්වා දෙයි. භෞතික ලෝකය දෙස බැලුවත් ආලෝකය ජීවිත පැවැත්මේ සාධකය බව තේරුම් ගත හැකි ය. මේ සංයුක්ත අත්දැකීම ආධ්‍යාත්මික වියුක්ත සංකල්පයක් සඳහා ජොහාන්තුමා යොදාගෙන ඇත. උත්පත්ති පොතේ කතුවරයා ද මැවිල්ල ආලෝකය තුළින් ආරම්භ කර ඇත්තේ මේ බව තහවුරු කිරීමට ය.

ආලෝකය, කිසිවකුට විශේෂත්වයක් නොකර එක හා සාමනව ජනතාව ප්‍රභාමත් කරයි. මේ ආලෝකය නම් මිනිස් වර්ගයාගේ ආරම්භයේ සිට ඔවුන් හසුරවනු ලැබූ හෘදය සාක්ෂියයි. එය කිසිදු මානව සීමාවකින්

සීමා  කළ නො හැකි ය. විශ්ව ව්‍යාප්ත ආලෝකයකි. මේ ආලෝකය ජේසුස් වහන්සේ තුළ දේව ජනතාවට, විශේෂයෙන් ඊශ්‍රායෙල් සෙනඟට ලැබුණේ ය. (1:1-5)

1:6-8 දක්වා කොටසින් කියැවෙන්නේ ස්නාවක ජොහාන්තුමා ගැන ය. ඔහු වනාහි ආලෝකයට සාක්ෂි දරණ පිණිස එවනු ලැබූ තැනැත්තා ය. ඒ සාක්ෂි දැරීම ඔහුට පැවරුණු නිල කාර්යය විය. එහෙත් ස්නාවක ජොහාන්තුමා ඒ සැබෑ ආලෝකය නො වී ය. සාක්ෂි දැරීම යනු ආලෝකය කෙරේ විශ්වාසනීයව ඒ විශ්වාසය අන් අය තුළ ද ජනිත කිරීම ය.

1:-9-14 දක්වා කොටසින් අවධාරණය කර ඇත්තේ, සත්‍ය ආලෝකය වන ධර්මයාණන් සිය දේශයට වැඩම කළ බවත්, එසේ පැමිණ, මානව ඉතිහාසයට ඇතුළු වූයේ මිනිස් සබඳතා තුළින් නොව දේව සබඳතාවෙන් බවත් පෙන්වා දී ඇත.

එසේ ම මිනිසත් බව ගෙන අප අතර වැඩ විසූ ඔවුන් වහන්සේගේ තේජශ්‍රීය දේව වරප්‍රසාදයෙන් ද, සත්‍යයෙන් ද පූර්ණ වූ බවත් පෙන්වා දී ඇත.

**දේව රාජ්‍යය පිළිබඳ ඉගැන්වීම (මතෙව් 5:6-7)**

නව ගිවිසුමේ සංකල්පය අනුව දේව රාජ්‍යය රාජධානියක් වැන්න. නපුරේ බලවේගවලින් මුදා ගනු ලැබූ රාජධානියකි. එහි ජනතාව දේව ආධිපත්‍යය පිළිගනිති.

දේව රාජ්‍යය තුළ දේව පරිපාලනය අත්දැකිය හැකි ය. මෙය දැනටමත් ආරම්භ වී අනාගතයේ දී පූර්ණත්වයට පත් වන්නකි. ස්නාවක ජොහාන්තුමාගේ මෙහෙවර මගින් දේව රාජ්‍යයේ උදාව ඇරඹිණි.

ජේසු සමිඳාණන් මෙම දේව රාජ්‍යයේ පණිවිඩය ජුදා ජනතාවට ඉදිරිපත් කළ නමුත් ඔවුහු එය නො පිළිගත්හ. ආගමික නායකයන් සහ ප්‍රභූන් එය ප්‍රතික්ෂේප කළා පමණක් නොව අන් අයට ඇතුළුවීමට ද බාධා කළහ. එහෙත් මනස්ථාපිත පව්කරුවෝ ඊට ඇතුළු වූහ.

දේව රාජ්‍යයේ පාලකයා දෙවියන් වහන්සේ ය. එම දේව පාලනය හදවතින් පිළිගන්නා අයට දේව රාජ්‍යය හිමි වේ. මෙලොවදී ම අත්දැක ආස්වාදය ලැබිය හැකි භාග්‍යයකි.

## භාග්‍ය අට

**1. බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ භාග්‍යවන්තයෝ ය.**

බැගෑ සිතක් ඇති කර ගැනීමට ලෞකිකත්වයේ ආකල්ප වෙනස් කරගෙන දේව සංරක්ෂණය ගැන බලාපොරොත්තු තැබිය යුතු ය. පළමුකොට දෙවියන් වහන්සේගේ රාජ්‍යය ද, ඔවුන් වහන්සේගේ ධර්මිෂ්ඨකම ද සෙවිය යුතු ය. ලෞකික වස්තු සම්පත් පසුපස නො දුවා, දිළිඳුකම අගය කළ යුතු ය. දිළිඳුව උපදින මනුෂ්‍යයා මිය යන්නේ දිළිඳුව ය. මේ දිළිඳුකම තුළින් මතු කර ගත හැකි භාග්‍යය අත්දැකිය යුතු ය. එවැනි අය ස්වර්ග රාජ්‍යයේ උරුමය ලබන්නෝ ය.

**2. ශෝක වන්නෝ භාග්‍යවන්තයෝ ය.**

ලෝක මිම්ම අනුව ශෝක වීම කාලකන්නිකමකි. ප්‍රීතිය, සන්තෝෂය වාසනාවේ සලකුණකි.

එහෙත් ජේසුස් වහන්සේ මානව විමුක්තිය උදා කළේ දුක් වේදනා මගිනි. මහා සිකුරාදා හක්ෂා වැළපුණ අය පාස්කු ඉරිදා ආලේලුයියා කියමින් ප්‍රීති සන්තෝෂ වෙති.

අනුන්ගේ අවශ්‍යතාවයන් ගැන සංවේදී වී ඔවුන් ගැන අවංක ප්‍රේමයෙන් ශෝක වන්නා භාග්‍යවන්තයෙකි.

දුක් වේදනා විඳීම තුළින් දිනෙක දේව මහිමයට කොටස්කරුවකු වීමට ලැබීම භාග්‍යයකි. එවැන්නෝ සැනසීම ලබන්නෝ ය.

**3. නිහතමානී ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය.**

නිහතමානීකම යනු යමකු දෙවියන් ඉදිරියෙහිත්, අන්‍යයන් ඉදිරියෙහිත්, තමා ඉදිරියෙහිත් තම තත්ත්වය අවබෝධ කරගැනීම සහ එය පිළිගැනීම ය.

මරියතුමිය නිහතමානීකමේ ආදර්ශයයි. ජේසු සමිඳුන් ස්නාවක ජොහාන්තුමා වෙතට ගියේ නිහතමානී නිසා ය. තම හැකියාවන් අන් අයගේ යහපත සඳහා යෙදවීමට නිහතමානිකම අවශ්‍ය ය. දිව පාලනය කර ගැනීම ද නිහතමානිකමේ ලකුණකි. අනෙක් පුද්ගලයා උසස් ලෙස පිළිගන්නා ද නිහතමානී ය. මෙවැන්නෝ දේශයේ උරුමකරුවෝ ය.

**4. යුක්තියට සා පිපාසා ඇත්තෝ භාග්‍යවන්තයෝ ය.**

සාගින්න සහ පිපාසය මනුෂ්‍යයා ජීවත්ව සිටින බවට සලකුණු ය. මළවුන්ට ආහාර පාන අවශ්‍ය නැත. යුක්තිය සහ සාධාරණත්වය වෙනුවෙන් ම ජීවත්වන්නා භාග්‍යවන්තයෙකි. ආත්මාර්ථකාමීත්වය තුළ යුක්තිය සහ සාධාරණත්වය නැත.

අපෝස්තුළුවරුන්ට දෙව් මැදුරු තිබුණේ නැත. බයිබලයක් තිබුණේ නැත. සංනිවේදන පහසුව තිබුණේ නැත. යාන වාහන තිබුණේ නැත. එහෙත් එකල පැවති දූෂිත සමාජය උඩු යටිකුරු කර යුක්තියට සහ සාධාරණත්වයට සාක්ෂි දරා රෝම අධිරාජ්‍යයට අභියෝග කිරීමට තරම් ශක්තියක් ලබා ගත්තේ ආහාර පාන වලින් නොවේ. දේව සබඳතාවලිනි. ඒ දේව සබඳතා වලින් ඔවුහු තෘප්තිමත් වූවෝ ය.

**5. දයාවන්තයෝ භාග්‍යවන්තයෝ ය.**

අසල්වාසීන්ගේ අවශ්‍යතාවන් ගැන සංවේදී වීම දයාවේ ද ලකුණකි (ලොවින් අඩක් අද බඩගින්නේ ය. ආහාර පාන, ඇඳුම් පැළඳුම් පමණක් නොව ඔවුන්ට මානව දයාව ද අවශ්‍ය ය.).

අනුන් ගැන කරන අපරීක්ෂක විනිශ්චය දයාවට පටහැනි  ය. තමා ලද සුභාරංචිය අන් අයට ප්‍රකාශ කිරීම ද දයාවේ ලකුණකි. ජේසු සමිඳුන් නායින් නුවර තරුණයා උත්ථාන කිරීම දයාවේ පරමාදර්ශයකි. තමා ළඟට එනතුරු නොසිට දයාව අවශ්‍ය පුද්ගලයා වෙත ගොස් අවශ්‍යතා සපුරා දෙන තැනැත්තා ඇත්ත වශයෙන් ම දයාව ලබන්නේ ය.

**6. නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝ ය.**

නිර්මල සිත යනු පිවිතුරු හදවත ය. මෙහි හදවත යනු හුදු ශාරීරික ඉන්ද්‍රියක් පමණක් නොවේ. එය චිත්ත වේගයන්ගේ ලැගුම් හල ය. ප්‍රේමය, භය, ශෝකය, ධෛර්යය, තරහ, වෛරය ආදී මනෝභාවයන්ගේ නිවහන ය. මනුෂ්‍යයාගේ ආධ්‍යාත්මික, චෛතසික සහ ශීල ධාර්මික පැවැත්මේ මධ්‍යස්ථානය ය. හෘදය සාක්ෂිය සහ ජීවිතය රඳා ඇති තැන ය. බාහිර අලංකාරයෙන් නිර්මල සිතක් ඇති නොවේ.

නිහතමානී හදවත තුළ අහංකාරකම නැත. ප්‍රේමනීය හදවත තුළ වෛරය නැත. ඉවසිලිමත් හදවත තුළ දයාව ඇත. ප්‍රේමනීය හදවත තුළ සේවා සඳහා කැපවීම ඇත.

නිර්මල සිතක් ඇති කර ගැනීමට අප ශාරීරිකව ද ශුද්ධවත්ව සිටිය යුතුයි. අසභ්‍ය පොත පත අවිනීත ඇඳුම් පැළඳුම් නිර්මලත්වයට බාධකයන් ය.

භාග්‍යයේ රහස දෙවියන් වහන්සේ ය. දෙවියන් දැකීමේ රහස නිර්මල සිත ය. නිර්මල සිත යනු පිවිතුරු හදවත ය. පිවිතුරු හදවත් ඇත්තෝ දෙවියන් දකින්නෝ ය.

**7. සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය.**

මනුෂ්‍යයන් අතර අරගල ඇතිවීමේ ඉතිහාසය මනුෂ්‍යයා තරම් ම පැරණි ය. කායින් විසින් ආබෙල් මරා දැමීමෙන් ආරම්භ වූ අරගලය අදත් ව්‍යාප්ත වෙමින් පවතී.

සාමය යනු දෙවියන්වහන්සේගෙන් ලැබෙන සංහිදියාව ය. දේව සබඳතා නිසා මනුෂ්‍යයා තුළ ඇතිවන සන්සුන් භාවය ය. දේව සබඳතා ගොඩනැගීමේ මැදහත්කරුවා ක්‍රිස්තුන් වහන්සේ ය.

යුද්ධයෙන් සාමය උදා කළ නොහැකි ය. සැබෑ සාමය ඇතිවීමට නම් ජනතාව සුසිත් විය යුතු ය.

ජේසුස් වහන්සේ භෞතික වූ කිසිවක් මනුෂ්‍යයන්ට උරුම නොකළ සේක. ,මාගේ සාමය මම ඔබ වෙත තබා යමි, යි ප්‍රකාශ කළ සේක. එම සාමය ලොවට ගෙන යන සාම දූතයකු විය හැකි නම් ඒ තැනැත්තා භාග්‍යවත් ය. මක්නිසාද ඔහු දේව පුත්‍රයෙකි.

**8. යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝ ය.**

පීඩා විඳීමෙන් සතුටක් ඇතිවේ ද. යි ප්‍රශ්නයක් මතුවේ. පාවුළුතුමාගේ අදහස වන්නේ කිතුනුවන් පීඩා විඳිය යුතු බව ය. ඊට හේතුව කිතුනු ඇගයීම් සහ iඞකැ!! ඇගයීම් අතර ඇතිවන ගැටුම ය. කිතුනු ජීවිතය යනු යහපත සහ අයහපත අතර සටනකි. ලෞකිකත්වය, මාංශික තෘෂ්ණා සහ නපුරේ බලවේග කිතුනුවන්ගේ සතුරන් ය.

කිතුනු සටන මිනිස් සතුරන්ට විරුද්ධව නොවේ. අන්ධකාරයේ සකල විධ බලධාරීන්ට එරෙහිව ය.

පේදුරුතුමා මෙසේ අනුශාසනා කරයි. ..සිහිසන් ඇතිව අවදිව ඉන්න. ඔබගේ විරුද්ධකාරයා වන යක්ෂයා ගොරවන සිංහයකු මෙන් කවරකු ගිල

ගනිම්දෝ. යි සොයමින් ඔබ මොබ ඇවිදින්නේ ය. ලොව පුරා සිටින ඔබගේ සහෝදරයන් එම දුක් කරදරවලට ම භාජන වන බව සිහිකර ඔබගේ ඇදහිල්ලේ ස්ථිරව සිට යක්ෂයාට විරුද්ධ වන්න.. (1 පේදුරු 5:8-9).

දුක් පීඩා විඳින විට ස්වාමින් වහන්සේ අප සමග ය. ඔවුන් වහන්සේ සිටින තැන ස්වර්ගයයි. ඒ නිසා යුක්තිය උදෙසා දුක් පීඩා විඳින්නෝ ස්වර්ග රාජ්‍යයේ හිමිකරුවෝ ය.

**කන්ද උඩ දේශනයː**

මතෙව්තුමා ලියා ඇති අන්දමට ක්‍රිස්තුන් වහන්සේ කන්ද උඩ දේශනය මගින් කිතුනු ජීවිතය පිළිබඳ චර්යා රටාවක් ඉදිරිපත් කර ඇත. ඒ ප්‍රධාන තේමාවන් හයක් යටතේ ය. එනම්,

1. මිනිස් ජීවිතයේ වටිනාකම
2. ව්‍යවස්ථාවලිය
3. දන්දීම
4. යාච්ඤාව
5. උපවාසය සහ
6. ජීවිතයේ එකම අරමුණ වශයෙනි.

1. කිතුනුවා මානව සමාජයට රස කාරකයක් විය යුතු ය. ඒ නිසා ඔහු පොළවේ ලුණු ය.
   අඳුරු සමාජයට ආලෝකය ලබාදෙන පහන් සිලුව කිතුනුවා ය. මේ වගකීම් ඔහුගෙන් ඉටුවිය යුතු ය. නැත්නම් ඒ ජීවිතයෙන් පලක් නැත.

2. ජේසු සමිඳුන් සිටි සමකාලීන ජුදා සමාජය දස පණත වචනාර්ථයෙන් ඉටු කළා මිස ජීවිතයට සම්බන්ධ කර ගත්තේ නැත. එසේම ඔවුන් වහන්සේ ව්‍යවස්ථාවලිය ගැන අදහස් ප්‍රකාශ කරමින් ..මම ව්‍යවස්ථාවලිය සහ දිව්‍යසාවලිය අවලංගු කරන පිණිස ආවෙමි.. යි නොසිතන්න. මා ආවේ ඒවා අවලංගු කිරීමට නොව සම්පූර්ණ කිරීමට යයි ප්‍රකාශ කරමින් සංශෝධන රැසක්ම ඉදිරිපත් කළ සේක. මේවා ගැන ඔබ දැන ගත යුතු ය.
   මතෙව් 5:21-47 දක්වා කොටස කියවා, **..එහෙත් මම ඔබට කියමි.....** ආදි වශයෙන් ඉදිරිපත් කර ඇති සංශෝධන ගැන අවබෝධයක් ඇතිව සිටින්න.

3. දන්දීම පිළිබඳව ඔවුන් වහන්සේ ප්‍රකාශ කෙළේ අප පුණ්‍ය ක්‍රියා කළ යුත්තේ බාහිර ලෝකයාට පෙනෙන්නට නොව ස්වර්ගයේ ස්වාමින් වහන්සේට පමණක් දකින්නට රහසිගතව, දකුණත කරන දේ වමතට නො දැනෙන ආකාරයට බව ය.

4. කෛරාටිකයන් මෙන් මිනිසුන්ට පෙනෙන පිණිස නොව දෙවි සමිඳුන්ට දකින්නට රහසිගතව යාච්ඤා කිරීමේ අවශ්‍යතාව පෙන්වා දුන් සේක.

5. ඔබ උපවාස ශීලය ආරක්ෂා කරන බව දැන ගත යුත්තේ අසල්වැසි මිනිසුන් නොව ස්වාමින් වහන්සේ පමණ ය. ඒ නිසා මුහුණ විරූපී කර නොගෙන, ප්‍රීතිමත් විලාසයකින් ඩීඤුළ/) != ඥජීව්වී බව පෙන්වා දුන් සේක.

6. ලෞකික දේ ගැන කනස්සලු නොවී දෙවි පියාණන්ගෙන් ලැබෙන දිව්‍ය සංරක්ෂණය ගැන විශ්වාසය තබන්නටත්, අහසේ කුරුල්ලන්ගෙන් සහ මානෙල් මල් වලින් ආදර්ශයක් ගන්නටත් ඔවුන් වහන්සේ අනුශාසනා කළ සේක. මිනිසාගේ මූලික වගකීම වශයෙන් පළමු කොට දෙවියන් වහන්සේගේ රාජ්‍යය ද, ධර්මිෂ්ඨකම ද සොයා ගත හොත් අනෙක් සැම දේම ලැබෙන බවත් ජනතාවට මතක් කරදුන් සේක.

**උපමාඃ**

යම් කිසි ජනතාවක් තුළ ශත වර්ෂ ගණනාවක් තුළ බලපෑ ආකල්ප සහ චින්තන රටාවන් එකවරම කිසිසේත් වෙනස් කළ නොහැකි ය. එය කළ යුත්තේ හෙමින් සීරුවේ ය. අනවශ්‍ය කලබල ඇති නොවන ලෙසට ය. මෝසෙස්ගේ නීති පද්ධතිය යටතේ වසර දහස් ගණනක් පාරම්පරිකව අදහාගෙන ආ දර්ශනය වෙනස් කිරීම අවශ්‍ය ය. එහෙත් එම කාර්යයන් අනියම් ආකාරයකින් කිරීම සඳහා දේව රාජ්‍යය පිළිබඳව නව සංකල්පයන් ඉදිරිපත් කරන්නේ එකල ඉතා ජනප්‍රිය ඉගෙනුම් මාර්ගයක් වූ **.කථාන්තර ක්‍රමයට.** ය. උපමා වශයෙන් හඳුන්වන එවැනි කථාන්තර නූතන කෙටි කථා වැන්න. ඊට අමතරව දීර්ඝ වශයෙන් ගැඹුරින් සිතා බැලිය යුතු උපමා පාඨයන් ද ඉදිරිපත් කළ සේක. මේවා පාදක වී ඇත්තේ ජනතාව එදිනෙදා ජීවිතයේ අත්දකින සිදුවීම් වලට ය. ඔවුන්ට ආගන්තුක වූ කරුණු ඉදිරිපත් කර නැත.

ගොවීන්ට ධීවරයන්ට, කාර්මිකයන්ට, ව්‍යාපාරිකයන්ට පොදු ජනතාවට දේව රාජ්‍යය පැහැදිලි කර දී ඇත්තේ ඔවුන්ගේ ජීවිත වලට සම්බන්ධ වූ ක්ෂේත්‍රයන් ආශ්‍රයෙනි.

ජේසු සමිඳුන් විවිධ අවස්ථාවල ප්‍රකාශ කළ උපමා තිස් දෙකක් සුබාරංචි ග්‍රන්ථවල සඳහන් ය. එහෙත් ඔබ අධ්‍යයනය කළ යුත්තේ මතෙව් සුබාරංචි ග්‍රන්ථයේ 13 වැනි පරිච්ඡේදයේ සඳහන් උපමා පමණ ය.

එනම් වපුරන්නා, කිරිඳි, අබ ඇටය, සහ මුහුන්, නිධානය මුතු ඇටය සහ දැල පිළිබඳ උපමා පමණි. මේ උපමා තුළින් මතු කර ගත හැකි සුවිශේෂ පණිවිඩ පිළිබඳව ඔබේ අවධානය යොමු විය යුතු ය. එදා ජුදා සමාජයේ පැවති සංස්කෘතිය සහ සාම්ප්‍රදායික පසුබිම දැන සිටීම අවශ්‍ය ය.

**නිදසුන් :**

1. වපුරන්නා පිළිබඳ උපමාවේ වපුරන්නා ගැන අවධානය යොමු විය යුතුය. වපුරන්නා යනු දේව රාජ්‍යය පිළිබඳ පණිවිඩය ප්‍රකාශ කරන්නා ය.

   වපුරන්නා ක්ෂණික ප්‍රතිඵල බලාපොරොත්තු නොවේ. ඔහුට ඉවසීම අවශ්‍ය ය. වපුරන හැම බීජයකින් ම අස්වනු නොලැබුණත් සරු බිමේ වැටුණු බීජ වලින් ලැබෙන ප්‍රතිඵල විශිෂ්ඨ ය. තමාගේ වෑයම නිෂ්ඵල වෙතැ. යි ඔහු කිසි විටෙක කනස්සලු නොවේ. ඔහුගේ උත්සාහයේ ප්‍රතිඵල ලැබෙන්නේ අනාගතයේ ය. එතෙක් තම උත්සාහය අත් නොහල යුතු ය.

2. පලස්තීනයේ තිරිඟු කෙත්වල වැවෙන කිරිඳි අපේ රටේ කුඹුරුවල වැවෙන වල් පැලැටි මෙන් නොවේ. කිරිඳි, තිරිඟු හා සමාන වල් පැලැටියකි. එහි විනාශකාරී තත්ත්වය වන්නේ යම් හෙයකින් කිරිඳි කරල් කීපයක් විශාල තිරිඟු අස්වැන්නකට මුසුවී පිටි කෙටුනොත් මුළු පිටි තොගය ම, සත්ත්ව ආහාරයකටවත් ගත නොහැකි ලෙස ඉතා දැඩි දුර්ගන්ධයකට පත්වීම ය. ඒ නිසයි කිරිඳි තෝරා පුලුස්සා දැමීමට නියම කරන්නේ.
3. නිධානයක් ගැන කථා කරන විට එක වරටම අපට මතක් වන්නේ යකැදුරා, යන්ත්‍ර මන්ත්‍ර, යක් බෙර ය, බිල්ලක් ආදි කරුණු ය. මේ උපමාව ප්‍රකාශ කර ඇත්තේ ශ්‍රී ලාංකිකයන්ට නොවේ. ජුදා ජනතාවට ය. ඔවුන්ගේ ජන වහරේ හැටියට මෝසෙස්ගේ කාලයේ සිට මුළු

ලොවටත් වටිනා මහාර්ඝ වස්තුවක් ඔවුන්ට හිමිවී තිබුණි. ඒ ගිවිසුම් කරඬුව ය. දිවැසිවර ජෙරමියා විදේශ ආක්‍රමණයකට පෙර මේ ගිවිසුමේ කරඬුව දේව මාලිගයෙන් ඉවත් කර පොළවේ කිසියම් තැනක තැන්පත් කර ඇත. එය දන සිටියේ ජෙරමියා පමණ ය. ඔහු ඒ මහා වස්තුව සැඟවූ තැන කිසිවෙකුටත් නොකියා මිය ගියේ ය. එතැන් පටන් එරට ජනතාව, තමන් පය තබා ඇති පොළවේ කිසියම් තැනක ඇති ඒ නිධානය ගැන විශ්වාස කළ හ. ජේසු සමිඳුන් මෙහිදී සඳහන් කර ඇත්තේ කිසියම් නිධානයක් ගැන නොව නිධානය පිළිබඳව ය. එය හිමි කර ගත් තැනැත්තා මුළු ලෝකය අත්පත් කර ගත් කෙනෙකුට වඩා වාසනාවත් ය.

## ප්‍රාතිහාර්යයන්

කිසියම් විශ්මයජනක සිදුවීමක් ප්‍රාතිහාර්යයක් වශයෙන් සැලකීමට නම්,

1. එය ස්වභාව ධර්මයේ නීති ඉක්මවා යන ක්‍රියාවක් විය යුතු ය.
2. එය කාටත් දක ගත හැකි දෙයක් විය යුතු ය.
3. එය තුළින් දේව ප්‍රකාශනයක් ලැබිය යුතු ය.

මේ පදනම මත ඔබ විසින් අධ්‍යයනය කළ යුතු ප්‍රාතිහාර්ය හතරක් ඇත්තේ ය.

1. මරණය පිළිබඳ ප්‍රාතිහාර්යය. (ලාසරස් මරණින් උත්ථාන කිරීම.)
2. යක්ෂයන් දුරු කිරීම පිළිබඳ ප්‍රාතිහාර්යය. (ගෙරසේනියේ යක්ෂාවේශ වූවකු සුව කිරීම. ලූක් 8:26-39)
3. අංශබාග රෝගියකු සුවපත් කිරීම. (මාක් 2:1-12) ලෙඩ රෝග පිළිබඳ ප්‍රාතිහාර්ය.
4. මාරුත දමනය. (ස්වභාවික බලවේග පාලනය පිළිබඳ ප්‍රාතිහාර්ය මාක් 4:35-41)

මේ ප්‍රාතිහාර්යයන් පිළිබඳව අප ඔබට ඉදිරිපත් කරන්නේ මූලික අදහස් පමණ ය. අදාල සුබාරංචි ග්‍රන්ථවලින් ඒවා කියවා විස්තර දනගන්න.

**1. ලාසරස් මරණයෙන් උත්ථාන කිරීම.**

මෙය ජේසු සමිඳුන්ගේ මෙලොව සේවා කාලය අවසන් වන්නට ලංව තිබිය දී කළ ප්‍රාතිහාර්යයකි. ලාසරස් රෝගී වූ අවස්ථාවේ දී ඔහු වෙත

නො ගිය ස්වාමින් වහන්සේ ඔහුට මරෙන්නට ඉඩ හරින්නේ ඒ මරණය තුළින් තමන් වහන්සේගේ දූත මෙහෙවරෙහි උසස් ම පණිවිඩය ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා ගැනීම පිණිස ය. තමන් වහන්සේ මගින් සකල මනුෂ්‍යයන් සදාතන ජීවිතය ලබාගන්නා බව සංකේතාත්මක ක්‍රියාවක් මගින් පසක් කළ සේක.

..පුනරුජ්ජීවනය ද, ජීවනය ද මම වෙමි. මා අදහාගන්නා මැරුණත් ජීවත් වන්නේ ය. ජීවත්ව සිටින මා අදහා ගන්නා කිසිවෙක් කිසි කලෙක නො මැරෙන්නේ ය.. (11:25-26).

වාචිකව කරන ලද මේ ප්‍රකාශය ලාසරස් උත්ථාන කිරීම මගින් තහවුරු විය. ජේසුස් වහන්සේගේ ප්‍රාතිහාර්යය මගින් මනුෂ්‍යයන්ට, ගැලවීමත්, ජීවිතයත්, සොම්නසත් අත්වන බවට මෙය සාක්ෂියකි.

**2. ගෙරසේනයේ යක්ෂාවේශ වූවකු සුව කිරීම:**

යක්ෂාවේශ වූ මිනිසෙක් ගෙරසේනයේ දී ජේසුස් වහන්සේ හමුවට පැමිණ, නියමිත මොහොතට පෙර, තමන්ට වද දෙන පිණිස පැමිණීම ගැන ඔවුන් වහන්සේට මැසිවිලි කීවේ ය.

මනුෂ්‍යයන්ට ජේසුස් වහන්සේ හඳුනා ගැනීමට නොහැකි වුව ද යක්ෂයෝ ඔවුන් වහන්සේ හඳුනා ගත්හ.

ජුදා ඇදහිල්ල අනුව යක්ෂයන්ගේ බලය මුළුමනින් ම නිශ්ප්‍රභා වන්නේ අන්තිම දිනයේ දී ය. එහෙත් ඊට පෙර ඔවුන් අක්‍රිය කිරීම ගැන ඔවුන් මැසිවිලි කී සැටියකි.

යක්ෂාවේශ වූවන් ඌරු රැළකට ආවේශ වීමට ඉල්ලීම තුළින් අපට තේරුම් ගත හැක්කේ මේ ප්‍රදේශය අන්‍ය ජාතීන්ගේ වාස භූමියක් බව ය. ඌරා ජුදා ජනතාවට අකැප සතෙකි. යක්ෂයන්ගෙන් මේ මිනිසා නිදහස් කර ගැනීමට වඩා ඌරු ගොව්වන්ගේ අවධානය යොමුවී ඇත්තේ ඔවුන්ට සිදුවන ආර්ථික අලාභය ගැන ය. ජනයාට සෙත සැලසීමට ඔවුන් යක්ෂයන්ගෙන් මුදා ගැනීමට වඩා ඔවුනට වැදගත් වූයේ ඌරු රංචුව රැක ගැනීම ය. ඒ නිසා තමන්ගේ පලාතෙන් පිටවී යන ලෙස එම ප්‍රදේශ වාසීහු ජේසුස් වහන්සේගෙන් ඉල්ලූහ.

## 3. අංශභාග රෝගියකු සුවපත් කිරීම:

මේ ප්‍රාතිහාර්යය මගින් ජේසුස් වහන්සේ

1. රෝගී පුද්ගලයාට ද
2. ඔහුගේ මිතුරන්ට ද
3. පරිසිවරුන්ට ද මග පෙන්වීම් තුනක් දී ඇත.

අංශභාග රෝගියා අනුන්ගෙන් යැපෙන්නෙකි. ඔහු අන්‍යයන්ගේ බසට අවනත විය යුතු ය. මිතුරන්ගේ ඉල්ලීමට ඔහු කීකරු විය යුතු ය. ඔවුන් සමග ජේසුස් වහන්සේ හමුවී සුවය ලබා ගත යුතු ය. ජේසු සමිඳුන් ඔහු සුවපත් කරන්නේ ඔහුගේ විශ්වාසය නිසා නොව ඔහුගේ මිතුරන්ගේ විශ්වාසය නිසා ය. (අප තුළ ප්‍රබල විශ්වාසයක් ඇත්නම් එමගින් අනුන්ට සෙත සැලසිය හැකි ය.) පව්කාරයා ද අංශභාග රෝගියකු වැනි ය. ඔහු ද අන්‍යයන්ගේ අනුශාසනාවලට අවනතව සුවය ලබා ගැනීමට ජේසු සමිඳුන් වෙතට ආ යුතු ය. මේ තුළින් දක ගත හැක්කේ විශ්වාසයයි. ඒ සැබෑ විශ්වාසයට ජේසු සමිඳාණෝ තිළිණයක් දෙති. ඒ පූර්ණ සුවය දානය කිරීම ය. එපමණක් නොව රෝගියාගේ පාපයන් ද කමා කළ සේක.

පාප කමා කළ හැක්කේ දෙවියන් වහන්සේට පමණි. .පුත්‍රය ඔබේ පව් ඔබට කමා කර තිබේය.යි කී විට එහි ඇති ප්‍රබලතාව සාමාන්‍ය ජනතාවට අවබෝධ නො වූවත් එතැන සිටි විනයධරයන් සිතුවේ එය දේව අපහාසයක් බව ය. ඒ නිසා ඔවුන්ගේ සිත් කැළඹී තිබුණි. ..මේ මනුෂ්‍යයා තමාට දේවත්වයක් ආරෝපනය කරගෙන තිබේ. එය නියත වශයෙන්ම දේව අපහාසයකි... මෙලෙස සිතූ විනය ධරයන්ට ජේසුස් වහන්සේ දෙන්නේ ගැඹුරු පිළිතුරකි.

..ඔබ කුමක් නිසා ඔබ සිත් තුළ මෙසේ තර්ක කරන්නාහු ද? වඩා පහසු කුමක් ද? ඔබේ පව් කමා කරනු ලදැයි කීම ද? නැතහොත් නැඟිට යහන රැගෙන යන්නැයි කීම ද? එහෙත් මෙලොවේ දී පව් කමා කිරීමේ බලය මනුෂ්‍ය පුත්‍රයාණන්ට ඇති බව දැන ගන්නා පිණිස මම මෙසේ කරමි...

නැඟිට ඔබේ යහන රැගෙන යන්නැයි මම ඔබට කියමි.. රෝගියා ඒ සැනින් ම යහන රැගෙන නික්ම ගියේ ය.

පව් කමාව ලද රෝගියා ඒ කමාවේ බාහිර ලකුණක් වශයෙන් සුවය ලැබ යන්නට ඇත්තේ කොපමණ සතුටකින් ද? දෙවියන් වහන්සේ අපට ප්‍රේම කරන සේක. අප ඔවුන් වහන්සේ හමුවිය යුතු ය. එවිට ඒ සුවය සහ සැනසීම ලැබේ. ජේසුස් වහන්සේ මනුෂ්‍ය පුත්‍රයාණන් මෙන්ම දේව පුත්‍රයාණෝ ය. ඒ නිසා දේව අධිකාරි බලය ඔවුන් වහන්සේට ඇත්තේ ය. ඔවුන් වහන්සේ මගින් අපට දෙවියන් වහන්සේගේ කමාවත් මනුෂ්‍ය සමාජයේ දයාවත් එක විටම අත් වන්නේ ය.

**4. මාරුත දමනය**

ජේසු සමිඳාණෝ ඔරුවේ අවරයෙහි සැතපී හුන් සේක. හදිසියේ ම, මුහුදේ බලවත් චණ්ඩ මාරුතයක් ඇතිවිය. ඔරුව පිරී යන තරමට රළ පහර දරුණු ය. ශ්‍රාවකයෝ අතිශයින් ම බිය පත්ව ගුරු දේවයාණන් අවදි කළහ. ..අප විනාශ වන්නට ළඟ ය. අප විනාශ වන්නට ළඟය ය. අප ගලවා ගත මැනවැ.. යි ආයාචනය කළහ. ස්වාමින් වහන්සේ අවදිව, ඔවුන් ඒ අපදාවෙන් ගලවා ගෙන, ශ්‍රාවකයන් ඇමතූ සේක.

..ඔබ ඔය තරම් භය වන්නේ මන්ද? තවම ඔබට ඇදහිල්ල නැද්ද.. යි ප්‍රශ්න කළ සේක.

විවිධ බලවේගවල අභියෝගයනට මුහුණ පෑමට සිදුව ඇති අපට මේ සිද්ධියෙන් අගනා ආදර්ශයක් ලැබෙයි. අපේ ඇදහිල්ල ස්ථිර එකක් විය යුතු ය.

මනුෂ්‍යයා විද්‍යාවෙන් සහ තාක්ෂණයෙන් අද සොබා දහමේ ඇතැම් බලවේග පාලනය කරන නමුත්, භූ චලන ගිනිකඳු විදාරණය, චණ්ඩ මාරුත, සුනාමි වැනි ස්වභාවික බලවේගවලට ඔහු තවමත් යටත්ව වහල්ව සිටියි. සොබාදහමේ බලවේග පාලනය කළ හැක්කේ මැවිල්ලේ ස්වාමියාණන් වූ මැවුම් කරුවාණන්ට පමණි.

**1.3 ශුද්ධාත්මයාණෝ:**

පියාණන් ද, පුත්‍රයාණන් ද මෙන් ශුද්ධාත්මයාණන් ද සැබෑ දෙවියෝ ය. ස්වකීය ප්‍රේමාග්නියෙන් අප දල්වනු සඳහා ශුද්ධාත්මයාණෝ අප වෙත පැමිණෙති.

පෙන්තකොස්ත මංගල දින ශුද්ධාමයාණන් වහන්සේ අපෝස්තුළුවරුන් වෙත වැඩම කළ සේක. ඔවුන් වහන්සේ විසින් අපෝස්තුළුවරු බුද්ධි

ප්‍රබෝධයට ද, එඩිතරකමට ද, දක්ෂ කථිකත්වයට ද, ශුද්ධවන්තභාවයට ද පමුණුවන ලදහ.
අප ජීවිතවලට ශුද්ධාමානුභාවය ලැබී දේව සබඳතා අප තුළ ඇත්නම් මරණීය වූ ශරීරය තුල අමරණීය වූ ආධ්‍යාත්මයක් ලබන්නෙමු. ඒ ආත්මයාණන් දිනෙක අපගේ මරණීය වූ ශරීරය ජීවමාන කරන්නේ ජේසුස් වහන්සේ මරණනින් උත්ථාන කළ ආකාරයට ය.

ජොහාන් සුබාරංචිය අනුව ශුද්ධාත්මයාණන් හඳුන්වා දී ඇත්තේ ජීවන දායක ජල ධාරාවක් ලෙසිනි. එනම් දේව සබඳතා ඇති කරන නව ජීවනයේ බලවේගයක් ලෙසිනි (7:37-39).

ස්වකීය මරණයට පෙර ජේසුස් වහන්සේ ස්වකීය විශ්වාසිකයන් වෙත සහාය දායකයාණන් ද, සත්‍යතාවයේ ආත්මයාණන් ද වන ශුද්ධාමයාණන් එවීමට පොරොන්දු වූ සේක. ඒ වරම ලබා ගැනීමට විශ්වාසිකයන් ප්‍රේමයේ පණත ඉටු කළ යුතු ය. ශුද්ධාමයාණන් පැමිණි පසු, සියල්ල දැනගත හැකි ය. සියල්ල සිහි කැඳවා ගත හැකි ය (14:15-31).

අප ශුද්ධාමයාණන්ට සම්බන්ධ වන්නේ ක්‍රිස්තුන් වහන්සේ මගිනි. මේ සබඳතාවය නැතිව කිතුනු ජීවිතය එල දරන්නේ නැත. ඒ මිදි වැලට සම්බන්ධ වී මිදි අතු පල දරණ ලෙස ය. ශුද්ධාත්මයාණන් මගින් විශ්වාසිකයෝ ක්‍රිස්තුන් වහන්සේගේ මිතුරන් වෙති. මේ මිත්‍රත්වය දිවි පිදීමට තරම් ප්‍රබල ප්‍රේමයේ සාක්ෂියකි (15:5-17).

පාවුළුතුමා, ශුද්ධාත්මයාණන්ගෙන් ලැබෙන විවිධ දීමනා ගැන 1 කොරින්ති 12:4-11 දක්වා සටහන් කර ඇත. එහි ඇති මූලික අදහස් පහත දැක්වේ.
විවිධාකාර දීමනා ඇතත් එම දීමනා ලැබෙන්නේ එකම ශුද්ධාත්මයාණන්ගෙනි. එසේම විවිධාකාර සේවාවන් ද ඇත. එහෙත් සිටින්නේ එකම ස්වාමින් වහන්සේ ය. විවිධාකාර දේව බල ක්‍රියා කරතත් සිටින්නේ එකම දෙවියන් වහන්සේ ය. මේ සැම දෙයක් ම මනුෂ්‍යයාට ලැබී ඇත්තේ අන්‍යොන්‍ය යහපත සඳහා ක්‍රියා කිරීමට ය. තමාගේ පුද්ගලභාවය ඉස්මතු කිරීමට නොවේ. මෙවැනි ශුද්ධාත්ම දීමනා රැසක් ඇත. ඒවා මෙසේ පෙළ ගැස්විය හැකිය. එනම්.

- උපදෙස් දීම සඳහා ප්‍රඥාව

- ධර්මය පහදා දීම සඳහා ඥානය

- ඇදහිල්ලේ ස්ථිරත්වය සඳහා විශ්වාසය

- සුවකිරීමේ වරම

- හාස්කම් කිරීමේ බලය

- දිවැසි වැකි කීමේ හැකියාව

- ආත්ම විසවියියීමේ ශක්තිය

- විවිධ ශබ්ධ වලින් කථා කිරීමේ පුළුවන්කම

- ශබ්ද පහදා දීමේ දක්ෂතාවය වැනි දීමනාවන් ය.

ශුද්ධ ත්‍රිත්වයේ තුන් තැනැන් වහන්සේ ගැන අධ්‍යයනය කළ පසුව අවධානය යොමු විය යුත්තේ කිතුනු සභාව ගැන ය.

**1.4 කිතුනු සභාවඃ**

උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ අප සමග වැඩ සිටීම ප්‍රකාශ කරන පිණිසත්, ඔවුන් වහන්සේගේ දූත කාර්යය ලොව පුරා පතුරුවන පිණිසත් රැස් කරන ලස ජනතාව කිතුනු සභාව වශයෙන් හැඳින්විය හැකියි. ක්‍රිස්තුන් වහන්සේ මේ සභාව අදියර තුනකින් ස්ථාපිත කළ බව කිව හැකි ය.

1. තම ජීවිත කාලය තුළ දී ශ්‍රාවකයන් දොළොස් දෙනෙකු තෝරාගෙන සභාව ගොඩ නැගීම.

2. ස්වකීය ජීවිත පූජාව තුළින් සභාවට ජීවය ලබා දීම.

3. ශුද්ධාත්මාගමනය තුළින් සභාව ලෝකය තුළ ක්‍රියාත්මක වීමට සැලැස්වීම.
   වශයෙන් ඒ අදියර තුන හැඳින්වෙයි.

මේ සභාව සමස්ත ලෝකයේ ගැලවීමේ සහ දෙවියන් වහන්සේ සමග මුළු මිනිස් සංහතිය දක්වන සබඳතාවයේ සලකුණ ද වේ.

**සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ලෙසඃ**

ජේසුස් වහන්සේ තම දූත කාර්යයේ ආරම්භයේ සිට, ශ්‍රාවකයන් සමග ජීවත් වූ සේක. ඔවුන් වහන්සේ ශ්‍රාවකයන් සමග තිබුණු සමීප සබඳතාවය පෙන්වීමට මිදි වැල සහ එහි අතු යන උපමාව ඉදිරිපත් කළ සේක. ශ්‍රාවකයන් ජීවනය ලැබුවේ ජේසු සමිඳුන්ගෙන් ය, ඔවුන් වහන්සේ සහ ශ්‍රාවකයන් අතර තිබුණු දැඩි සම්බන්ධතාවය පෙන්වීමට පාවුළුතුමා සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයට සමාන කරයි. (1 කොරින්ති 12:12-31) මේ කාරණය වැඩි දුරටත් පැහැදිලි කරන පාවුළුතුමා රෝම හසුනේ 12:4-21 හි මෙසේ සටහන් කර ඇත.

..එකම මිනිස් සිරුරෙහි අපට බොහෝ අවයව ඇතත්, ඒ අවයවයෝ එකම කාර්යය නොකරති. එසේම බොහෝ දෙනෙකු වූ අපිත් ක්‍රිස්තුන් වහන්සේ හා සම්බන්ධ වී එක ශරීරයක්ව එහි වෙන් වෙන් වශයෙන් අන්‍යොන්‍ය අවයවයෝ වම්හ...

ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය වශයෙන් හඳුන්වන සභාවේ හිස ස්වර්ගයේ වැඩ වසන අපගේ ස්වාමින් වූ ක්‍රිස්තුන් වහන්සේ ය. ඔවුන් වහන්සේ සකල ශරීරය එකට ගලපා නිසි මඟ හසුරුවා එය සජීවී කරන සේක. මේ ශරීරයේ ජීවය ශුද්ධාත්මයාණෝ ය. ඔවුන් වහන්සේ හිස වූ ක්‍රිස්තුන් වහන්සේ වෙතින් නික්ම සියලු අවයවයනට ජීවය දී, මේ අවයව එකිනෙක සමග ද ඒ සියල්ල ම හිස සමග ද ඒකාබද්ධ කරන සේක. මෙලෙසින් ශුද්ධාත්මයාණෝ කිතුනු සභාවේ ආත්මය වෙති.

මේ ශරීරයේ අවයව විශ්වාසිකයෝ ය. තම හිස මෙන් ක්‍රිස්තුන් වහන්සේට ද, සහායක අවයව මෙන් අන් සියලු ක්‍රිස්තු භක්තිකයනට ද ප්‍රේම කිරීම සියල්ලන්ගේ යුතුකම හා වගකීම වන්නේ ය. ඒ නිසා සෑම විශ්වාසිකයෙක් ම සභාව තුළ තමාට නියමිත විශේෂ මෙහෙවර දැනගෙන, එය හෘදයාංගමව ඉටු කිරීම අවශ්‍ය ය.

ප්‍රසාද ස්නාපනයේ දී අපි ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය නම් කිතුනු සභාවට ඒකාබද්ධ කරනු ලැබීමු.

**පොදු ලක්ෂණ:**

සැබෑ කිතුනු සභාවේ පොදු ලක්ෂණ හතරක් ඇත්තේ ය.

**1. ඒකත්වය**

සභාවේ හිස වන ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි එකම ඇදහිල්ල ද, ආත්මයාණන් මගින් එකම ඉගැන්වීම ද, එකම සත්‍යතාවන් විශ්වාස කිරීම ද, නිසා සභාව තුළ ඒකත්වය ඇත. සභාවේ සියලු සාමාජිකයන් ක්‍රිස්තුන් වහන්සේ සමග සහෝදරත්වයෙන් බැඳී සිටිති. උත්තම පූජක යාච්ඤාවේ දී ක්‍රිස්තුන් වහන්සේ

..පියාණනි, මා මෙසේ යාච්ඤා කරන්නේ ඔබ මා තුළ ද, මා ඔබ තුළ ද සිටින්නාක් මෙන් ඔවුන් ද අප තුළ ඒකත්වයත් වනු පිණිසත්, ඔබ මා එවා වදාළ බව ලෝකයා විශ්වාස කරනු පිණිසත් ය... යනුවෙන් පියාණන් ඇමතූ සේක.

මේ ඒකත්වය ගොඩ නඟනු සඳහා අපට කළ හැකි දේ ගැන අවධානය යොමු කිරීම වැදගත් ය. ඒ සඳහා අපගේ හදවත් සිත් හැරීමකට සහ නවතාවයකට විවෘත කළ යුතුය. එකෙකාට සවන් දිය යුතු ය. සැම දෙනාම එකතු වී හිංසා පීඩා වලින් තැලී පොඩිවී සිටින අසාධාරණකම් වලින් පිරුණු ලෝකය සඳහා යාච්ඤා කළ යුතු ය. මේ විෂමතා මැඩලීමට ක්‍රියා කළ යුතු ය.

**2. ශුද්ධත්වය**

කිතුනු සභාව ශුද්ධවත් ය. එසේ වන්නේ සභා සාමාජිකත්වය ශුද්ධවත් නිසා නොව, ඔවුන් හැකි ශක්තියෙන් පාපය ප්‍රතික්ෂේප කරමින් දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත්වීමට පොරොන්දු වෙමින්, ශුද්ධාත්ම වරමින් තමන් තුළ ක්‍රිස්තු ප්‍රතිරූපය නිර්මාණය කරගන්නට වෙහෙස වන නිසා ය. ක්‍රිස්තුන් වහන්සේ කැඳවන්නේ පව්කාරයන් වුව ද ඔව්හු ප්‍රසාද ස්නාපනය මගින් ඔවුන් වහන්සේට සම්බන්ධ වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශුද්ධවන්ත මාර්ගයේ ගමන් කිරීමට බැඳී සිටිති.

**3. සාධාරණත්වය (කතෝලිකත්වය)**

සභාව තුළ ජාති, කුල, වර්ග භේද කිසිවක් නැත. ජන වන්දනාව තුළින් කිතුනු සහෝදරත්වය ඉස්මතු වෙයි. ක්‍රිස්තුන් වහන්සේ දානය කරන ගැලවීමේ මාර්ගය සැම දෙනාටම පොදු ය. මුළු විශ්වයේ වසන සැම දෙනෙකුට ම මේ ගැලවීමේ මාර්ගයට අවතීර්ණ වන ලෙස ආරාධනය කර

ඇත. සුබ අස්න නොපිළිගත් සැම දෙනා සමග වුව ද සහයෝගිතාවක් ඇති කර ගැනීමට සභාව වෙර දරයි. තමන් නොදන්නා දෙවි කෙනෙකු අදහන සැමට සුබ පතයි. ලෝකයේ සැම සුසිත් ජනතාවයකට ම සභාව ආචාර කරයි.

මේ අනුව බලන විට කිතුනු සභාව විශ්ව සාධාරණත්වයේ ප්‍රබල සලකුණ බව පැහැදිලි වේ.

**4. අපෝස්තලිකත්වය:**

පේදුරුතුමාගෙන් පටන්ගෙන එතුමාගේ අනුප්‍රාප්තිකයන් අඛණ්ඩව සභාවේ නායකත්වය දරණ නිසාත්, අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම් සභාව තුළ නොකඩව පවත්වාගෙන යන නිසාත්, අපෝස්තලිකත්වය ඇත්තේ ය. ලෝකයේ සැම රටක ම සිටින රදගුරුවරු රෝමයේ රදගුරුතුමා හෙවත් පොදු පියා (පාප් වහන්සේ) සමග එක්සත් වී ක්‍රිස්තුන් වහන්සේ තමන්ට නිල කරනු ලැබූ කාර්යය නොකඩවා කරගෙන යති. 16 වැනි බෙනඩික්ට් පොදු පියා, නොකඩවා පැවත එන අපෝස්තලිකාවලියේ 267 ළඟීවී නූතන නියමුවාණන් ය.

**සභාවේ පාලන සැලැස්ම:**

ජනතා සේවය තුළින් සභාවේ වර්ධනයත්, පෝෂණයත් ඇති කිරීමට ක්‍රිස්තුන් වහන්සේට හැකි ය. සභාව තුළ නිල බලය ලත් සේවකයන් සහ ගිහි සේවකයන් වශයෙන් කොටස් දෙකක් ඇත. මේ අය තෝරා ගනු ලබන්නේ ප්‍රසාද ස්නාපනය ලැබූ සියලු දෙනා අතරින් ය.

**නිල බල ලත් සේවය:**

නිල බලය ලබන්නේ ක්‍රිස්තුන් වහන්සේගෙනි. ඔවුහු කිතුනු සංඝයට සේවය කිරීමට බැඳී සිටිති. මේ සියලු දෙනා තම පදවියේ රාජගුරු ප්‍රසාදිතුමා සමගත්, රාජගුරු ප්‍රසාදිතුමා පොදු පියා වූ පාප් වහන්සේ සමගත් එක්සත් වී සේවයේ යෙදෙති.

සභාවේ නිල බලය දෙයාකාරයකට සිදුවේ. පළමුව සභා නායකයා ලෙස පාප් වහන්සේට ලෝකයේ සිටින සියලුම රාජගුරු ප්‍රසාදිවරුන් සමග සාමූහිකව තීරණ ගැනීමටද, පේදුරුතුමාගේ ස්ථානය දරමින් තම බලය භාවිත කර තීරණ ගැනීමට ද, තමාට ලැබෙන නිල බලය අනුව, ක්‍රිස්තුන් වහන්සේ සැටියට මුළු කිතුනු සභාවේ එඬේරාණන් වශයෙන් තීරණ ගැනීමට ද, සාධාරණ වූ සහ උතුම් වූ විශ්ව බලය නිදහසේ භාවිත කිරීමට ද පුළුවන.

රාජගුරුප්‍රසාදිවරුන්ට ඩිඕ ධූරයට ගැලපෙන කැපවීම මගින් දිවැසි, එඬේර සහ පූජක තත්ත්වයන්ට හිමි බලතල ලැබේ. රාජගුරු ප්‍රසාදිවරු පූජකවරය මගින් දෙවියන් වහන්සේගෙන් ම මේ බලය ලබා ගනිති. ඔව්හු තම ප්‍රදේශය තුළ ක්‍රිස්තුන් වහන්සේගේ ස්ථානය දරති.

පූජකවරයේ දී දිව්‍ය පූජාව සිදුකිරීමේත් ප්‍රසාද ස්නාපනය සමගි සන්ධානය, රෝගීන් ආලේප කිරීම යන ප්‍රසාද නිධාන දානය කිරීමේත් කැප කිරීමේ සහ ආශිර්වාද කිරීමේත් බලතල ක්‍රිස්තුන් වහන්සේ විසින් පවරනු ලැබේ.

තේවාචාර්යවරයකු බවට උසස් කිරීමේ දී චාරිත්‍ර න්‍යාම අනුකූලව ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ ද, දිව්‍ය පූජාවෙහි පූජා ප්‍රසාදිතුමාට සහාය වීමේ සහ විශ්වාසිකයන්ට දිව්‍ය සත්ප්‍රසාදය බෙදා දීමේ ද බලය ක්‍රිස්තුන් වහන්සේ දෙවා වදාරණ සේක.

**තාපස පන්තිවලට ඇතු=ත් වන්නෝ,**

1. කිසි වස්තුවක අයිතිය තමන්ට තබා නොගැනීමටත්

2. බඹසර දිවියක් ගත කිරීමටත්

3. ස්වකීය ප්‍රධානීන්ට කීකරු වීමටත්, වේද භාර වලින් පොරොන්දු වී ජනතා මෙහෙවරෙහි යෙදෙමින් ලෝකය තුළ දේව රාජ්‍ය වටිනාකම් ගොඩ නැගීමට සහාය වෙති.

**ගිහි සේවකයෝ:**

ප්‍රසාද ස්නාපනය සහ අභිවෘද්ධි ආලේපය මගින් පොදු පූජකවරයේ සාමාජිකයකු බවට පත්වන ගිහියන්, දිවැසි එiVර සහ පූජක යන ත්‍රිවිධ සේවාවන් සඳහා කැඳවීම ලබති. සභාවේ මුල් කාල සීමාවේ දී ගිහියන්ගේ ප්‍රබල සාක්ෂි දැරීමක් තිබිණි. බර්නබස් එකල සිටි ගිහි නායකයෙකි. පාවුළුතුමාගේ මෙහෙවර සභාවට ලබාදුන්නේ ඔහු ය.

සභාවේ බහුතරය ගිහියෝ ය. සභාව පවතින්නේ ගිහියන් නිසා ය. සභාව නඩත්තු කරන්නේ ගිහියන් ය. ගෘහස්ථ සභාව නමැති කිතුනු පවුල මගින් සභාව ගොඩනැගීමේ මූලික පියවර අරඹන්නේත් ලෞකික ක්ෂේත්‍රය තුළ දේව රාජ්‍ය වටිනාකම් ගොඩ නගන්නේත් ගිහියන් ය. ලෞකිකත්වය

තුළින් ලොව්තුරාවට පියමං කිරීමේ මහා වගකීම ගිහියන්ට පැවරී ඇත්තේ ය.

**රූපාන්තර පරිවර්තනයඃ**

..ආරම්භයේදී දෙවියන් වහන්සේ අහසත්, පොළවත් මැවූ සේක...

මේ ශුද්ධ බයිබලයේ මුල් පොතේ එනම් උත්පත්ති කථාවේ මුල්ම වාක්‍යයයි.

..මම අලුත් අහසක් ද, අලුත් පොළොවක්ද දිටිමි. පළමු අහසත් පළමු පොළොවත් පහව ගියේ ය...

ආරම්භයේ දී මවන ලද අහසත්, පොළොවත් පාපය නිසා දූෂිතව පිරිහී ගියේ ය. (එළිදරව්ව 21:1)

ක්‍රිස්තුන් වහන්සේ මිනිස් බව ගෙන මෙලොවට පැමිණ දූෂිත ලෝකය, අලුත් අහසක්ද, අලුත් පොළොවක්ද බවට පත් කිරීමේ කාර්යය ඇරඹූ සේක. එම කාර්යය ඉදිරියට ගෙන ගොස් පූර්ණත්වයට පත්කිරීමේ වගකීම මනුෂ්‍යන්ට පැවරී ඇත. ශුද්ධාත්මයාණෝ ප්‍රේමයේ ගින්නෙන්, ලෝකය රූපාන්තර පරිවර්තනයකට පත්කර මේ නවතාවය ගොඩ නගති.

රූපාන්තර පරිවර්තනය යනු කුමක් දැ. යි පැහැදිලි කරදීමට මේ නිදසුන ඉදිරිපත් කළ හැකි ය.

කුම්භකාරයෙක් (හැලි වළං සාදන්නෙක්) අමු මැටි ගෙන එය පීරා සකස් කර එයින් කළගෙඩියක් නිර්මාණය කරයි. ඉන්පසු හේ එය අව්වේ තබා, අමු මැටි සම්පූර්ණයෙන්ම වියලෙන තුරු දින කීපයක් වේලා ගනියි. මෙසේ වේලුණු කළගෙඩිය ප්‍රයෝජනයට ගත නොහැකි ය. හේතුව එයට වතුර දැමූවිට මැටි නවැත දියවී යන නිසා ය.

කුම්භකාරයා තම නිර්මාණය එක්තරා ආකාරයක රූපාන්තර පරිවර්තනයකට පත්කරයි. ඒ සඳහා ඒ අමු මැටි කළගෙඩිය ගිනි පෝරණුවකට දමා පැය කීපයක් තබයි. එය හොඳින් පිළිස්සුණු පසුව පෝරණුවෙන් ඉවතට ගත් කළගෙඩිය සිසිල් වන තුරු තබා ඊට වතුර පුරවයි. එහෙත් දැන් එහි මැටි දියවෙන්නේ නෑ. කළගෙඩියෙහි හැඩයෙහි

පරිමාවෙහි කිසිදු වෙනසක් සිදුවී නැති නමුත් ඊට නව බලයක් කා වැදි ඇත. ඒ රූපාන්තර පරිවර්තනයේ ප්‍රතිඵලයයි.

ක්‍රිස්තුන් වහන්සේ මරණීය වූ ශරීරය අමරණීය තත්ත්වයට පත්කර උත්ථානය මගින් රූපාන්තර පරිවර්තනයකට පත් වූ සේක. උත්ථාන වූ ස්වාමින් වහන්සේ මනුෂ්‍ය සීමාවන් ඉක්මවා යන බලයකින් සන්නද්ධව සිටින සේක.

ඔවුන් වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයකු මෙන් ආහාර ගත් සේක. තමන් වහන්සේගේ තුවාල වලට අත තබා බලන්නට තෝමස්තුමාට ආරාධනා කළ සේක. එසේම මනුෂ්‍ය සීමාවන් ඉක්මවා යන බලයක් ලැබූ නිසා එකම වේලාවේ ස්ථාන දෙකක පෙනී සිටිය හැකි විය. එම්මාවුස් බලා ගිය ගෝලයන්ට ප්‍රකාශ වූ මොහොතේ ම ජෙරුසලමේ ශ්‍රාවකයන්ට ද දර්ශනය වූ සේක. ශාලාවෙහි දොර ජනෙල් සියල්ල වසා තිබුණත් ස්වාමින් වහන්සේ එහි ඇතුළු වූ සේක.

**මනුෂ්‍යයාගේ අවසාන සිද්ධිඃ**

භෞතික ශරීරයක් ඇති මනුෂ්‍යයා මෙලොව සියලුම භෞතික සබඳතා වලින් වෙන්වීම මරණය වශයෙන් අර්ථකථනය කළ හැකි ය. මරණය යනු නිමාවක් නොව නව පැවැත්මක ආරම්භය බව ක්‍රිස්තුන් වහන්සේ ස්වකීය උත්ථානය මගින් අපට සහතිකයන් දී ඇත.

ධාන්‍ය ඇටයක් පොළොවේ වැටී මැරී එයින් අලුත් පැලයක් මතු වන්නා සේ මනුෂ්‍යයා මරණය තුළින් අමරණීයත්වයේ පැවැත්මට ඇතුළු විය යුතු ය. මනුෂ්‍යයාගේ පූර්ණත්වය ඇතිවන්නේ ඒ නවතාවය හෙවත් රූපාන්තර පරිවර්තනය සිදුවන උත්ථානය මගිනි.

ඒ උත්ථානයට සුදුසු වන ආකාරයට මෙලොව ජීවිතය ගත කිරීම අවශ්‍ය ය.

අප මෙතෙක් සාකච්ඡා කළේ පළමුවැනි ප්‍රශ්න පත්‍රයට අදාල විෂය කරුණු ගැන ය.

# II ඒකකය - කතෝලික ජීවිත පැවැත්ම

**විෂය කරුණු**

ආදී පියවරුන්ට කථාකළ දෙවියන් වහන්සේ දිවැසිවරුන් මගින් ද ජනතාව අමතා, කාලය සම්පූර්ණ වූ විට, ශුද්ධාත්මාභිෂේකයෙන් ආලේප කරන ලද දේව පුත්‍රයාණන් වූ ධර්මයාණන් දිළිඳුන්ට සුභාරංචිය දේශනා කිරිමට ද බිඳුනු සිත් ඇත්තන් සුවපත් කිරීමට ද ශරීරයේ සහ ආත්මයේ වෛද්‍යවරයාණන් වීමට ද පියාණන් සහ මානව සංහතිය අතරේ මැදහත්කරුවාණන් වීමට ද එවූ සේක. අප හා සමාන මනුෂ්‍යයෙකු වු දේව පුත්‍රයා මනුෂ්‍ය වර්ගයාගේ ගැලවීම විය. ඒ නාසරතයේ ජේසු සමිඳාණෝ ය. ඔවුන් වහන්සේ පාස්කු අභිරහස තුලින් අප ගැලවීම උදාකල සේක. එනම් පාස්කු අභිරහස වූ ඔවුන් වහන්සේගේ දුක්ප්‍රාප්තියෙන් ද, මරණයෙන් සහ අභිමාන්විත උත්ථානයෙන් ද, තේජවත් ස්වර්ගාරෝහණයෙන් ද මේ කාර්යය ඉටුකළ සේක.

,දෙවියන් වහන්සේ අන්ධකාරයේ බලයෙන් අප ගලවා තමන් ප්‍රේමයේ පුත්‍රයාණන්ගේ රාජ්‍යයට පැමිනෙව් සේක. ඔවුන් වහන්සේ තුල අපගේ පව්කමාව නම් වූ මිදීම අපට ඇත, (කොලොස්ති 1: 13 - 14).

මරණය තෙක් කීකරු වීමෙන් ස්වාමීන්වහන්සේ මානව සංහතියේ අකීකරුකමට වන්දි ගෙවු සේක. පාප දෝෂයෙන්ද සදාතනික නිරා දුගතියෙන් ද අප මුදා ගත්සේක. කුරුසය මත මරණය මගින් ජේසුස් වහන්සේ යක්ෂයා ජයගත් සේක. යක්ෂයාගේ වහල් බැම්මෙන් අප මුදා ගත් සේක. අපට අනන්ත ජීවිතය නැවත ලයා දුන් සේක. අපගේ ගැලවීමට අවශ්‍ය සකල වරප්‍රසාද සියල්ල අපට ප්‍රදුධී/නය කළ සේක. දේව දඤුවන්මෙන් ජීවත්වීමට අප හේතුකාරයන් කළ සේක.

ජේසු සමිදාණන්ගේ දුක් ප්‍රාප්තිශුව්රි මරණයත් අනන්තාඤුරිමිත අගයක් සහිත යාග පූජාවක් විය. ඔවුන් වහන්සේ ස්වකීය යාගය සියලු කල්හි මනුෂ්‍යන් සඳහා ඔප්පු කළසේක.එසේ කෙළේ ඔවුන් වහන්සේ එකම උත්තම පූජකයාණන් නිසාය.මේ මහා යාගයට අපිදු සහභාගිවෙමු. ඒ දිව්‍ය පූජාව තුළිනි.

ජේසුස් වහන්සේ ස්වකීය බලයෙන් ම මරණයෙන් උත්ථානය වූ සේක. මේ උත්ථානය නිසා මරණයේ බලය ▲දී ගියේ ය. ඒ නිසා ඔවුන් වහන්සේ දැන් දුක් විදින්නේවත් මැරෙන්නේවත් නැත. එපමණක් නොව ඒ මහා වරප්‍රසාදය අපට ද උරුමකර දුන් සේක.

ප්‍රසාද ස්ථාපනයේ දී අපගේ ස්වාමින් වූ ක්‍රිස්තුන් වහන්සේ අප පාපයේ මරණයෙන් නැගිටුවා ස්වකීය දේව ජීවනයෙහි පංගුකාරයන් කරන සේක. මේ දේව ජීවිතය අප තුළ දැන් සැඟවී පවතින නමුත් යුගාන්තයේ සමිඳාණන් නැවත මෙලොව වඩින දවසහි දී ප්‍රකාශයට පත්වනු ඇත.

උත්ථානයෙන් පසු ජේසුස් ස්වාමින්වහන්සේ ප්‍රකාශ වූ අවස්ථා ගණනාවක් සුභාරංචි ග්‍රන්ථවල සඳහන්ව ඇත. ඔබගේ පහසුව සඳහා ඒවා මෙසේ පෙළගස්වමු.

- මග්දලාහි මරියාට (මාර්ක් 16:9, රෙහාන් 20:16)
- භක්තිමත් කාන්තාවන්ට (මතෙවු 28:9)
- පේදුරුතුමාට (ලූක් 24:34, 1 කොරින්ති 15:5)
- එම්මාවුස්හි දී ශ්‍රාවකයන් දෙදෙනාට (ලූක් 24:13 - 32)
- තෝමස් තුමා වීති අතර ජෙරුසලමේ දී (ලූක් 24:36-43, ජොහාන් 20:19)
- අට දවසකට පසු තෝමස් තුමා සිටියදී (ජොහාන් 20:26-29)
- තිබේරියස් විලේ මසුන් ඇල්ලූ ගෝලයන්ට (ජොහාන්21:1-23)
- පන්සියකට අධික පිරිසට (1 කොරින්නා 15:6)
- ජාකොබ් තුමාට (1කොරින් 15:7)
- ස්වර්ගාරෝහනයට පෙර සියලු අපෝස්තුළුවරුන්ට (මාර්ක් 16:19 ක්‍රියා 1:9)

සියල්ලනට පසු පාවුළුතුමාට (ක්‍රියා 9:-6, 15 කොරිනරිරිච්චී 15:8) උත්ථාන වු ස්වාමීන් වහන්සේ සියලු මනුෂ්‍ය සීමාවන් ඉක්මවා ගිය මහා බලයකින් යුක්ත වූ විශ්ව ගැලවුම්කාරයාණෝ ය. ක්‍රිස්තුවරයාණෝ ය.

ස්වකීය උත්ථානයෙන් පසු ජේසුස් වහන්සේ සතලිස් දිනකරි මෙලොවෙහි වැඩ සිටි සේක. මේ කාලසීමාව තුළදී ඔවුන් වහන්සේ දේව

රාජ්‍ය ගැන අපෝස්තුළුවරුන්ට වඩාත් දැනුවත් කළ සේක. සතලිස් වැනිදා ඔවුන් වහන්සේ අපෝස්තුළුවරුන් ඔලිව් කන්දට ගෙන ගොස්, ස්වකීය දෑත් ඔසවා ඔවුන්ට ආශිර්වාද කළ සේක.එසේ ආසිරි ගන්වමින් සිටිය දී ම ඔවුන් කෙරෙන් වෙන් කරනු ලදුව ස්වර්ගයට ඔසවා ගනු ලැබ වළාකුළකින් මුවහ කරනු ලැබූ සේක.

වළාකුළ දේවත්වයේ සලකුණක් ලෙස ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් වේ. ඒ අනුව ජේසු සමිඳුන්ගේ මානුෂික ස්වාභාවය අපගේ ඇසට මුවහ වී ඔවුන් වහන්සේගේ දේවත්වයට ඇතුළු වූ බව තේරුම් ගත හැකි ය. අප අතර සිටි ස්වාමින් වහන්සේ මානුෂීවික ස්වාභාවයෙන් අද අපට නො පෙනේ.

## දිව්‍ය පූජාව සහ පූජා පිළිවෙත

ශුද්ධ සභාවට පැවරී ඇති පාරිශුද්ධ කාර්යය නම් ජනවන්දනා මෙහෙය පැවැත්වීමය. ජනවන්දනාවේදී ශුද්ධ සභාව මානව වර්ගයා විසින් කරන ලද පාපයනට වන්දි ගෙවයි. දේව වරප්‍රසාද ඉල්ලා සිටියි. ශුද්ධ සභාවේ අති උතුම් වු ද, මූලික වූ ද ජනවන්දනා මෙහෙය නම් දිව්‍ය පූජා යාගයයි.

ජනවන්දනා සඳහා අප එක් රැස්වන විට ක්‍රිස්තුන් වහන්සේ අප අතර වැඩ සිටින සේක. ඔවුන් වහන්සේගේ අපේ උත්තම පූජකයාණෝ ය, පූජාසනයේ සිටින පූජා ප්‍රසාදිතුමා ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් පෙනීසිටියි. ස්වාමීන් වහන්සේ අපේ උත්තම පූජකයාණන් හෙයින් අපගේ ස්වාමින් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මාර්ගයෙන් අපි යාඥා කරමු. පූජෝපහාර පවත්වමු.

ජනවන්දනාවට සහභාගි වන විට අපි ස්වර්ගීය වරප්‍රසාද වලින් පුරවනු ලබමු. ප්‍රසාද ස්ථාපනය මාර්ගයෙන් අපි ජන වන්දනාවට සහභාගිවීමේ අයිතිය ලබා ඇත්තේමු.

## දිව්‍ය පූජා පැවැත්වීම

දිව්‍ය පූජා ඉතිහාසය දෙස බලන විට අපට පෙනි යන්නේ එක් එක් කාලවල දී දිව්‍ය පුජා පිළිවෙව්රි වල බොහෝ වෙනස්කම් සිදුවී ඇති බව ය. එහෙත් එහි මුලික සැලැස්ම (1345-1355) එදා මෙන් අද ද පවතී. දිව්‍ය පූජාව දේව වාක්‍ය පිළිවෙත හා දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත වශයෙන් ප්‍රධාන කොටස් දෙකක් වුවත්, එකම වන්දනා මෙහෙයක් වේ.

ආරම්භක පිලිවෙත මගින්, රැස්ව සිටින දේව ජනතාව එකම සංඝයකට අයිතිය යන හැඟීම් ඇති කරයි. ඒ සියළුදෙනා දේව වචනයට සවන් දීමටත් තමාව පරිත්‍යාග කළ ක්‍රිස්තුන් වහන්සේගේ යාගයට සහභාගි වීමටත්, ක්‍රිස්තුන් වහන්සේ සමඟත්, එකිනෙකා අතර ඇති ඒකත්වය පෙන්නුම් කරන දිව්‍ය සත්ප්‍රසාද භෝජනයට සහභාගි වීමටත් සූදානම් වෙති. ඔවුන් එක තැනකට රැස්වන විට ක්‍රිස්තුන් වහන්සේ විසින් ම වදාළ පරිදි ඬඬමාගේ නාමයෙන් දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් රැස්වන්නේ කොතැන ද, එතැනම මම සිටියෙමි.ඬඬ යන්න සනාථ කරයි.

දිව්‍ය පූජා යාගයේ ප්‍රධාන පූජකළඤදයා වන්නේ ක්‍රිස්තුන් වහන්සේ ය. එය සිදුකරන රාජගුරු ප්‍රසාදි තුමා හෝ පූජා ප්‍රසාදි තුමා ක්‍රිස්තුන් වහන්සේ නියොජනය කරයි. දිව්‍ය පූජාවට දේව ජනතාව ක්‍රියාකාරීව සහභාගි වන අය, ඊට භක්තියෙන් හා අවධානයෙන් සහභාගිවන අය, ගීතිකාවලට සහභාගිවන අය, සත්ප්‍රසාදය බෙදා දෙන අය මේ සියලු දෙනා මේ සංඛ්‍යාවට ගැනෙති.

**දේව වාක්‍යයේ පිළිවෙතඃ**

පුරාණ ගිවිසුමෙන් හා නව ගිවිසුමෙන් කියවෙන පළමු කියවීම සහ දෙවන කියවීම මේ කොටසට අයත් වේ. තුන්වන කියවීමද මේ කෙටසට අයත් වේ. තුන්වන කියවීම සුබ අස්නෙන් තෝරාගත් එදිනට නියමිත කොටසකි. එක්රැස්ව සිටින දේව ජනතාවට ප්‍රකාශ කරන දේව වචනය මගින් ක්‍රිස්තුන් වහන්සේ අප මැද වැඩ වසන සේක. කියවීමෙන් අපි දැනුම ලබා ගනිමු. ප්‍රකාශ කිරීම ඊට වඩා ගැඹුරු දෙයකි. එය අභියෝග කරයි. ඉදිරියට පමුණුවයි. බල කිරීමක් කරයි. එලෙස ම ඉන් සහනයක් සහ සැනසීමක් ගෙන දෙයි. එය ධෛර්යමත් කිරීමකි. ප්‍රීතිය ගෙන දෙන්නකි.

මෙයින් හැඟී යන්නේ දිව්‍ය පූජාවේ කියවීම් කියවන අය, ඒ සඳහා පුහුණුවක් ලැබීමේ ඇති වැදගත්කම යි. එය ඉතා සාර්ථක අන්දමින් ඉටුකිරීමට නම් මනාව සුදානම් විය යුතු ය.

දේව වාක්‍ය මෙහෙයේ උච්චතම අවස්ථාව සුවිශේෂය ප්‍රකාශ කිරීමයි. සුවිශේෂය මගින් ක්‍රිස්තුන් වහන්සේ තම ජනතාව අමතා සැම දෙන විශ්වාසයටත්, සිත්මාරුවකටත් කැඳවන සේක. දේශනයට හිමිතැන දී, දිව්‍ය පූජාව තුළ එහි ඇති වැදගත්කම පෙන්වා ඇත්තේ දෙවන වතිකානු මන්ත්‍රණ සභාවයි. දේශනය යනු දේව වචනය කඩා බෙදා ගැනීමකි. එහි

පරමාර්ථය වනුයේ රැස්ව සිටින දේව ජනතාවට දෙවියන් වහන්සේ, වචනය සහ ක්‍රියා මගින් ඔවුන් තුළ දිගට ම ක්‍රියාකාරී වන අන්දම පෙන්වා දීම ය. දේශනයෙන් පසු විශ්වාසකයින්ගේ යාච්ඤාව මගින් දේව ජනතාව, තම අවශ්‍යතා දෙවියන් වහන්සේ ඉදිරියේ තබයි.

**දිව්‍ය සත්ප්‍රසාදයේ පිළිවෙතः**

සත්ප්‍රසාදික යාච්ඤාව ආරම්භ කිරීමට පෙර පූප සහ මිදිරස අල්තාරය වෙතට ගෙන එයි. දේව මැවිල්ලේ දීමනා ක්‍රිස්තුන් වහන්සේගේ හස්තයේ තබනුයේ, මනුෂ්‍යයාගේ සියළුම උත්සාහයන් සාර්ථක කර, ඒවා පූර්ණත්වයට පමුණුවා දිව්‍ය යාගයක් ලෙස ඔප්පු කිරීමට යි.

**ස්තෝත්‍ර ගීයः**

දිව්‍ය පූජා පිළිවෙතේ ඉතා වැදගත් හා උතුම් යාච්ඤාව නම් ස්තෝත්‍ර ගීය යි. දෙවියන් වහන්සේ ගැලවීම්දායක ක්‍රියාවලියට තුති ප්‍රශංසා ගායනා කිරීම මේ යාච්ඤාවෙන් සිදුවේ. පූප සහ මිදියුෂ ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයට හා රුධිරයට හැරවීමේ හා ගැලවීමේ සත්කෘත්‍යය සිදුවන්නේ මේ අවස්ථාවේදී ය.

දිව්‍ය පූජාව සිදුකරන පූජාප්‍රසාද තුමා දෙවියන් වහන්සේට ආමන්ත්‍රණය කරයි. එතුමා රැස්වී සිටින දේව ජනතාව වෙනුවෙන් දෙවියන් වහන්සේට කථා කරයි. දේව ජනතාව තම විශ්වාසය ප්‍රකාශ කරමින් යාච්ඤාවට සහභාගි වෙයි. යාගයට සහභාගිවන සියළු දෙනා, ජේසුස් වහන්සේව ම දානය කරන මේ යාගය තුළින් එකිනෙකා හා සම්බන්ධ වී යාගයක් වශයෙන් දෙවියන් වහන්සේට ඔප්පු කරයි.

01. **ප්‍රශංසා ගීතයः**

මෙහිදී කිතුනු සභාව ක්‍රිස්තුන් වහන්සේ මගින් ශුද්ධාත්මයාණන් තුළ දෙව් පියාණන් වහන්සේට තුති ප්‍රශංසා කරනුයේ උන්වහන්සේගේ මැවීම, ගැලවීම හා ශුද්ධවන්ත කිරීමේ ක්‍රියාවලිය සඳහා ය.

**02. ශුද්ධාත්මයාණන් වහන්සේට අයැදීමः**

පූජා ප්‍රසාදි තුමා, දෙව් පියාණන් වහන්සේට අයදිනුයේ, පූප සහ මිදි රස ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරයට හැරවීම සඳහා ය. රැස්ව සිටින ජනතාව සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේගේ වරප්‍රසාද වස්වා වදාරණ ලෙස ය. ඬඬදෙව් ස්වාමිනී, මෙම යාගය

සම්පූර්ණයෙන් ආශිර්වාද කර, අනුමත කර ස්ථිර කර ශුද්ධවූ සහ ප්‍රසන්න වූ යාගයක් බවට පත් කරන්නට කරුණා කළ මැනව. එය අප සඳහා ඔබ වහන්සේගේ අති ප්‍රේමණීය පුත්‍රයාණන් ද, අපගේ ස්වාමින් ද වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයත්, ශ්‍රී රුධිරයත් බවට පත්කරන ලෙස අප අවනතව ඉල්ලා සිටිමු. එලෙසම ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයත්, ශ්‍රී රුධිරයත් බෙදා ගන්නා වූ අප සැම දෙන ශුද්ධාත්මයාණන් මගින් එක්සත් කරන ලෙස අවනතව ඉල්ලා සිටිමු.ඬඬ

**03. දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපනය කිරීම පිළිවෙතේ කතාව:**
ක්‍රිස්තුන් වහන්සේගේ වචනයේ බලයෙන් ද ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වයෙන් ද පූප සහ මිදිරස ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයටත්, ශ්‍රී රුධිරය බවටත් පත්වේ. මෙය දිව්‍ය සත්ප්‍රසාදය තුළ සැබවින් ම ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටීමයි. ක්‍රිස්තුන් වහන්සේගේ වැඩ සිටීමේ උතුම් ම අවස්ථාව මෙය යි.

**04. සිහි කිරීම:**
ක්‍රිස්තුන් වහන්සේ දුන් ආඥාවට අවනත වන සභා තොමෝ, දිව්‍ය පූජාව සිදුකරයි. එමගින් අපි ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහස එනම්, උන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය, මරණය හා උත්ථානය සිහිපත් කරන අතර ම ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනය ගැන බලාපොරොත්තුවක් ඇතිකර ගනිමු.

**05. ඔප්පු කිරීම:**
ක්‍රිස්තුන් වහන්සේ සමග ඒකාබද්ධ වූ කිතුනු සභාව, අප සැම දෙවියන් වහන්සේ හා සමගි කර, ක්‍රිස්තුන් වහන්සේව පඬුරක් ලෙස දෙවියන් වහන්සේට පුද කරයි. මේ පඬුර යාගයක් වේ. අප වෙනුවෙන් කැඩී බිඳී ගිය ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයත්, අප වෙනුවෙන් වගුරුවන ලද උන්වහන්සේගේ ශ්‍රී රුධිරයත් පඬුරක් වශයෙන් ඔප්පු කරනු ලැබේ. දිව්‍ය යාගයට සහභාගි වන සැමගේ යාච්ඤා දුක් වේදනා සහ වැඩපළ ක්‍රිස්තුන් වහන්සේගේ යාගයත් සමග දෙව් පියාණන් වහන්සේට ඔප්පු කරන නිසා ඔළජින්වහන්සේගේ යාගය අපගේ ම යාගයක් බවට පත්වේ.

**06. අයැදීම්:**

මේ යාගය මුළු ක්‍රිස්තියානි සභාව සමඟත්, සාන්තුවරයින්ගේ සමෝස ධර්මලාභය සමඟත් සිදුකරන බව මින් පෙන්නුම් කෙරේ. දිව්‍ය ස්තප්‍රසාදය වැඩම වීමට පෙර අයැදීම් බොහොමයක් ඇත. මේ අවස්ථාවේ දී ශුද්ධවන්තයින්ට යාච්ඤා කරයි. එලෙස ම මුළු කිතුනු සභාව වෙනුවෙනුත් එහි නායකත්වය දරන්නන් හා සාමාජිකයන් වෙනුවෙනුත් යාච්ඤා කෙරේ.

කන්‍යා මරියතුමිය ද, අපෝස්තුළුවරුන්, ප්‍රාණපරිත්‍යාගිවරුන් සහ සියළු සාන්තුවරයින් ද සිහිපත් කරයි. එලෙස ම මළා වූ අය ජීවත්වන අප සැම ද මේ යාගික මොහොතේ දී දෙවියන් වහන්සේගේ සම්මුඛයට ගෙන එනු ලැබේ. දෙවියන් වහන්සේගේ මුළු මැවිල්ල වෙනුවෙන් ද යැදීමක් සිදුවේ.

**අවසාන ත්‍රිත්වයික යාච්ඤාව:**

දිව්‍ය සත්ප්‍රසාදික ස්තෝත්‍ර ගීය, පියාණන් වහන්සේට ද, පුත්‍රයාණන් වහන්සේට ද, ශුද්ධාත්මයාණන් වහන්සේට ද, මහිමයත්, ප්‍රශංසාවත්, ස්තුතියත් පුදකරමින් අවසන් වෙයි. මෙය අවසානයේ දී වන්දනා කරන ජනතාව ඞඞආමෙන්ඞඞ කියා මහ හඬින් පිළිතුරු දෙති. සත්ප්‍රසාදික ස්තෝත්‍ර ගීය දේව ජනතාව සමග පිදෙන ක්‍රිස්තුන් වහන්සේගේ ම යාච්ඤාවකි.

ජනතාවගේ තුන් ප්‍රකාර සාදුකාරය තුළින් (එනම් 1. සුවිශුද්ධය 2. විශ්වාසය ප්‍රකාශ කිරීම. 3. උතුම් ආමෙන්) පැහැදිලි කරන්නේ දිව්‍ය සත්ප්‍රසාදික යාච්ඤාව, පූජාප්‍රසාදි තුමා මුළුමනින් ම වාගේ ප්‍රකාශ කළත්, රැස්ව සිටින ජනතාවගේ යාච්ඤාව බවත්, වෙන වචන වලින් කියනවා නම් තම ජනතාව සමග එකට එකතු වී ක්‍රිස්තුන් වහන්සේ විසින් කරන යාච්ඤාවක් බවත් ය.

**අනුභවය: දිව්‍ය සත්ප්‍රසාද අනුභවය**

මෙය ආරම්භ වන්නේ ඞඞපරමණ්ඩල යාච්ඤාවෙනිඞඞ දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙලොව ස්ථිර ලෙස ස්ථාපිත වීමටත්, අපි අනුන්ගේ වැරදි කමා කරන ලෙස අපගේ වැරදි කමා කරන ලෙසත් දෙව් පියාණන් වහන්සේගෙන් ඉල්ලා සිටිමු.

සමාව ඉල්ලා අපි යාච්ඤා කරමු. සමාව දීමෙන් සහ ලබා ගැනීමෙන් ඇතිවෙන සාමය අපි ඉල්ලා සිටිමු. අනිත් අය දෙසට හැරී එකිනෙකාට සාමය පතමු. එකිනෙකාට සමාව දීමෙත්, අපි එකිනෙකාගෙන් සාමය ලබාගැනීමෙත් ඇති වැදගත් කම මින් ප්‍රකාශ කරමු. මේ මාර්ගයෙන් අපි දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීම සඳහා සූදානම් වෙමු.

ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය ලබා ගැනීමට පෙර පූජාප්‍රසාදි තුමා ක්‍රිස්තුන් වහන්සේගේ ඞඞශ්‍රී ශරීරයඞඞ යන වචන උච්චාරණය කළ විට අපි ඞඞආමෙන්ඞඞ කියා පිළිතුරු දෙමු. තවද ධර්මෝපදේශය අපට පැහැදිලි ලෙස ම ප්‍රකාශ කරනුයේ මේ අවස්ථාවේ දී අපගේ දිළිඳු සහෝදර, සහෝදරියන් තුළ ක්‍රිස්තුන් වහන්සේ හඳුනා ගැනීමේ ඇති වැදගත්කම ය.

මඳ වේලාවක නිශ්ශබ්දතාවයෙන් හා යැදීමකින් පසුව දිව්‍ය පූජා මෙහෙය අවසන් වේ. අවසාන යාච්ඤාවෙන් පසු සියළු දෙනා ආශිර්වාද කර පිටත් කර හරිනුයේ දිව්‍ය පූජාව තුළ ජීවත් වීමට ය. මෙසේ එකට රැස්වූ කිතුනු සභාව නැවත විසිර ගොස් තමන් සවන් දුන් දේව වාක්‍යය අනුව විවිධ අන්දමින් ජීවත්වීමට උත්සාහ දරයි.

**ප්‍රසාද නිධාන (පොදු ලක්ෂණ)**

අප ආත්මික ජීවිතය ලබනු සඳහා එහි පූර්ණත්වය සඳහාත් ශුද්ධ සහා දේව ප්‍රසාද නිධාන හතක් දානය කරයි.

- පාපයෙන් අප මුදාගෙන දේව දරුවන් කිරීම සඳහා අපට ප්‍රසාද ස්නාපනය දෙයි.
- ශුද්ධාත්මයාණන්ගෙන් අප ශක්තිය ලබා වැඩිහිටි කිතුනුවකු වීම පිණිස අභිවෘද්ධි ආලේපය දානය කරයි.
- දිව්‍ය සත්ප්‍රසාදයෙහි ජීවමාන පූපයෙන් අප තුළ ඇති ක්‍රිස්තු ජීවය පෝෂණය කරයි.
- සමගි සන්ධානය (නැවත සමගි වීම, පාපොච්චාරණය) මාර්ගයෙන් අපගේ පාපවලට කමාව ලබා දෙයි.
- කුමන හේතුවක් නිසා හෝ මරණාසන්නව සිටින අයගේ ආත්මික හා ශාරීරික ශක්තිය වර්ධනය කිරීමට රෝගීන්ගේ ආලේපය දානය කරයි.

- පූජකත්වයේ බලතල ද එහි ශුද්ධවූ පැවැත්මට සහ කටයුතු කිරීමට අවශ්‍ය වරප්‍රසාද ද  ලැබෙන්නේ පූජකවරයනි.

- ආශිර්වාද කාර බන්ධනයෙන් විවාහ වන යුවති පති දෙදෙනාගේ ජීවිත ශුද්ධ බන්ධනයකින් එක් කරයි.

  1) හැම ප්‍රසාද නිධානයක ම බාහිර දෘශ්‍යමාන ලක්ෂණයක් ඇත. ප්‍රසාද ස්තාපනයේ දී ජලය වත්කිරීමත්, ඒ අතරම නියම වචන උච්චාරණය කිරීමත් ඊට නිදසුන් ය.

  2) බාහිර ලක්ෂණයෙන් සංකේතවත් කරනු ලබන විශේෂ අභ්‍යන්තර වරප්‍රසාදයක් ප්‍රකාශ වේ.

  3) මේ වරප්‍රසාදජනක ලක්ෂණ පිහිටුවන ලද්දේ ක්‍රිස්තුන්වහන්සේ විසිනි.

සෑම ප්‍රසාද නිධානයක් ම, අපගේ ජීවිත ශුද්ධවන්තභාවයට පත්කර ගැනීම සඳහා ඒ ඒ අවස්ථාවල දී ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ අපට හමුවන සලකුණක් වන්නේ ය.

**ආරම්භක ප්‍රසාද නිධාන**

මෙම ග්‍රන්ථයේ දේව ප්‍රසාද නිධාන ඉදිරිපත් කර ඇත්තේ, ක්‍රිස්තුන් වහන්සේගේ පෞද්ගලික ක්‍රියා හෙවත් උත්ථාන වූ ස්වාමීන් වහන්සේ හමුවන අවස්ථා වශයෙනි.

මෙම පාඩම පියවර තුනකින් ඉදිරිපත් කර ඇත.

**1. පියවරඃ** දේව ප්‍රසාද නිධාන ගැන පුරාණ ගිවිසුමේ ප්‍රාග් ඉතිහාසයේ ප්‍රථමයෙන් ම සඳහන් වේ.

**2. පියවරඃ** ජේසුස් වහන්සේගේ ජීවිතය තුළ.

**3. පියවරඃ** සභාව මේ දේව ප්‍රසාද නිධාන සම්බන්ධ කරගත් ආකාරය.

දේව ප්‍රසාද නිධාන ඉදිරිපත් කිරීමේ දී එකම සැලැස්මක් අනුගමනය කර ඇත.

- එය නම් කරන්නේ කෙසේ ද?
- ගැලවීමේ ඉතිහාසය තුළ එම දේව ප්‍රසාද නිධාන
- අද එය පවත්වන්නේ කෙසේද?
- එය ලබා ගත හැක්කේ කාට ද?
- එය දීමේ සේවකයා කව්ද?
- එහි ප්‍රථිපල

අපෝස්තුළුවරුන්ගේ කාලයේ සිට ක්‍රිස්තියානි ජීවිතය, ගමනක ස්වරූපය ඉසිලී ය. මේ ගමනේ විශේෂ අවස්ථාවල දී ආරම්භයන් කිහිපයකට කිතුනුවාට මුහුණ දීමට සිදු වේ. (නව කතෝලික ධර්මෝපදේශය)

අප අතරෙන් බොහෝ දෙනෙකු අවුරුදු කීපයකට පෙර ප්‍රසාද ස්නාපනය ලබා තිබුණත් පාස්කු රාත්‍රියේ දී අප ලබාගත් ප්‍රසාද ස්නාපනයේ පොරොන්දු අලුත්කර, නව දිවියක් ඇරඹීමට සභාව අපට ඇරයුම් කරයි. ප්‍රසාද ස්නාපනය, ජීවිතයේ දිගු ගමනක ආරම්භයකි.

නව කතෝලික ධර්මෝපදේශය, ප්‍රසාද ස්නාපනය පමණක් නොව, අභිවෘද්ධි ආලේපය හා දිව්‍ය සත්ප්‍රසාදයද ආරම්භක දේව ප්‍රසාද නිධාන වශයෙන් හඳුන්වා දෙයි. කිතුනු සභාවට ඇතුළු වීමේ මූලික පිළිවෙත සම්පූර්ණ වන්නේ මේ දේව ප්‍රසාද නිධාන තුන ම ලබාගැනීමෙන් පසුව ය. පෙරදිග සභාවල පිළිවෙතට අනුව මේ දේව ප්‍රසාද නිධාන තුනේ ඇති සම්බන්ධතාව ඉතා පැහැදිලි ය. ළදරු ප්‍රසාද ස්නාපන පිළිවෙතේ දී පවා ප්‍රසාද ස්නාපනය දානය කළ සැනින් අභිවෘද්ධි ආලේපයත්, දිව්‍ය සත්ප්‍රසාදයත් දානය කරනු ලැබේ. රෝමානු පිළිවෙතට අනුව ප්‍රසාද ස්නාපනය ලබා අවුරුදු ගණනාවක ආගමික පුහුණුවකට පසුව දිව්‍ය සත්ප්‍රසාදයත්, අභිවෘද්ධි ආලේපයත්, යන දේව ප්‍රසාද නිධාන දානය කරනු ලැබේ. මෙම ධර්මෝපදේශයේ අරමුණ නම් වැඩිහිටියන් වශයෙන් ප්‍රසාද

ස්නාපනය ලැබීමට සූදානම් වන අයටත්, කුඩා කාලයේ දී ප්‍රසාද ස්නාපනය ලබා තම දැනීම වැඩි දියුණු කරගැනීමට කැමති අයටත් ප්‍රයෝජනවත් වීම ය. අභිවෘද්ධි ආලේපය, ආරම්භක දේව ප්‍රසාද නිධානයේ කොටසක් ද එසේත් නැතිනම් කිතුනුවා පරිණත භාවයට පත්කරන දේව ප්‍රසාද නිධානයක් ද යන්න රෝමානු පිළිවෙත අනුගමනය කරන කිතුනුවාට ප්‍රශ්නයක් වී තිබේ. නව කතෝලික ධර්මෝපදේශයේ සහ කතෝලික සභාවේ අනිකුත් ප්‍රකාශන පැහැදිලි ලෙස ම ප්‍රකාශ කරන්නේ අභිවෘද්ධි ආලේපය ආරම්භක දේව ප්‍රසාද නිධානයක් බවයි. මේ දේව ප්‍රසාද නිධාන තුනේ සාම්ප්‍රදායික පිළිවෙල නැවත පළමු තත්ත්වයට පත් කළ බව එය පෙන්වා දෙයි.

**ප්‍රසාද ස්නාපනයඃ**

ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි තම විශ්වාසය ප්‍රකාශ කරන තැනැත්තා දියේ ගිල්වා, ශුද්ධාත්ම බලයෙන් නව ජීවිතයකට උපත ලබාදෙන දේව ප්‍රසාද නිධානය, ප්‍රසාද ස්නාපනයයි. ප්‍රසාද ස්නාපනය මගින් ඔවුහු ක්‍රිස්තුන් වහන්සේගේ සහෝදර ජනතාවට අයිති වෙති. ඞළජීන්වහන්සේගේ සභාවේ සාමාජිකයෝ වෙති. ඞළජීන්වහන්සේගේ දූත කාර්යයේ පංගු කාරයෝ වෙති.

ජලය ඉතා වටිනා ස්වාභාවික දීමනාවකි. එලෙස ම ජීවිතයේ සාර්ථකත්වයට සලකුණකි. වර්ෂාවෙන් ලැබෙන ජලයෙන් ගොවිකම්, කෙත්වතු සාරවත් වේ. බයිබලයේ සඳහන් වන නෝවාගේ කාලයේ දී ඇති වූ ගංවතුර ටික දෙනෙකුට පමණක් ජීවිතය අත්කර දුන් අතර, එය බොහෝ දෙනෙකුගේ විනාශයට හේතු විය. ඞඞරතු මුහුදේ ජලයඞඞ ඉශ්රායෙල් ජනතාව ඊජිප්තු දේශයේ වහල්කමින් මිදී, පොරොන්දු දේශය කරා පැමිණ නව ජීවිතයක් ආරම්භ කිරීමේ සංකේතයක් විය. එලෙස ම එය ඊජිප්තු සේනාව විනාශ කිරීමට ද හේතු විය. තම දේශයෙන් පිටවී ගිය තැන පීඩනයට පත් වූ ඉශ්රායෙල් ජනතාව ජොර්දාන් ගඟ තරණය කර තම මුතුන් මිත්තන්ට හිමිවූ දේශයට ඇතුළුවී නව ජීවිතයක් ඇරඹීම බෞතිස්ම ස්නාපනයේ සංකේතයකි.

ජොර්දාන් ගඟ අසබඩ දී ක්‍රිස්තුන් වහන්සේ ස්නාවක ජුවාම් තුමාගෙන් බෞතිස්ම ස්නාපනය ලැබීම, ක්‍රිස්තුන් වහන්සේ තමන්වහන්සේව ම හිස්කර ගැනීමේ සලකුණකි. ශුද්ධාත්මයාණන් වහන්සේ උන්වහන්සේ මත වැඩම කළ අතර, පියාණන් වහන්සේ ප්‍රකාශ කළේ ඞඞමේ මාගේ

ප්‍රේමවන්ත පුත්‍රයාණෝ ය. මම උන්වහන්සේ කෙරෙහි අතිශයින් ප්‍රසන්න වෙමිඞඞ යන්නයි.

ක්‍රිස්තුන් වහන්සේ, සිය දූත කාර්යයේ දී තමන්වහන්සේ විසින් ලබාගත යුතු තවත් බෞතිස්ම ස්නාපනයක් ඇති බව ප්‍රකාශ කළ සේක. ,මට එක්තරා බෞතිස්ම ස්නාපනයක් ලබන්නට තිබේ. එය ඉටුවනතුරු මම දැඩි සිත් වේදනාවකින් පසුවෙමි, (ලූක් 12:50).

මින් කියවෙන්නේ උන්වහන්සේගේ දුක් ප්‍රාප්තිය ගැනයි. උන්වහන්සේ මරණයට පත් වූ නමුත් අලුත් ජීවිතයකට උත්ථාන වූ සේක.

ජේසුස් වහන්සේගේ පාස්කු අභිරහසත්, ප්‍රසාද ස්නාපනයත්, සංකේතවත් වන්නේ ඉශ්රායෙල් ජනතාව ඊජිප්තුවේ වහල් කමින් මිදී රතු මුහුදින් එතෙරවීම හා ජොර්දාන් ගඟ තරණය කර පොරොන්දු දේශයට පැමිණීම ය. මරණයේ අඳුරින් මිදී අමරණීය ලෝකයකට පිවිසීම ය.

**ප්‍රසාද ස්නාපනයේ අර්ථය:**

ප්‍රසාද ස්නාපනය පිළිබඳව නව කතෝලික ධර්මෝපදේශයේ ඇති ඉගැන්වීම් මෙලෙස කොටස් 7 කට සාරාංශ කළ හැකි ය.

**1.** ප්‍රසාද ස්නාපනයේ ජලයෙන් අපගේ පව් සෝදා හැර, ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහස හා ඒකාබද්ධ කරයි. ප්‍රසාද ස්නාපනයේ ජලයේ ගිල්වනු ලැබූ අපි පාපයට මැරී ක්‍රිස්තුන් වහන්සේ සමඟ වළලනු ලැබීමු. ජලයෙන් ඉවතට ගනු ලැබූ අපි ක්‍රිස්තුන් වහන්සේ සමඟ නව ජීවිතයකට උත්ථානය ලැබීමු. රෝමවරුන්ගේ සංදේශයේ 6:4 මෙලෙස සඳහන් වේ. ඞඞඑබැවින් අපේ බෞතිස්ම ස්නාපනයෙන් අපිත් උන්වහන්සේ සමඟ වළලනු ලැබීමු. එසේ කරනු ලැබුයේ පියාණන් වහන්සේගේ මහිමාන්විත ක්‍රියාවෙන් ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථානය කරනු ලැබූ සේ ම, අප ද නව ජීවිත මඟක ගමන් කරනු සඳහා ය.

පාස්කු රාත්‍රියේ ප්‍රසාද ස්නාපනයේ ජල පාත්‍රය ආශිර්වාද කිරීමේ දී ආශිර්වාද කරන ලද පාස්කු ඉටිපහන තුන් වතාවක් එය තුළට බහා පූජා ප්‍රසාදිතුමා යාච්ඤා කරනුයේ ශුද්ධාත්ම වරමින් ඒ ජලය ආශිර්වාද කරන ලෙස ය.

**2.** ප්‍රසාද ස්නාපනය මගින් අපි උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ විසින් අපෝස්තුළුවරුන් වෙත දානය කරන ලද ශුද්ධාත්මයාණන් ලබා ගනිමු. ශුද්ධාත්මාගමනය වූ පෙන්තකොස්ත දින, පේදුරු තුමා එහි සිටි ජනතාව කැඳවුයේ තම පාප වලට මනස්ථාපනය වී බෞතිස්ම ස්නාපනය පිළිගන්නා පිණිස ය. එවිට ඔවුහු පව් කමාව ලැබ ශුද්ධාත්ම දීමනා ලබා ගත්හ. ශුද්ධාත්මයාණෝ සත්‍යතාවයේ ස්ප්‍රීතුව වන සේක. ක්‍රිස්තුන් වහන්සේ විසින් උගන්වන ලද දේ මතකයට නඟා ගැනීමටත්, සත්‍ය කරා යාමටත් අපට උපකාරී වන්නේ ඬළජින්වහන්සේ ය. ශුද්ධාත්මයාණෝ කිතුනු සභාවේ සජීව මතකය වෙති.

**3.** ප්‍රසාද ස්නාපනය මගින් අපි කිතුනු සභාවේ සාමාජිකයෝ වෙමු. ශුද්ධාත්මයාණන් වහන්සේ අප පාස්කු අභිරහසට ඇතුළුකර අප ජීවිත පිරිපුන් කරන සේක. මෙලෙස අපි ක්‍රිස්තුන් වහන්සේ සමග කිට්ටු සම්බන්ධතාවක් ගොඩ නගා ගතිමු. ශු. පාවුලු තුමා පවසන පරිදි ඬඬඅපි ක්‍රිස්තුන් වහන්සේගේ ම ශරීරය බවට පත්වෙමු.ඬඬ (1 කොරින්ති 12:27)

**4.** ප්‍රසාද ස්නාපනය මගින් අප බලවත් කරනු ලබමු. මෙ මගින් අපි ක්‍රිස්තුන් වහන්සේගේත්, උන්වහන්සේගේ සභාවේත් දූත කාර්යයට සහභාගි වෙමු.

**5.** ප්‍රසාද ස්නාපනය කිතුනු උදාරත්වයේ මුදුන්මල් කඩයි. ප්‍රසාද ස්නාපනය ලැබීමට වඩා උතුම් වූ උදාරත්වයක් කිතුනු ජීවිතයේ වෙන නොමැත. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව ඬඬකිතුනු සභාවඬඬ යන ව්‍යවස්ථාවේ මෙය හොඳින් පැහැදිලි කර දෙයි.

**6.** කිතුනු එකමුතුවේ බන්ධනය වන්නේ ප්‍රසාද ස්නාපනය නමැති දේව ප්‍රසාද නිධානය යි. ක්‍රිස්තුන් වහන්සේ තුළ විශ්වාසය තබන සෑම දෙනා ම මේ ස්නාපනය මගින් එකමුතු කරනු ලබයි.

7. ප්‍රසාද ස්නාපනය ලබන අය තුළ කවදාවත් නොමැකෙන ලාංඡනයක් පදිංචි වේ. මේ ප්‍රසාද නිධානය ලබන තැනැත්තා කිතුනු වන්දනාව සඳහා කැප කරන අතර, සියළු ම විශ්වාසකයින් සමග පොදු පූජකවරයට සහභාගි වේ. පේදුරු තුමාගේ පළමු ලිපියේ 2:9 සඳහන් පරිදි ,එහෙයින්, අන්ධකාරයෙන් ස්වකීය විස්මපත් ආලෝකයට ඔබ කැඳවාගත් තැනැන් වහන්සේගේ මහිමාන්විත ක්‍රියා දක්වනු පිණිස ඔබ වනාහි තෝරාගත්

වංශයක් ද, රාජකීය පූජක පෙළපතක් ද, ශුද්ධ ජාතියක් ද, දෙවියන් වහන්සේ සතු සෙනඟක් ද වන්නාහු ය.,

**ප්‍රසාද ස්නාපනයේ අවශ්‍යතාව:**

ප්‍රසාද ස්නාපනයේ ඇති අවශ්‍යතාව ක්‍රිස්තුන් වහන්සේ විසින් ම අවධාරණය කර වදාළ සේක. රාත්‍රියේ දී ඞළජීන්වහන්සේ මුණ ගැසීමට පැමිණි නිකදේමුස්ට ජේසුස් වහන්සේ වදාළේ ,ඒකාන්තයෙන් ම මම නුඹට කියමි. යමෙකු වතුරින් ද ආත්මයාණන්ගෙන් ද නූපන්නොත්, ඔහුට ස්වරග රාජ්‍යයට පිවිසිය නොහැක, යනුවෙනි. (ජුවාම් 3:5).

මාර්ක් තුමා තම සුවිශේෂයේ කරන සඳහනට අනුව ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වීමට මොහොතකට පෙර තම ගෝලයන්ට සුබ අස්න දේශනා කර, බෞතිස්ම ස්නාපනය කරන ලෙසට අණකළ සේක. ,විශ්වාසයෙන් බෞතිස්ම ස්නාපනය ලබන තැනැත්තේ ගැලවීම ලබාගන්නේ ය, (මාර්ක් 16:16).

දෙවියන් වහන්සේට කැමති අන්දමකට අප ගලවා ගත හැකි බව ධර්මෝපදේශය පැහැදිලි කරයි. ගැලවීම බෞතිස්ම ස්නාපනය මත රදා පැවතුනත්, අපව ගලවා ගැනීම සඳහා උන්වහන්සේට ප්‍රසාද නිධානයත් අවශ්‍ය නැත. කිතුනු සභාව මීට සම්බන්ධ වූ විශේෂ ඉගැන්වීම් කිපයක් ද ගෙන හැර පායි. විශ්වාසය උදෙසා ප්‍රාණපරිත්‍යාගී වන අය ද, බෞතිස්ම ස්නාපනය සඳහා සූදානම් වන එහෙත් එය ලැබීමට පෙර මිය යන අය ද, දේව වරප්‍රසාදයෙන් පොළඹවන ලදුව අවංකවම දෙවියන් වහන්සේ සොයමින් දේව කැමැත්ත ඉෂ්ට කිරීමට වෙහෙසන අයද, ප්‍රසාද ස්නාපනය නොලබා සිටියත් ගැලවීම ලබාගන්නා බව කිතුනු සභාවේ ඉගැන්වීමයි.

**ලිම්බෝ ස්ථානය ඉවතට:**

නව කතෝලික ධර්මෝපදේශය, ප්‍රසාද ස්නාපනය නොලබා මිය යන ළමයින් ඞඞලිම්බෝඞඞ නැමැති ස්ථානයකට යන්නේය. යන අදහස ප්‍රතික්ෂේප කරයි. ප්‍රසාද ස්නාපනය නොලබා මිය යන ළමයින් දෙවින් වහන්සේගේ අනන්ත දයා කරුණාවට බාර කරන බව එය පවසයි. ජේසුස් වහන්සේ බාලයන්ට කොතරම් ප්‍රේම කළේ ද යත් ඞඞබාලයන් මා වෙතට එන්න ඉඩ හරින්න. ඔවුන්ට බාධා නොකරන්නඞඞ (මාර්ක් 10:14) යයි වදාළ සේක. සියළු ම මනුෂ්‍යයන් ගැලවීම ලබා ගැනීම දෙවියන්

වහන්සේගේ එකම කැමැත්තයි. ප්‍රසාද ස්නාපනය නොලබා මිය යන ළමයින් ගලවා ගැනීම සඳහා ඬිළජින්වහන්සේට මාර්ගයක් ඇත.

පාවුලු තුමා තීතස්ට ලියූ ලිපියේ සඳහන් පරිදි 2:11 දෙවින් වහන්සේ තමන් වහන්සේගේ අභිමතයට අනුව ක්‍රියාකරන බවත්, ඬිළජින්වහන්සේ මිනිසාට දෙන වරප්‍රසාද මිනිසා විසින් ම ප්‍රතික්ෂේප කළොත් මිස ඒ වරප්‍රසාදය අපතේ නොයයි. මෙලෙස ප්‍රසාද ස්නාපනය නොලැබූ ළදරුවන් දේව වරප්‍රසාදය ප්‍රතික්ෂේප කරන්නේ නැත.

**අභිවෘද්ධි ආලේපයඃ**

ආරම්භක දේව ප්‍රසාද නිධානයක් ලෙස අභිවෘද්ධි ආලේපය ප්‍රසාද ස්නාපනය හා දිව්‍ය සත්ප්‍රසාදය සමග ඉතා කිට්ටු සම්බන්ධතාවක් දක්වයි. ප්‍රසාද ස්නාපනය මගින් දේව දරුකමට උපත ලබන කිතුනුවා අභිවෘද්ධි ආලේපය මගින් ශක්තිමත් කරනු ලැබ පරිණත භාවයට පත් වේ. ඔහු පෝෂණය ලබනුයේ දිව්‍ය සත්ප්‍රසාද මගිනි. අභිවෘද්ධි ආලේපය, ප්‍රසාද ස්නාපනය ස්ථිර කරයි. එමගින් ශුද්ධාත්ම වරප්‍රසාද පූර්ණ ලෙස ලබාගන්නා කිතුනුවා ක්‍රිස්තුන් වහන්සේට, වඩා කිට්ටු ලෙස ඒකාබද්ධ වෙයි. දේව රාජ්‍යය ගොඩනැගීම සඳහාත්, කිතුනු සභාවේ දූත කාර්යයට සහභාගි වනු  සඳහාත් අවශ්‍ය ශක්තියත්, ධෛර්යයත් ලබාගනී.

මේ දේව ප්‍රසාද නිධානය දානය කිරීමට නිල බලය ලත් තැනැත්තා රාජගුරු ප්‍රසාදවරයෙකි. එහෙත් සභාවේ යම් යම් අවස්ථාවලදී මේ දේව ප්‍රසාද නිධානය දානය කිරීමට පූජාප්‍රසාදිවරයෙකුට ද බලය ඇත. රෝමානු පිළිවෙතට අනුව රාජගුරු ප්‍රසාදි තුමා අභිවෘද්ධි ආලේපය ලැබීමට සිටින අය මත අත් දිගු කර යාච්ඤා කර, ඔවුන් ඬඬක්‍රිෂම්ඬඬ තෛලයෙන් ආලේප කර ශුද්ධාත්මයාණන්ගේ දීමනා වල මුද්‍රාව ලබාගන්නා ලෙස පවසමින් මේ දේව ප්‍රසාද නිධානය දානය කරයි.

මුල් කිතුනු සභාවේ සිරිත වූයේ ප්‍රසාද ස්නාපනය ලබාගත් සැනින් රාජගුරුප්‍රසාදිතුමා වෙතට ගොස් අභිවෘද්ධි ආලේපය ලබා දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීමයි. පසු කාලයේ දී කිතුනු සභාව විශාලවත් ම මේ ක්‍රමය අහෝසි විය. ප්‍රසාද ස්නාපනය ලබා අවුරුදු ගණනාවකට පසු අනිකුත් දේව ප්‍රසාද නිධාන දානය කරන ලදි. පෙරදිග කිතුනු සභාව ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය හා දිව්‍ය සත්ප්‍රසාදය ආරම්භක දේව ප්‍රසාද නිධාන

ලෙස එකවර දානය කරන ලදි. මේවා දානය කරන ලද්දේ ප්‍රසාද ස්නාපනය දානය කළ පූජාප්‍රසාදිතුමා විසිනි.

රෝමානු කතෝලික සභාව දෙවන ක්‍රමයට අනුව අභිවෘද්ධි ආලේපය දානය කිරීම සඳහා රාජගුරුප්‍රසාදි තුමාගේ පැමිණීම වැදගත් බව සලකයි. එලෙස ම අභිවෘද්ධි ආලේපය, ප්‍රසාද ස්නාපනයෙන් වෙන්කර දානය කරයි. මේ ප්‍රසාද නිධාන දෙක අතර ඇති සම්බන්ධාතාව පෙන්නුම් කිරීමට ප්‍රසාද ස්නාපනය දානය කිරීමේ දී ඬඬක්‍රිෂම්ඬඬ තෛලයෙන් ආලේප කරයි. රෝමානු කතෝලික සභාව අභිවෘද්ධි ආලේපය දානය කරන්නේ වැඩිහිටි වියට පත්වූ පසුව ය.

**දිව්‍ය සත්ප්‍රසාදයඃ**

ආරම්භක දේව ප්‍රසාද නිධාන සම්පූර්ණ වන්නේ දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමෙනි. ප්‍රසාද ස්නාපනය මගින් ක්‍රිස්තුන් වහන්සේගේ පොදු පූජකවරය නමැති උදාර තත්ත්වයට හිමිකම් කියන කිතුනුවා, අභිවෘද්ධි ආලේපය මගින් ශක්තිමත් කරනු ලැබූ පසු කිතුනු සභා සංඝය සමග දිව්‍ය භෝජනයකට සහභාගි වේ. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව දිව්‍ය සත්ප්‍රසාදය හඳුන්වන්නේ ක්‍රිස්තියානි ජීවිතයේ මුදුන් මල්කඩ වශයෙනි.

**දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ**

,දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ, අප සැම, දිළිඳුන් සඳහා කැප කරයි. ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයත් ශ්‍රී රුධිරයත් සත්‍ය ලෙස ලබාගැනීමට නම් දිළිඳුන් තුළ ක්‍රිස්තුන් වහන්සේව හඳුනා ගත යුතුය.,

මෙම දේව ප්‍රසාද නිධානය තුළ ඇති විශ්වාසයේ අභිරහස කෙතරම් වටිද කිවහොත් ඒ එක වචනයකින් හෝ දෙකකින් විස්තර කළ නොහැ!ඞීඥග . එම නිසා නව ධර්මෝපදේශය, මෙම ඬඬදේව ප්‍රසාද නිධානයඬඬ විස්තර කිරීමේ දී විවිධ වචන භාවිතා කර ඇත.

**තුති පිදීමේ පිළිවෙතකි. (EUCHARIST)**

දිව්‍ය සත්ප්‍රසාදය, දෙවියන් වහන්සේට තුති ප්‍රශංසා කිරීමේ පිළිවෙතකි. දෙවියන් වහන්සේගේ පුදුමාකර මැවිල්ල සඳහාත්, ගැලවීම සඳහාත්, ශුද්ධවන්ත කිරීම සඳහාත් දේව ජනතාව වෙනුවෙන් තුති පිදීමේ

පිළිවෙතකි. ඞඞයුකරිස්ට්ඞඞ නම් ග්‍රීක් වචනයේ තේරුම ඞඞතුති පිදීමඞඞ යන්නයි.

**ස්වාමින් වහන්සේගේ භෝජනයයි. (Lord's Supper)**

මින් අදහස් කරනුයේ, ස්වාමින් වහන්සේ, තමන්වහන්සේගේ දුක් ප්‍රාප්තියට පෙරදින සවස, තම ගෝලයින්ගේ පාද දෝවනය කර ආහාරය සඳහා තමන්වහන්සේගේ ම ශරීරයත්, රුධිරයත් ඔවුන්ට දීමයි.

**පූප කැඩීමකි. (Breaking of Bread)**

මුල් ක්‍රිස්තියානින් විසින්, දිව්‍ය සත්ප්‍රසාදය හඳුන්වනු ලද්දේ ඞඞපූප කැඩීමේ පිළිවෙතඞඞ යනුවෙනි. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ සඳහන් පරිදි ඞඞඔවුහු ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි ද, පූප කැඩීමෙහි ද, යාච්ඤාවෙහි ද නිරතව කල්ගත කළ හ.ඞඞ (ක්‍රියා 2:42) ලූක්තුමාගේ සුවිශේෂයේ (24:29-35) එම්මාවුස් නගරයට ගිය ගෝලයන් දෙදෙනා උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ හඳුනාගත්තේ පූපකැඩීමේ මොහොතේ දී ය. ක්‍රිස්තුන් වහන්සේ, අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේ දී ක්‍රියාකරන ලද විලාශය පෙන්නුම් කරන්නේ, ජුදා සිරිත අනුව එක මේසයේ වාඩිවී, අනිත් අය සමග පූප කඩා බෙදාගෙන අනුභව කිරීමෙනි. එක රොටියක් බොහෝ දෙනෙකු සමග බෙදාගැනීම සඳහා කැඩීම, ක්‍රිස්තුන් වහන්සේ හා උන්වහන්සේ අනුව යන්නන් අතර තිබෙන සම්බන්ධතාව පිළිබිඹු කරයි.

**සත්ප්‍රසාදික රැස්වීමකි. (Eucharistic Assembly)**

සභා සංඝය මෙලෙස එක් රැස්වන්නේ දේව වන්දනාව සඳහා ය. ක්‍රිස්තුන් වහන්සේ තුළ සියළු දෙනා එක්රැස්වී සිටින බවත්, ඔවුන් අතර එකමුතු බවත්, ජීවමාන බවත් තදින් කා වදින්නේ මෙවැනි මොහොතක ය.

**සිහිපත් කිරීමකි. (Memorial)**

,මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න.,ඞක්‍රිස්තුන් වහන්සේ තමන්වහන්සේගේ දුක්ප්‍රාප්තියට, මරණයට හා උත්ථානයට පෙර අන්තිම රාත්‍රි භෝජන අවස්ථාවේ දී වදාරණ ලද වාක්‍යයයි මේ. ශුද්ධ ලියවිල්ල තුල .සිහි කිරීමක්. යනු දෙවියන් වහන්සේ අතීතයේ දී කරන ලද දේ ද, දැනට කරමින් සිටින දේ ද පිළිබඳ මතක් කිරීමකි. සභා සංඝය තුල උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ වැඩ සිටිම සිදුවන්නේ දිව්‍ය සත්ප්‍රසාදය මගිනි.

ජුදෙව් පසුබිමට අනුව .සිහි කිරීම. යන්නෙන් අදහස් වන්නේ, යම් කෙනෙක් හෝ යම් සිද්ධියක් හෝ යම් දෙයක් හෝ සිහිකිරීම, සිතිවිල්ලක් පමණක් නොවේ. විශේෂයෙන් සළකුණු හෝ සංකේත මගින් හෝ එම සිද්ධිය මේ අවස්ථාව තුළ ජීවත් වීම ය.

**ශුද්ධවූ යාගයකි. (HOLY SACRIFICE)**

දිව්‍ය සත්ප්‍රසාදය යාගයක් ද වේ. දිව්‍ය සත්ප්‍රසාදය ක්‍රිස්තුන් වහන්සේගේ මරණයේ සහ උත්ථානයේ සිහිකිරීමකි. උන්වහන්සේගේ ශ්‍රී ශරීරය අප වෙනුවෙන් පවරාදෙනු ලැබූ නිසා ද, අප වෙනුවෙන් උන්වහන්සේගේ ශ්‍රී රුධිරය වගුරුවනු ලැබූ නිසා ද දිව්‍ය සත්ප්‍රසාදය යාගයක් වේ. එය කුරුසියේ යාගය, නිතර නිතර ඉදිරිපත් කිරීමකි. එලෙස ම මෙය කිතුනු සභාවේ යාගය යි. කිතුනු ජනතාව තමන්ගේ ස්තුති ප්‍රශංසා, යාච්ඤා සහ ඉල්ලීම්, දිනපතා කරන වැඩ කටයුතු මේ යාගයට සම්බන්ධ කර දෙවි පියාණන් වහන්සේට පුදකරති. ක්‍රිස්තුන් වහන්සේ අප වෙනුවෙන් මධ්‍යස්ථ වන්නාක් මෙන් සභාව වන අපි මුළු ලෝකය වෙනුවෙන් මැදිහත් වෙමු. මුල් කිතුනු යුගයේ දී තම දෑත් දිගුකර යාච්ඤා කරන කාන්තාවකගේ චිත්‍රය කිතුනු සභාවේ සංකේතය ලෙස පෙන්නුම් කෙරිණි. ක්‍රිස්තුන් වහන්සේ කුරුසය මත තම දෑත දිගු කළාක් මෙන් කිතුනු සභාවද ක්‍රිස්තුන් වහන්සේ මගින් ද, උන්වහන්සේ සමග ද, උන්වහන්සේ කෙරෙහි ද කමාව දානය කරමින් මුළු ලෝක ජනතාව වෙනුවෙන් යාච්ඤා කරයි.

**ඉතා උතුම් වූ සහ විශිෂ්ට වූ දේව ප්‍රසාද නිධානයකි. (Most Blessed Sacrament)**

දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත, මුළු ජනවන්දනා ජීවිතයේ ම ඉතා උච්ච වූ මොහොත වේ. අනිකුත් සෑම දේව ප්‍රසාද නිධානයක් ම යොමුවන්නේත්, ඒවායේ පූර්ණත්වය කරා ළඟාවන්නේත් මේ දේවප්‍රසාද නිධානය තුළිනි. සත්ප්‍රසාද මණ්ඩපය (කූඩුව) තුළ ආරක්ෂාව සඳහා බහා තිබෙන දිව්‍ය සත්ප්‍රසාද පූපයට මේ නම භාවිත වේ.

**එකට සම්බන්ධ වීමකි. (Communion)**

මේ දේව ප්‍රසාද නිධානය මගින් අපි ක්‍රිස්තුන් වහන්සේ හා ඒකාබද්ධ වෙමු. ඔළජීන්වහන්සේගේ ශ්‍රී ශරීරයත්, ශ්‍රී රුධිරයත් බෙදා ගැනීමෙන් අපි සැවොම එක ශරීරයක් බවට පත්වෙමු. උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය ලබා ගැනීමෙන් ප්‍රසාද ස්නාපනයේදී අප ලබා ගන්නා ලද දේව

වරප්‍රසාද ආරක්ෂා වේ. වැඩි වර්ධනය වේ. එලෙස ම නවතාවයකට පත් වේ. මේ ඒකාබද්ධතාව අප සැම එක ශරීරයක් බවට පත්කරමින් කිතුනු සභාව ගොඩනඟයි. ක්‍රිස්තුන් වහන්සේගේ ඉතා කුඩා සහෝදර සහෝදරියන් සමඟත්, දිළිඳු අය සමගත්, අසාධාරණකම් වලට මැදිවී සිටින අය සමඟත් විශේෂාකාරයකින් සම්බන්ධවීමට අප සැම කැඳවයි.

**දිව්‍ය යාගයකි. (Holy Mass)**

දිව්‍ය සත්ප්‍රසාදය, දේව ප්‍රසාද නිධායක් මෙන් ම යාගයක් ද වේ. දිව්‍ය පූජාව අවසානයේදී ඊට සහභාගි වූ අය පිටත්කර හරිනුයේ, සුබ වදන තුළ ජීවත්වීමටත්, සුබ වදන ප්‍රකාශ කිරීමටත් ය. ඒ අදහසට අනුව ලතින් සභාව මීට ඞඞමිසියෝඞඞ යන නම භාවිත කෙරේ.

**අනාගත මහිමයේ සහතිකයකි. (Pledge of future Glory)**

සැම දිව්‍ය පූජාවකදී ම අපි මෙසේ යාච්ඤා කරමු. ඞඞඑවිට ජේසු සමිඳාණන් නැවත පැමිණීමේ බලාපොරොත්තුවෙන් ජීවත් වීමට අපට හැකි වන්නේ යඞඞ දිව්‍ය සත්ප්‍රසාදය, අතීතය, වර්තමානයට ගෙන එනවා පමණක් නොව, දේව රාජ්‍යය පූර්ණත්වයට පත්කිරීමට වෙහෙසවන අප සැවොම අනාගතය වෙත ද යොමු කරයි.

**ජීවමාන සම්ප්‍රදායකි. (Living Tradition)**

දිව්‍ය සත්ප්‍රසාදයට පූර්ව සලකුණු කීපයක් පුරාණ ගිවිසුමේ සම්භ වේ. සාලෙම් නුවර පූජක රජතුමෙකු වූ මෙල්කීසදෙක් තුමා ප්‍රථම වරට පූප සහ මිදියුෂ ගෙන දෙවියන් වහන්සේට යාගයක් ඔප්පු කළේ ය. (උත්. 14:18-20) ඊජිප්තු වහල්කමින් මිදුණු ඉශ්රායෙල් ජනතාව, දෙවියන් වහන්සේ කාන්තාරයේ දී මන්නා නැමති භෝජනයෙන් පෝෂණය කළ සේක. සාම්ප්‍රදායික පාස්කු භෝජනය දිව්‍ය සත්ප්‍රසාදයට පෙර ලකුණකි. ඊජිප්තු දේශයේ වහල්කමින් මිදී කඩිනමින් පිටවීම සිහිකිරීම සඳහා ඉශ්රායෙල් ජනතාව විසින් අවුරුදු පතා පාස්කු මංගල්‍යය උත්සවය පැවැත්වීමේ දී නුමුහුන් පූප අනුභව කරන ලදි. භෝජනය අවසානයේ දී පාත්‍රයෙන් පානය කරන ලදී.

අලුත් ගිවිසුමේ දිව්‍ය සත්ප්‍රසාදයට පූර්ව සලකුණ වූයේ, ජේසුස් වහන්සේ පන්දහසකට පූප බෙදා දුන් ප්‍රාතිහාර්යය යි. ජේසුස් වහන්සේ තමන්වහන්සේට ඇහුම්කන් දෙමින් සිටි ජනතාව, බඩගිනි වූ අවස්ථාවේ දී පූප වැඩිකර ඔවුන්ට කන්නට දීමේ ප්‍රාතිහාර්යයේ විශේෂත්වයක් ඇති බව බයිබල් විශාරදයෝ පෙන්වා දෙති. දුක් ප්‍රාප්තිය ප්‍රකාශ කිරීමට පෙර

සුවිශේෂකවරු සතර දෙනා ම මේ සිද්ධිය ගෙන හැර පාති. ඬළජීන්වහන්සේ වෙතට පූප ගෙන ආ කල එයට ආශිර්වාද කර කඩා, බොහෝ දෙනෙකුගේ ආහාරය සඳහා දුන් සේක. සමදර්ශක සුවිශේෂකවරු තිදෙනාත්, පාවුලු තුමා කොරින්තිවරුන්ට ලියු පළමුවන සංදේශයේ 11:23-25 දක්වා වගන්ති වලත් සඳහන් වන්නේ ක්‍රිස්තුන් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපනය කරන ලද අවස්ථාවේ වදාරන ලද වචනයි.

සතරවන සුවිශේෂයේ, ශු. ජුවාම් තුමා දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපනය කිරීම පිළිබඳ කිසිවක් සඳහන් නොකරයි. එහෙත් ශ්‍රාවකයින්ගේ පාද සේදීම පිළිබඳ සඳහන් කරයි. ක්‍රිස්තුන් වහන්සේ තම ශ්‍රාවකයින්ගෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද කියා ඬළජීන්වහන්සේ මේ ක්‍රියාවෙන් තම ශ්‍රාවකයින්ට පෙන්වා දුන් සේක.

,මම ඔබට අලුත් පනතක් දෙමි. මා ඔබට ප්‍රේම කළාක් මෙන්, ඔබ ද එකිනෙකාට ප්‍රේම කළ යුතු ය, (ජුවාම් 13:34). ජුවාම් තුමා වචනයට වඩා ක්‍රියාව උතුම් බව පෙන්වා දෙයි.

ධර්මෝපදේශය ශු. අගුස්තීනු තුමාගේ වචන ගෙනහැර පායි. ඔබ ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයත් එහි අවයවයනුත් වන්නේ නම් අල්තාරය මත ඔබ තබන්නේ ඔබගේ ම ශරීරයයි. ඔබ ඬළජීන්වහන්සේගේ ශරීරය ලබාගන්නෙහි ය. උන්වහන්සේගේ ම වචනයට සවන් දෙන්නෙහි ය. ඔබ ඬළජීන්වහන්සේගේ ශරීරය ලබාගන්නා විට පූජා ප්‍රසාදි තුමා ,ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය යි, කී විට ඔබ ,ආමෙන්, (එසේමයි) කියා පිළිතුරු දෙන්නෙහි ය. එසේනම් ඔබ දෙන පිළිතුර ,ආමෙන්, යන්න සැබෑ වීමට ජීවත් වන්න.

දෙවන ශත වර්ෂයේ මැද භාගයේ ජීවත් වූ ප්‍රාණපරිත්‍යාගී ශු. ජස්ටින් තුමා එදා පැවැත්වූ දිව්‍ය පූජාවේ දළ සැලැස්මක් මෙලෙස ඉදිරිපත් කරයි. ජනතාවගේ රැස්වීම, අපෝස්තුළුවරුන් හා දිවැසිවරුන් විසින් ලියන ලද ලියැවිලි වලින් කොටසක් කියවීම, පූප සහ මිදියුෂ ගෙන ඒම, ප්‍රධාන මූලිකයා විසින් තුති ප්‍රශංසා ගීතය ගායනා කිරීම, සියළු දෙනාම ඬඬආමෙන්ඬඬ කියා හඬගා පිළිතුරු දීම සහ දේව මෙහෙයට සහභාගි වූවන්ට මිදියුෂ බෙදා දීම ආදිය යි. අවසානයේ දී දේව මෙහෙයට සහභාගි වීමට නොහැකි වූවන්ට බෙදා දීම සඳහා තේවාචාරි වරුන් විසින් පූප සහ මිදියුෂ ගෙනයන ලදි.

රෝගී වුවන්ට ගෙන යාම සඳහා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ආරක්ෂා කර තැබීම මේ කාලයේ ආරම්භ කරන ලදි. මැද යුගයේ දී සත්ප්‍රසාද කරඬුවේ ආරක්ෂා කර තබන ලද දිව්‍ය සත්ප්‍රසාද පූප වලට භක්තියක් හා වන්දනාමාන දැක්වීම ආරම්භ විය. නූතන සභාව, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ නිවිසැනසිල්ලේ කාලය ගතකිරීමට ජනතාවට ස්ථානයක් පිළියල කර ඇත.

## සුවය ලබාගැනීමේ දේව ප්‍රසාද නිධාන

## සමගි සන්ධානය දේව ප්‍රසාද නිධානය හා රෝගින්ගේ ආලේපයඃ

,නව කතෝලික ධර්මෝපදේශය, සුවය ලබා ගැනීමේ දේව ප්‍රසාද නිධානය වන සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය හා රෝගින්ගේ ආලේපය පිළිබඳ නව දැක්මක් ලබා දෙයි. පාපොච්චාරණයත්, ආලේප කිරීමත් සමග ධෛර්යයවත් කිරීම පිණිස දානය කරන දිව්‍ය සත්ප්‍රසාදයත්, යන මාර්ගෝපකරණ මෙලොව අපගේ වන්දනා ගමන සම්පූර්ණ කිරීමට දෙනු ලබන අවශ්‍ය ප්‍රසාද නිධාන වේ. මේ දේව ප්‍රසාද නිධාන දෙක අප තේරුම් ගත යුත්තේ වැදගත් කරුණු දෙකක් මුල්කරගෙන ය. මින් පළමුවැන්න, අප අපගේ පව්කාරකම පිළිගැනීමයි. අපගේ පාප කමා කිරීමට දයාබර දෙවියන් වහන්සේ දක්වන නිම්හිම් නැති ආශාව දෙවැන්න යි.

දෙවියන් වහන්සේ සැම විට ම අප කරන පව් වලට සමාව දීමට ඉතා ආශාවෙන් බලා සිටින සේක. අප දෙවියන් වහන්සේට සමීපව සිටියත්, මෙලොව ජීවිතයේ අප ලබන අත්දැකීමක් වන්නේ පාපය යි. මිනිස් ජීවිතයේ මේ පුදුමාකාර අවස්ථාවකි. මේ ගැන පාවුලු තුමා සඳහන් කරන්නේ මෙලෙස ය.

,මා කරන දේ මට ම නොතේරේ. මා කරන්නේ මා කරන්නට කැමති දේ නොව මා දේවේශ කරන දේ ය, (රෝම 7:15).

,මා කැමති වන යහපත නොකර මා අකැමැති වන අයහපත මම කරමි, (රෝම 7:19). පව්කාරයාට සමාව ලබාගැනීමේ වරප්‍රසාදය දීමට බලා සිටින දෙවියන් වහන්සේ ගැන ජේසුස් ස්වාමින් වහන්සේ ලූක් සුවිශේෂයේ ඉතා අනගි උපමා තුනක් වදාළ සේක. එනම් නැතිවූ බැටළුවා, නැතිවූ කාසිය,

නැතිවූ පුතා, මෙම උපමා වලින් දෙවියන් වහන්සේගේ දයාවේ, කරුණාවේ, ආදරයේ ගැඹුරු තත්ත්වය පෙන්වා දෙයි. , .ඒ නිසා මනස්ථාපනය වන එක පව්කාරයකු ගැන ස්වර්ගයෙහි ප්‍රීතිය ඇතිවන්නේ යයි මම ඔබට කියමි. යි ජේසුස් ස්වාමින් වහන්සේ වදාළ සේක, (ලූක් 15:7).

**<u>සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානයඃ</u>**

ක්‍රිස්තුන් වහන්සේ විසින් කිතුනු සභාවට දානය කරන ලද පව් කමාකිරීමේ බලය, එක් එක් ශත වර්ෂවල නොයෙකුත් අන්දමට භාවිත කරන ලදි. මේ දේව ප්‍රසාද නිධානය සඳහා භාවිත, නොයෙකුත් නම් වලින් පෙනී යන්නේ, එක් එක් කාලවල විශේෂ කරුණු අවධාරණය කළ බවයි.

අධ්‍යාත්මික සුවය දානය කරන මේ දේව ප්‍රසාධ නිධානය සිත් හැරීමේ දේව ප්‍රසාද නිධානය ලෙස හඳුන්වන ලද්දේ තම පාපි බව පිළිගෙන, ඊට සමාව ලබාගෙන, දෙවියන් වහන්සේ වෙතට නැවත හැරී ඒමක් සිදුව නිසා ය.

**<u>පශ්චත්තාපයේ දේව ප්‍රසාද නිධානයඃ</u>**

අපගේ පාප වලට පශ්චත්තාප වීමේ ඇති වැදගත්කම හා පව් වලට දක්‍ෂුවම් ඉෂ්ට කිරීමේ ඇති අවශ්‍යතාව අවධාරණය කරන නිසා මේ නම භාවිත වේ.

**<u>පාප උච්චාරණයේ දේව ප්‍රසාද නිධානයඃ</u>**

එක් එක්කෙනා පාප උච්චාරණය කර, ඒවාට පව් සමාව අයදින නිසා මීට මේ නම භාවිතා වේ.

**<u>සමාව ලබා ගැනීමේ දේව ප්‍රසාද නිධානයඃ</u>**

මේ දේව ප්‍රසාද නිධානයේ ප්‍රධාන ප්‍රතිඵලය වන පව් සමාවට මුල්තැන දෙයි. මෙය ලැබීමෙන් පව් සමාවත්, දෙවියන් වහන්සේගෙන් ලැබෙන සිත් සාමයත් අවධාරණය කරයි.

**<u>සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානයඃ</u>**

මේ දේව ප්‍රසාද නිධානය මගින් දෙවියන් වහන්සේ සමඟත් එකිනෙකා සමඟත් නැවත සමගි වීමක් ඇතිකර එම සබඳතාව ගැඹුරු කිරීමක් සිදු වේ. සමගි වීම යනු වෙන් වී සිටි අය නැවත එක් කිරීමකි. නොගැඹුරු මිත්‍රත්වය ගැඹුරු කිරිමකි. මේ දේව ප්‍රසාද නිධානය මගින් වෙන්වීම හෝ ගැඹුරු මිත්‍රත්වය නැති කරන සියළු බාධක දුරු කරයි. අනිකා වෙත

යොමුවීමට සිත් මාරුවක් ඇති කරයි. අපගේ සහෝදර සහෝදරියන් සමග සමාන්තර ලෙස දිව යන සම්බන්ධතාවක් ඇති කරයි.

පූජාසනයේ පඬුපීරු පිදීමට පෙර, අප සහෝදර සහෝදරියන් සමග සාමයෙන් ජීවත් විය යුතු බවට මතෙව් 5:23-24 වගන්ති වලින් ජේසුස් වහන්සේ අවධාරණය කරති. ,එබැවින් ඔබ පූජාසනය වෙත පඬුරක් ගෙනෙන කල, ඔබේ සහෝදරයා ඔබට විරුද්ධව යම්කිසි අමනාපයක් ඇතිව සිටින බව එහිදී සිහිවී නම්, පඬුර පූජාසනය ඉදිරියේ තබා ගොස්, පළමුකොට සහෝදරයා හා සමගි වී, පසුව අවුත් පඬුර පුදන්න.,

දෙවියන් වහන්සේ හා සමගි වීම ඊළඟට වැදගත් වේ. දෙවියන් වහන්සේ අප අතර කරන දෙය පාවුලුතුමා මෙලෙස දකී. (2 කොරින්ති 5:18-19) ,සියල්ල පැමිණෙන්නේ දෙවියන් වහන්සේගෙන් ය. ඔළජීන්වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ කරණ කොටගෙන අප තමන් වහන්සේට සමගි කරගෙන සමගි කිරීමේ සේවය අපට දුන් සේක. එහි තේරුම නම්, මිනිසුන්ගේ පව් ඔවුන්ට විරුද්ධව ගණන් නොගෙන ක්‍රිස්තුන් වහන්සේ කරණ කොටගෙන දෙවියන් වහන්සේ ලෝකය තමන් වහන්සේට සමගි කර ගනිමින් සිටින බවත්, ඒ සමගි කිරීමේ සේවය අපට බාරදුන් බවත් ය.,

කමා නොවූ දාසයා පිළිබඳ උපමාවෙන් ජේසුස් වහන්සේ සමාව දීමේ දෙයාකාරය කදිමට පෙන්නුම් කර දැක්වූ සේක. කමා නොවූ දාසයා පිළිබඳ උපමාවේ දැක්වෙන ආකාරයට තමාට බොහෝ දේ කමා කරනු ලැබුවත්, ඒ තැනැත්තා තම දාසයාගේ සුළු දෙයක් කමා කිරිම ප්‍රතික්ෂේප කළේ ය. මෙ මගින් ජේසුස් වහන්සේ පෙන්නුම් කිරීමට උත්සාහ කරන්නේ මනුෂ්‍යයාගේ සමාව දීම හා දෙවියන් වහන්සේගේ සමාව දීම අතර විශාල පරතරයක් ඇති බවයි. මේ සත්‍යතාව පරමණ්ඩල යාච්ඤාවේ අන්තර්ගත වේ. ,අපේ ණය කාරයන්ට අප කමාකරන්නාක් මෙන් අපගේ ණය වලුත් අපට කමා කළ මැනව, (මතෙව් 18:31-35).

## ප්‍රසාද ස්නාපනයෙන් පසු දෙවියන් වහන්සේ සමග සමගි වීමක් අවශ්‍යය ද ?

ආරම්භක දේව ප්‍රසාද නිධානය මගින් ක්‍රිස්තුන් වහන්සේ තුළ නව දිවියක් ඇරඹේ. මේ අලුත් ජීවිතය පූර්ණත්වයට පත්වන්නේ ක්‍රමයෙනි.

මනුෂ්‍ය ජීවිතයේ අනිවාර්ය අංගයක් වන දුර්වල කම් සහ අස්ථිර භාවය සමග පොර බැදීමට අපට සිදුවේ. අපගේ නිදහස දේව හක්ෂ ශබ්දයට ගලපා ගැනීම තවමත් දුෂ්කර ය. අපගේ නිදහස අයුතු ලෙස භාවිත කර පාපයට වැටීමට අපට ඉඩ ඇත. මින් පෙනී යන්නේ ප්‍රසාද ස්නාපනයත් සමග ඇතිවන අලුත් ජීවිතයේ අත්දැනීම් සමඟ ම ක්‍රිස්තුන් වහන්සේ තුළ පූර්ණත්වයට පත්වීම සඳහා අඛණ්ඩ සිත්හැරීමක් අවශ්‍ය බව ය. මේ අත්දැකීම වේදනාත්මක හෝ ප්‍රීතිදායක හෝ විය හැකි ය.

නව ධර්මෝපදේශය පෙන්වා දෙන අන්දමට, අඛණ්ඩ සිත් හැරීමක් සඳහා ක්‍රිස්තුන් වහන්සේගේ ආරාධනය, කිතුනු ජීවිතය තුළ නිතර ම රැව් පිළි රැව් දෙයි. සිත් හැරීම නොකඩවා කර ගෙන යා යුතු දෙයකි. ක්‍රිස්තුන් වහන්සේ සමග ඇති කිට්ටු සම්බන්ධතාව නිසා කිතුනු සභාව ශුද්ධවන්ත වූවත්, නපුරු බලවේග නිසා මේ සබඳතාවට පලුදු ඇති වේ. මෙය පෞද්ගලික වගකීමක් මෙන් ම සංඝයේ ද වගකීමකි. මෙ මගින් අපි පශ්චත්තාපයටත්, නවතාවයකටත් ඇරයුම් ලබමු. සිත් මාරුව බාහිර දෙයක් නොවේ. ඇතුළාන්තයෙන් අපගේ හදවත තුළ ඇතිවන සත්‍ය වූ මාරුවීමකි. වෙනස් වීමකි. ජොවෙල් දිවැසිවරයාගේ පොතේ 2:12-13 මෙසේ සඳහන් වේ.

ස්වාමින් වහන්සේ මෙසේ වදාරණ සේක. ,උපවාසයෙන් ද වැළපීමෙන් ද මුළු සිතින් දැන්වත් මා වෙත හැරී එන්න. වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න. මන්ද එතුමාණෝ කරුණාබරිත, වහා නොකිපෙන, තිර පෙමින් සමන්විත කමා වීමට කැමති දෙවි කෙනෙකි., ක්‍රිස්තුන් වහන්සේ මේ දිවැසිවරයාගේ මතය ස්ථිර කළ කෙනෙක් වූ සේක. ඒ බව මතෙව් 9:13 න් සනාථ කරයි. ,මම යාග පූජාවට නොව දයාවට කැමැත්තෙමි. මා ආයේ දමිටුන් නොව පව්ටුන් කැඳවීමට ය., පව්ටුන් සමග ආහාර අනුභව කරන බව කියා උන්වහන්සේට දොස් පැවරූ අයට උන්වහන්සේ මේ පිළිතුර දුන් සේක. නියම සිත් හැරීමේ පදනම හෝ මුල වනුයේ බැහැපත් වූ සහ පශ්චත්තාපී වූ හදවතක් ය. මෙය අපගේ එදිනෙදා ජීවිතයේ දී විවිධාකරයෙන් ප්‍රකාශ වෙයි. අප සමග ජීවත්වන අපගේ ම සහෝදර සහෝදරියන්ට සමාව දීම හා ඔවුන්ගෙන් සමාව ලබා ගැනීම සඳහා අප දරන උත්සාහය, අන් අයට අප අතින් වූ

වැරදි පිළිගැනීම, දිළිඳුන්ට ආදර කරුණාවෙන් සැලකීම. සාධාරණත්වය සඳහා වෙහෙසීම, අන්‍යයන්ට සත්‍ය ප්‍රේමය දැක්වීම ආදිය යි.

,නොමග ගිය පව්කාරයකු යළි සත්‍යයට හරවන තැනැත්තේ ප්‍රාණයක් මරණයෙන් මුදා, පව් රාශියක් මකා හරින බව දැනගනීවා, (ජාකොබ් 5:20). ක්‍රිස්තුන් වහන්සේගේ ශුද්ධවූ මරණය සිහිකරමින් චතාරික සමයේදිත්, අවුරුද්දේ සෑම සිකුරාදා දින වලත් පශ්චත්තාපි ක්‍රියාවල යෙදීම කිතුනු ජීවිත ගමනේ සිත් හැරීමේ විශේෂ හා වාසනාවන්ත අවස්ථාවන් ලෙස සැලකිය හැකි ය.

**<u>දේව ප්‍රසාද නිධානයේ පිළිවෙත:</u>**

,ක්‍රිස්තුන් වහන්සේ තමන්වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිත කාලයේ දී තමන් සමග කෑම අනුභව කරමින්, පව්කාරයින් ලෙස ගණන්ගත් අයට සමාව දීමට උත්සුක වූ සේක. උන්වහන්සේ පව් කමා කිරීමේ බලය තම ප්‍රේරිතයන්ට දානය කරමින් පව්කාරයින්ට සමාව දීමට සැලසූ සේක. බැඳීමේ හා මිදීමේ බලය ඔවුන්ට දානය කළ සේක, (මතෙව් 16:19, 18:18).

මේ දේව ප්‍රසාද නිධානය දානය කිරීමේ පිළිවෙත එක් එක් කාල වල දී නොයෙකුත් වෙනස්වීම් වලට භාජනය විය. මුල් අවදියේ දී ඉතා වැදගත් ලෙස සැලකුයේ දැඩි පශ්චත්තාපික ක්‍රියා කිරීම යි. ප්‍රසිද්ධ බරපතළ පව් කළ අයට මේ දඬුවම දෙන ලදි. (මිනී මැරීම්, රූප වන්දනවා, පරස්ත්‍රී හෝ පරපුරුෂ සේවනය) සතරවන ශත වර්ෂයේදී එවැනි පව් කළ අය පශ්චත්තාප වන පව්කරුවන් ලෙස ගණන් නොගෙන, සමාව ලබා ගැනීම සඳහා අවුරුදු කිහිපයක් තුළ පශ්චත්තාපි ක්‍රියා කිරීමට නියම විය.

සතරවන ශත වර්ෂයේ දී ඊජිප්තු තාපස සම්ප්‍රදායේ අනුග්‍රහය ලත් අයර්ලන්ත තාපසවරු, මේ දේව ප්‍රසාද නිධානය පෞද්ගලිකව හා රහසිගතව දානය කිරීම ආරම්භ කළහ.

ඉන් පසු පාපොච්චාරණය අසන පූජා ප්‍රසාදිතුමා සහ පශ්චත්තාපික පව් කරුවා නිර්නාමික ලෙස හමු විය. දෙවන වතිකානු මන්ත්‍රණ සභාව

දක්වා මෙම ක්‍රමය භාවිත විය. පසුව සමගි සන්ධාන දේව ප්‍රසාද නිධානය දාදනය කිරීම සඳහා නව පිළිවෙත් තුනක් හඳුන්වා දෙන ලදී.

**පළමුව** පව් වලට සැබෑ මනස්ථාපනය වීම යි. මින් මතු ඒ පාප වලින් වැළකීමට ස්ථිර අධිෂ්ඨානයක් ඒ සමග විය යුතුය.

**දෙවනුව** පාප උච්චාරණය කිරිමයි. පව්කාර බව පිළිගෙන කරන ලද පාප වලට සම්පූර්ණ වගකීම බාර ගැනීමයි.

මනස්ථාපනය වීමෙන් සහ උච්චාරණය කිරීමෙන් අපි පාපය ප්‍රතික්ෂේප කරමු. ශු. අගුස්තීනු තුමා පාපොච්චාරණයට පාපය විනාශ කිරීම යන්න භාවිත කළ බව නව ධර්මෝපදේශය පෙන්වා දෙයි.

**තෙවනුව** දඬුවම් ඉෂ්ට කිරීමයි. තමා කරන ලද පාප වලට වන්දි වශයෙන් යම්කිසි දඬුවමක් ඉෂ්ට කිරීමයි. මේ ඇත්තෙන් ම දණ්ඩනයක් නොව සුවයක් ඇති කරන ක්‍රියාවකි.

ක්‍රිස්තුන් වහන්සේ හා සමාන වීමට මෙය අපට උදව් වෙයි. ක්‍රිස්තුන් වහන්සේ අපගේ පාප වලට නියමිත වන්දිය ගෙවූ සේක. උන්වහන්සේ දුක් වේදනා සහ මරණයේ ප්‍රතිඵලයක් ලෙස පව්කාරවූ අපට දෙවියන් වහන්සේ හා ඒකාබද්ධ වීමට හැකියාවක් ඇත.

මුල් කිතුනු අවදියේ දී පව් සමාව දෙන ලද්දේත්, සභා සංඝය වෙත නැවත හැරී ඒමට හැකි වූයේත් දඬුවම් ඉෂ්ට කිරීමෙන් පසුව ය. මේ කාලයේදීත් පව් සමාව ලබාගත් පසු දඬුවම් ඉෂ්ට කිරීමට හැකි ය.

පූජා ප්‍රසාදි තුමා පව් සමාව දානය කරන්නේ පහත සඳහන් වචන වදාරමින් ය. ,ස්වකීය පුත්‍රයාණන් ගේ මරණය හා උත්ථානය මගින් සකල ලෝකය තමන් හා සමාදාන කර පව් කමාව සඳහා ශුද්ධාත්මයාණන් අප

වෙත පැමිණෙවු කරුණාබර දෙව්පියාණන් වහන්සේ ශාන්ත සභාවේ සේවය මගින් ඔබට සමාවත්, සාමයත්, දානය කරන සේක්වා. පියාණන්ගෙන් ද, පුත්‍රයාණන්ගේ ද, ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් මම ඔබේ පව් කමා කරමි.,

**<u>දේව ප්‍රසාද නිධානය පැවැත්වීම:</u>**

දෙවන වතිකානු මන්ත්‍රණ සභාව මේ ප්‍රසාද නිධානය, දානය කිරිම වඩාත්, සභාව හා සම්බන්ධ වන අවස්ථාවක් ලෙස පෙන්වා දෙයි. පෞද්ගලික පාපොච්චාරණය කිරීමේ දී, පූජා ප්‍රසාදි තුමා, පව් කරුවාට ආමන්ත්‍රණය කළාට පසු (මුහුණට මුහුණලා හෝ තිරයක් අතරින්) පව්කරුවා පශ්චත්තාපයට කැඳවමින් ශුද්ධ ලියවිල්ලෙන් ඊට සුදුසු පාඨයක් කියවයි. ඒ පිළිබඳ සුළු මෙනෙහි කිරීමකින් පසු පව්කරුවා තමා කළ පව් උච්චාරණය කරයි. ඉන්පසු පූජා ප්‍රසාදිතුමා පව් කරුවාට අවවාදානුශාසනා කරයි. පශ්චත්තාප පව්කරුවා දයාධික මනස්ථාපය උච්චාරණය කර දෙවියන් වහන්සේට ප්‍රශංසා කරයි. දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ දයා කරුණාවෙන් අපට පව් සමාව දීම ඇත්තෙන් ම ප්‍රීතිදායක අවස්ථාවක් වේ.

දෙවැන්න හා තුන්වැන්න පොදු පාපොච්චාරණය හා සම්බන්ධ වේ. ශුද්ධ ලියවිලි පාඨයක් කියවා, එය පිළිබඳ මෙනෙහි කිරීමක් කර, එක් එක්කෙනා පුද්ගලිකව තම පාප උච්චාරණය කර පව් සමාව ලබා ගනියි. තුන්වැන්න පොදුවේ පාපොච්චාරණය කිරීම යි. දේව වචනයට සවන් දී පොදු පාපොච්චාරණයක් හා පොදු සමාවක් ලබාදීම සිදු කෙරේ. කිතුනු සභාව තුන්වැන්න භාවිත කිරීමට අවසර දෙනුයේ ඉතා හදිසි අවස්ථාවක දී පමණ ය.

**<u>රෝගීන් ආලේප කිරිම:</u>**

කෙනෙකුගේ රෝගය තුළින් බොහේ අවස්ථාවල තමාගේ පුද්ගලික චරිතයේ සමහර ලක්ෂණ විදහාපායි. සමහර විට මෙම රෝගය නිසා තමා තුළ මමත්වයෙන් පැන නැගෙන අනුකම්පාවක් ද, බලාපොරොත්තු සුන්බවක් ද, අධෛර්යය වීමක් ද සමහර විට දෙවියන් වහන්සේට විරුද්ධව කැරළි ගැසීමක් පවා ඇති විය හැකි ය. එලෙස ම තවත් සමහර අයට මෙම තත්ත්වය නිසා සිතේ ධෛර්යයක් ද, දරා ගැනීමේ ශක්තියක් ද, සාමකාමී ව එම තත්ත්වය පිළිගැනීමේ හැකියාවක් ද ඇති විය හැක. මෙම ධර්මෝපදේශය සඳහන් කරන පරිදි සෑම රෝගයකින් ම එම පුද්ගලයාට මරණය ගැන ඉඟියක් ලබා ගත හැක.

,ඔබ උදෙසා ම විඳින දුක් ගැන මම ප්‍රීති වෙමි. මාගේ ඒ ශාරීරික දුක් වේදනා හේතුකොට ගෙන ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරිය වන සභාව උදෙසා උන්වහන්සේගේ දුක් විඳීමේ ඌනතා සම්පූර්ණ කිරීමට සහය වෙමි, (කොලොස්සි 1:24).

රෝගින්ට, සභාවේ වැදගත් දූත කාර්යයක් ඇත. ඔවුහු මනුෂ්‍ය ජීවිතයේ ඇති අවිනිශ්චිතභාවයට ද මනුෂ්‍ය පැවැත්වේ ගැඹුරු හා අඛණ්ඩ සත්‍යතාවන්ට ද සාක්ෂි දරති.

ක්‍රිස්තුනි වහන්සේ තම ජීවිත කාලයේ දී සානුකම්පිත බවින් පිරි රෝගින්ට සුවය දානය කළ සේක. තමා රෝගිව සිටි බව ප්‍රකාශ කරමින් මෙසේ වදාළ සේක. ඬඬමම රෝගීව සිටියෙමි, ඔබ මා බලන්නට ආවහු ය.ඬඬ (මතෙව් 25:36) සභා ඉතිහාසය දෙස බලන විට මුල් අවධියේ සිට ම කිතුනු සභාව රෝගින් සහ මරණාසන්න වූවන් සඳහා තම ජීවිතය කැප කර ඔවුන්ට සාත්තු සප්පායම් කළ බව දකින්නට ලැබේ ලෝකයේ සැම තැන ම රෝගීන්ට උවටැන් කරනු සඳහා ආරෝග්‍ය ශාලා ඉදිකර, රෝගීන් සහ පීඩා විඳින්නන් සඳහා ඒවා වෙන්කර සාත්තු සේවයට බොහෝ දෙනා කැපවී ඇත.

ඒ හැරුණු විට රෝගීන් සහ මරණාසන්න වූවන්ට ශක්තිය, සැනසීම හා සාමය ගෙනදෙනු සඳහා විශේෂ දේව ප්‍රසාද නිධානයක් වන රෝගින්ගේ ආලේපය ද දානය කර ඇත. ශු. ජාකොබ් තුමාගේ සංදේශයේ සඳහන් වන වචන වලින් ඒ බව තහවුරු වේ.

,ඔබ අතුරින් යමෙක් රෝගීව සිටින්නේ නම් ඔහු දිනපතා සභා මූලිකයන් කැඳවා ගනීවා. ඒ මූලිකයෝ ස්වාමින් වහන්සේගේ නාමයෙන් ඔහු තෙලින් ආලේප කොට ඔහු උදසො යාච්ඤා කරත්වා, (ජාකොබ් 5:14-15). ජාකොබ් තුමා මෙහි දී කථා කරන්නේ මරණාසන්න වූවන් ගැන නොව සාමාන්‍යයෙන් රෝගීවූවන් ගැන ය. මින් අදහස් කරන්නේ විශ්වාසකයින්ගේ කවුරුන් හෝ රෝගී වී මරණ තර්ජනයට භාජනය වූවොත් හෝ මහළු වී එසේ වුව හොත් රෝගීන්ගේ ආලේපය ලබා ගත හැකි බව ය.

**<u>මේ දේව ප්‍රසාද නිධානය පැවැත්වීමඃ</u>**

අනිකුත් දේව ප්‍රසාද නිධාන මෙන් ම මෙය ද සාංඝික පිළිවෙතකි. ඒ ඒ අවස්ථාව අනුව එය ගෙදර දී හෝ ආරෝග්‍ය ශාලාවේ දී හෝ දේවස්ථානයක දී හෝ දානය කළ හැකි ය. නියම වශයෙන් මෙය දානය කළ යුත්තේ දිව්‍ය පූජා අවස්ථාවේ දී ය.

මේ පිළිවෙත ආරම්භ කරන්නේ පව් සමාව දානය කර, ශුද්ධ ලියවිලි පාඨයක් කියවීමෙනි. පූජා ප්‍රසාදිතුමා රෝගියා වෙනුවෙන් යාච්ඤා කර රෝගීන් සඳහා මහ බ්‍රහස්පතින්දා ආශිර්වාද කරන ලද තෛලයෙන් (ක්‍රිෂම්) ඔහු / ඇය ආලේප කරයි. ආලේප කරමින් පූජා ප්‍රසාදි තුමා මෙසේ යාච්ඤා කරයි. ,මේ ශුද්ධවූ ආලේපයෙනුත්, දෙවියන් වහන්සේගේ අනන්ත දයා කරුණාවෙනුත් ඔබගේ පව් කමා කර ඔබ උත්ථාන කර වදාරණ සේක්වා.,

මේ දේව ප්‍රසාද නිධානයෙන් රෝගියාට චිත්ත සමාදානයත්, සැනසීමත්, ධෛර්යයත් ලැබේ. ඔහුගේ පව් වලට සමාව ලැබී, ක්‍රිස්තුන් වහන්සේගේ දුක් වේදනා හා සම්බන්ධ වී ගැලවීමේ කාර්යයට සහභාගි වේ. එලෙස ඔහු කිතුනු සභාවේ ම ශුද්ධවන්ත භාවය වර්ධනය කරයි. රෝගීන්ගේ ආලේපය මගින්, ප්‍රසාද ස්නාපනයේ දී ආරම්භ කරන ලද ක්‍රිස්තුන් වහන්සේගේ මරණයටත්, උත්ථානයටත් සහභාගි වී පූර්ණත්වය කරා ළඟා වෙයි.

**<u>කිතුනුවන්ගේ අන්තිම සක්‍රමේන්තුවඃ</u>**

කිතුනුවන්ගේ අන්තිම සක්‍රමේන්තුව රෝගින්ගේ ආලේපය නොවේ. රෝගියා මෙලොවින් තුරන් වීමට පෙර මාර්ගෝපකරණ ලෙස ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය හා රුධිරය ලබා ගනියි. කිතුනු සංඝයට ඇතුළත් කරනු ලබන ආරම්භක දේව ප්‍රසාද නිධාන වන ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය හා දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගනියි. මුළු ජීවිතය පුරා ගමනක යෙදුණු කිතුනුවාට පෝෂණයත්, ශක්තියත්, ලැබුණේ දිව්‍ය සත්ප්‍රසාදය මගිනි. මෙලෙස සමාව ලබා ගැනීමත්, ආලේප කිරීමත්, දිව්‍ය සත්ප්‍රසාදයත් ලබා කිතුනු ජීවිතය අවසාන වී දෙවියන් වහන්සේ තුළ පූර්ණ ජීවිතයක් ගත කිරීමට සුදානම් කරනුයේ මේ දේව ප්‍රසාද නිධානය යි.

## සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන

**පූජකවරය හා ආශිර්වාදකාර බන්ධනයः**

පූජකවරයත්. ආශිර්වාදකාර බන්ධනයත් දේව ජනතාව ගොඩ නගයි. (නව කතෝලික සභා ධර්මෝපදේශය ක.ස.ධ) රාජගුරු ප්‍රසාදිවරුන් හා පූජා ප්‍රසාදිවරුන් මිනිස් දුර්වලකමින් පිරිණු අය බව මෙම ධර්මෝපදේශය පිළිගනී.

නව කතෝලික ධර්මෝපදේශය පූජකවරය යන්නෙහි අර්ථය විග්‍රහ කරයි. හෙබ්‍රෙව් වරුන්ට ලියන ලද සංදේශය මේ වචනය භවිතා කිරිමට බොහෝ දුරට හේතු විය. එහිද ක්‍රිස්තුන් වහන්සේගේ පූජකවරය ගැන මෙසේ කථා කරයි. (හෙබ්‍රෙව් 4:14) ,එබැවින් අහස් මණ්ඩල ඉක්මවා ගිය දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් නම් ශ්‍රේෂ්ඨ උත්තම පූජකවරයෙකු අපට සිටින නිසා අපේ ඇදැහිල්ලෙහි නොසෙල්වී පවතිමු. ඔබ මෙල්කිසිදෙක්ගේ පූජක පිළිවෙත අනුව සඳහට ම පූජකයෙක් වන සේක, (හෙබ්‍රව් 7:17).

මුල් කිතුනු සභාවේ නායකත්වය 2 වන ශත වර්ෂය අවසානය දක්වා පැවතුනේ රාජගුරුප්‍රසාදි ධූරය වශයෙනි. මේ තත්වය අද දක්වාත් පවතී. එකිනෙකාට හිමිවන තත්වය හා බලය අනුව කිතුනු සභාවට අයිති දේව ජනතාවට සේවය කිරිමට ඔවුහු බැඳී සිටිති.

**කිතුණු සභාව පූජක ජනතාවකිः**

පුරාණ ඉශ්රායෙල් ජනතාව අතර පැවතුන සමහර සිරිත් කිතුනු ජනතාවගේ වර්ධනයට හේතු වූ බව නොරහසකි. ඉශ්රායෙල් ජනතාව පූජක පරපුරක් ලෙස සලකන ලදි. ඒ අතරින් ලෙවි ගේ පරපුර, දේව ජනතාවට සේවය කිරීමටත්, දෙවියන් වහන්සේ ඉදිරියෙහි ඒ ජනතාව වෙනුවෙන් මැදහත් වීමටත් විශේෂයෙන් වෙන්කර තිබුණේ ය.

ඒ අන්දමට ආරම්භක ප්‍රසාද නිධානය මගින් සියළුම කිතුනුවෝ පොදු පූජකවරයට සාමාජිකත්වය ලබති. එසේ වුවත්, ක්‍රිස්තුන් වහන්සේගේ යාගික වීමේ ක්‍රියා දාමය තුළින්, ගැලවීම්දායක ප්‍රේමය කිතුනු සංඝය වෙත ගෙන යමින් පාලනය කිරීම, ඉගැන්වීම හා ශුද්ධවන්ත කිරීම යන ත්‍රිවිධ කාර්යයන් සඳහා දේවානුභසින් පත් කරන ලද පූජක තත්ත්වයක් දරන විශේෂ කණ්ඩායමක් කිතුනු සභාවට අත්‍යවශ්‍ය විය.

රාජගුරුප්‍රසාදිවරුන්, පූජාප්‍රසාදිවරුන්, සහ තේවාවාරිවරුන් දෙවියන් වහන්සේ විශේෂයෙන් තෝරාගෙන වෙන්කරනු ලබන්නේ දේව ජනතාවට සේවය කිරීම පිණිස ය. ඒ අය දේව ජනතාව අතරින් තෝරාගත් කණ්ඩායමක් මිස දේව ජනතාවට වඩා උසස් කණ්ඩායමක් නොවෙති. මේ අය ක්‍රිස්තුන් වහන්සේගේ උත්තම පූජකවරයේ හවුල්කාරයෝ වෙති. දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ ,ශු.සභාව, යන ප්‍රකාශනයට අනුව, පූජකයාත්, ගිහියාත් එකට සේවය කරමින් ඔවුහු එකිනෙකාට උදව් වෙති.

**<u>රාජගුරු ප්‍රසාදි ධූරයඃ</u>**

කතෝලික සම්ප්‍රදායට අනුව මුල් අවධියේ සිට ම රාජගුරුප්‍රසාදි ධූරයට කිතුනු සභාවේ

විශේෂ තැනක් හිමි විය. පූජකවරයේ පූරණත්වයට හිමිකම් කියන්නේ ද රාජගුරු ප්‍රසාදිවරු ය. එලෙස ම ඔවුහු අපෝස්තුළුවරුන්ගේ තනතුර දරති. හිස මත අත තබා යාච්ඤා කිරීම මගින් ද සභාවේ ත්‍රිවිධ කාර්යයන් වන ඉගැන්වීම, පාලනය කිරීම හා ශුද්ධවන්ත කිරීම සඳහා අධිකාරි බලය ලැබේ. පොදු පියතුමාගේ නායකත්වයෙන් මුළුරාජගුරු මණ්ඩලයට ක්‍රියාකාරී සහභාගිත්වයේ හැකියාව සතු වේ. රාජගුරුප්‍රසාදිවරයෙකු පත් කිරීමට බලය ඇත්තේ පොදු පියතුමාට ය. ඔවුන්ට සිය කාර්යය ඉෂ්ට කිරීමට දෙවියන් වහන්සේගෙන් බලය ලැබෙන්නේ ය.

සෑම රාජගුරු ප්‍රසාදිවරයෙකු ම තම පදවිය තුළ ක්‍රිස්තුන් වහන්සේගේ නියෝජිතයෙකි. එලෙස ම ලෝකයේ වසන සියළු ම රාජගුරු ප්‍රසාදිවරුන්ගේ මණ්ඩලයේ සාමාජිකයෙකි. රෝමයේ රාජගුරු ප්‍රසාදි තුමා වන පොදු පියතුමා එහි නායකයා වෙති. ඬඬරාජගුරු ප්‍රසාදිවරයෙකු සිටින්නේ කොතැන ද එතැන කිතුනු සභාව ය.ඬඬ යනුවෙන් අන්තියෝකයේ ශු. ඉග්නේෂස් තුමා පවසයි.

**<u>පූජා ප්‍රසාදි ධූරයඃ</u>**

පූජකවරයේ පූර්ණත්වය ලබා නොතිබුණත් තම පදවියේ රාජගුරු ප්‍රසාදි තුමා සමග සහයෝගයෙන් ක්‍රියා කිරීමට ඔවුන් සෑම කැඳවයි. රාජගුරු ප්‍රසාදි තුමා සමග එක එක පදවියේ දේව ජනතාවගේ ආධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලීම ඔවුන්ගේ යුතුකම වේ. නව ධර්මෝපදේශය, පූජකවරුන්ගේ වගකීම් තුනක් ඉදිරිපත් කරයි.

**පළමුවැන්න** සුවිශේෂය දේශනා කිරීමයි. ජනතාවට අවවාද අනුශාසනා කරමින්, ක්‍රිස්තුන් වහන්සේගේ පණිවිඩය කවරදාවත් නොඇසූ අයට හා එය අසා ප්‍රතික්ෂේප කළ අයට නිර්භයව හා ධෛර්යය සම්පන්නව ප්‍රකාශ කිරීම වේ.

**දෙවැන්න** පූජාප්‍රසාදි තුමා තම ජනතාවට සැබෑ එඩේරකු විය යුතුය. ඔහු නිතරම ජනතාවට ඇහුම්කන් දීමටත්, ඔවුන්ගේ අවශ්‍යතා සොයා බැලීමටත් උනන්දු විය යුතුය. කාල වේලාව මිඩංගු කළ යුතුය. ඔහු තුළ දේව සේවය සඳහා උද්යෝගයක් හා තම මීසමේ සිටින දිළිඳුන්, කොන්වූවන්, තනිවූවන්, තැලෙන පොඩිවෙන අය ගැන සානුකම්පිත බවක් තිබිය යුතුය. එලෙස ම මීසමේ සිටින ගිහි නායකයින්ට අවැසි නායකත්වය දී ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට හැකි කමක් තිබිය යුතු ය.

**තුන්වැන්න** ඔහුගේ තුන්වන යුතුකම වනුයේ දේව වන්දනා මෙහෙයයන් පැවැත්වීමයි. ජන වන්දනාව කිතුනු සංඝයේ විශ්වාසී ජිවිතයට රුකුලක් වේ.ජන වන්දනා මෙහෙය වන පියතුමා යාච්ඤාවේ සිපී5තුන් යුතුව කිතුනු සංඝයේ විශ්වාසය තහවුරු කෙරේ.එවිට ඔවුන් තුළ අධ්‍යාත්මික ප්‍රීතියක් හා සැහීමක් එමඟින් ඇතිවේ.

<u>**තේවාවාරී ධූරයඃ**</u>

හිස මත අත තබා යාච්ඤා කිරිමෙන් ඔවුන් තේවාවාරිය ධූරයට ඔසවන්නේ කිතුනු සභාවට සේවය කිරිම සඳහා ය. ඔවුන්ට පූජකවරය දානය නොකලත්, දේවවාක්‍ය දේශනා කිරීමට, දිව්‍ය පූජාවේ හා අනෙකුත් ජනවන්දනා මෙහෙයන්හි දී රාජගුරු ප්‍රසාදි තුමාට හා පූජා ප්‍රසාදවරුන්ට සහය වීමට, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ බෙදා දීමට, කතෝලික විවාහයේ දී සාක්ෂි කරුවන් වීමට. එලෙස ම කතෝලික සභාවේ විවිධ දයා සේවයන්හි යෙදීමට බලය ලැබේ.

බටහිර කිතුනු රටවල බොහෝ කාලයක සිට ම තේවාවාරි ධූරය, පූජකවරයේ අන්තිම පියවර ලෙස ගණන් ගැනුණි. දෙවන වතිකානු

මන්ත්‍රණ සභාවෙන් පසු ලතින් කිතුනු සභාව මෙය ස්ථිර ධූරයක් බවට පත් කෙරිණි. බටහිර රටවල විවාහකයින්ට ද තේවාචාරී ධූරය දානය කෙරේ.

මේ ධූරය සඳහා සුදුසුකම් ලබන්නේ ප්‍රසාද ස්නාපනය ලැබුවන් පමණකි. දේව රාජ්‍ය සඳහා අවිවාහකව ජීවත් විමට ඔවුහු සිය කැමැත්තෙන්ම ඉදිරිපත් වෙති. ඔවුන් කැඳවනු ලබන්නේ නිරන්තර සිත් හැදැරීමකින් යුත් ජීවිතයක් ගත කිරිමට ය. එමඟින් සාර්ථක ලෙස දේව සේවයේ යෙදීමේ හැකිකම ලැබේ. ශු. ග්‍රෙගරි නසියන්සස් තුමා මෙලෙස කියයි. ,අන්‍යයන් ශුද්ධවන්ත කිරීමට පෙර අප ශුද්ධවන්ත විය යුතු ය. අන්‍යයන්ට අවවාදානුශාසනා කිරිමට පෙර අප අනුශාසනා ලබා සිටිය යුතු ය. අප ආලෝකය ලබාදෙන පහන් විය යුතු ය. අන්‍යයන් දෙවියන් වහන්සේ වෙතට ළඟා කිරිමට නම් අප ඬළජීන්වහන්සේට ළඟා වී සිටිය යුතු ය.,

පූජකවරය ලබාගත් අය මෙන් ම විශේෂ කණ්ඩායමක් කිතුනු සභාවේ සිටිති. ඒ කණ්ඩායම නම් විවාහ දිවියට ඇතුළුවන ගිහි ජනතාව වෙයි.

**<u>ආශිර්වාදකාර බන්ධනය ඃ</u>**

උත්පති පොතේ සඳහන් වන අන්දමට දෙවියන් වහන්සේ පුරුෂයා සහ ස්ත්‍රිය සම තත්ත්වයක මවන ලද්දේ එකිනෙකා හා ඉතා සමිප සම්බන්ධතාවකින් ජීවත්වන පිණිස ය. ඔවුන්ගේ සම්බන්ධතාවය කෙතරම් සමිප දැ යි කිව හොත් එමගින් දෙදෙනා එක මාංශයක් බවට පත්වෙති. ජේසුස් වහන්සේ ද ,ඔවුන් දෙදනා දෙදෙනෙකු නොව එක මාංශයක් වන්නේ ය, යි ප්‍රකාශ කළ සේක.

ප්‍රථම මිනිසා හා ගැහැණිය අතර වූ ආදරය පලුදු විම ගැනත්, ඒ අනු ව ඔවුන්ගේ එකමුතුකම හා සාමය කඩවිමට හේතුවූ ජන්ම පාපය ගැනත් උප්පත්ති පොතේ සඳහන් වෙයි. මෙසේ ඔවුන් අතර පැවති මේ උතුම් ප්‍රේමය ඇදවැටුණු පහත් තත්වයෙන් මුදාගෙන යලි පළමු තත්වයට ගෙන ඒම මහඟු ගැලවීමේ කාර්යයට මේ ප්‍රසාද නිධානය සම්බන්ධ හෙයින් ප්‍රසාද නිධානයක් ලෙස නම් කර ඇත.

කාන නුවර විවාහ මංගල්‍යයට සහභාගි වූ ක්‍රිස්තුන් වහන්සේ විවාහක සම්බන්ධතාවයේ ඇති යහපත්කම පෙන්වා දුන් සේක. එලෙස ම විවාහ ගිවිසුමේ ඇති ගැඹුරු අර්ථයත්, දෙවියන් වහන්සේ ඉන් බලාපොරොත්තු වන අඛණ්ඩතාවයක් ගැන දේශනා කළ සේක. ඉගැන්වූ සේක.

කතෝලික සභාව අතර ඇති සම්බන්ධතාව, විවාහ වූ පුරුෂයා සහ ස්ත්‍රී අතර ඇති සම්බන්ධතාවයට සමාන කර දක්වයි. කිතුනු විවාහය වෙන් කිරීමට නොහැකි සම්බන්ධතාවකි. ,දෙවියන් වහන්සේ එක් කළ දෙය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා, යි මතෙව් තුමා තම සුවිශේෂයෙන් (19:6) පෙන්වා දෙයි.

**<u>ආශිර්වාදකාර බන්ධනය පැවැත්වීම:</u>**

කතෝලිකයන් දෙදෙනකු අතර ඇතිවන විවාහය සාමාන්‍යයෙන් දිව්‍ය පූජා වේලාවේ දී සිදුවේ. තම මනාලිය වූ කිතුනු සභාවට ක්‍රිස්තුන් වහන්සේ විසින් දානය කරන ලද නව ගිවිසුමේ දිමනාව දිව්‍ය සත්ප්‍රසාදය යි. ඒ නිසා එකිනෙකාට දක්වන ප්‍රේමය තුළ එකමුතු වන මනාල යුවළ තම විවාහ ගිවිසුම දිව්‍ය පූජා යාගය සිදුවන මොහොතේ සිදුකරයි. අවශේෂ කිතුනු සංඝය සමඟ උන්වහන්සෙiධිරී ශ්‍රී ශරීරය හා රුධිරය ලබා ගැනීම ඉතා වටනේ ය.

විවාහ වන දෙදෙනා, එකිනෙකාට මේ දේව ප්‍රසාද නිධානය දානය කරයි. කිතුනු සංඝය ඉදිරිපිට එකිනෙකා තම කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් මේ ප්‍රසාද නිධානය ලබා ගවීඒච්ඒ.

විවාහය සඳහා සූදානම් වීම ඉතා වැදගත් ය. එකිනෙකා ප්‍රකාශ කරන කැමැත්ත සත්‍ය වූ හා වගකිව යුතු එකක් වන්නේ, ඒ පිළිබඳ හොඳ අවබෝධයක් ලබා ගැනීමෙනි. විවාහය සඳහා සූදානම් වන අය දැනුවත් කිරීමේ සැසිවාර පැවැත්වීම සඳහා විවාහ වූ අය ඉතා සුදුසු වෙති. විවාහ ජිවිතයේ ඇති දුක් කම්කටොළු, ප්‍රීති සන්තෝෂ හා ගැටළු යනාදිය ගැන මනා අත්දැකීම් ඔවුහු ලබා සිටිති.

**විවාහ ජීවිතයේ පරමාර්ථ:**

විවාහය හා පූජකවරය යන දේව ප්‍රසාද නිධාන දෙක දේව ජනතාව ගොඩනැගීම සඳහා කෙසේ වැදගත් වේද යන්න ගැන පෙන්වා දීමට නව ධර්මෝපදේශය අපට උපකාරි වේ.

,නව කතෝලික ධර්මෝපදේශය, විවාහ ජීවිතය සම්බන්ධ පරමාර්ථ වල එකම අරමුණක් ඇති බවත්, එම අරමුණේ පැති දෙකක් ඇති බවත් ඉදිරිපත් කරයි. එනම් ඔවුනොවුන්ගේ සුබ සිද්ධිය සහ ජීවිත දානය කිරීමයි. මින් අදහස් කරන්නේ විවාහ යුවළ එකිනෙකාට විශ්වාසවන්තව හා එකිනෙකා කෙරේ විවෘතව ජීවත් විය යුතු බවයි.

සෑම වෛවාහක ක්‍රියාවක් ම නව ජීවිතයක් ලබාදීමේ හැකියාවට විවෘත විය යුතු ය. මෙම ධර්මෝපදේශය ශුද්ධ වන පාවුලු පොදු පියතුමාගේ මනුෂ්‍ය ජීවිතය, නැමැති ප්‍රකාශනය අනුගමනය කරමින්, උප්පත්ති පාලනය සම්බන්ධව සභාවේ ඉගැන්වීම් අනුමත කරයි. දරුවන් ලිංගික ක්‍රියාවේ ප්‍රතිඵලයක් වන අතර දෙවියන් වහන්සේගෙන් ලැබෙන වටිනා දීමනා බව ද කියා සිටියි.

**නිවස සභාවයි**

විවාහයේ සාර්ථකත්වය නම් දරුවන් බිහි කිරීම පමණක් නොවේ. දෙමාපියෝ දරුවන්ගේ පළමු සහ ඉතා වැදගත් ගුරුවරු වෙති. විශ්වාසය ගැඹුරු කරන්නේත්, සදාචාර සම්පන්න කරන්නේත්, පූර්ණ මනුෂ්‍යත්වය හා ක්‍රිස්තියානිකම ඇතිකරන්නේත්, දෙමාපියෝ ය. නිවස තුළ අධ්‍යාපනයක් පමණක් නොව දේව වන්දනාවක් ද සිදු වේ. පවුල, එකමුතු වී යාච්ඤා කිරීමෙනුත්, දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමෙනුත්, මව සහ පියා තම දරුවන් සමග ප්‍රසාද ස්නාපනයෙන් ලබා ගත් පොදු පූජකවරය ක්‍රියාවේ යොදවති. නිවස තුළ ක්‍රිස්තුන් වහන්සේගේ සැබෑ වැඩ සිටීම අත්දැකිය හැක. , .මාගේ නාමයෙන්, දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ එකතු වන්නේ කොතැන ද මම එතැන සිටිමි. යි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක, (මතෙව් 18:20).

,නව ධර්මෝපදේශය,, තම නිදහස් කැමැත්තෙන් හෝ වෙනත් හේතුන් නිසා හෝ සභාව තුළ අද තනිකඩ ජීවිතයකට කැඳවීම ලැබූ අය මතක් කරයි. මෙම අය අවංක ආධ්‍යාත්මික කැපවීමකින් ජේසු ස්වාමින් වහන්සේටත්, ශු සභාවටත්, දුප්පතුන්ට හා අසරණයන්ටත් මහගු සේවයක් ඉටුකරන බව අප පිළිගත යුතු ය. එම නිසා මෙම තනිකඩ ජීවිත ගත කරන සෑම කෙනෙකුව ම ආදරයෙන් හා කරුණාවෙන්, නිවෙස් නැමැති සභාව මගින් ද පොදු සභාව මගින් ද පිළිගත යුතුයි.

# III ඒකකය - කතෝලික සදාචාරාත්මක ජීවිතය

## කතෝලික ජීවිතය හැඳින්වීම

දෙවියන් වහන්සේ අපගේ ස්වාමියාණන්ද පියාණන් ද වන නිසා ඔවුන් වහන්සේගේ අණපණත් පිළිපැදීම අපගේ යුතුකම ය. ආරම්භයේ දී දෙවියන් වහන්සේ ස්වකීය මැවිල්ලේ මනා ක්‍රියාපටිපාටියේ මාර්ගයෙන් අප විසින් කරනු ලැබිය යුතු වූ, ඔවුන් වහන්සේ අභිමත වන දෑ ප්‍රකාශ කර ඇත.

පසුකලෙක දී මනුෂ්‍යයන් සඳහා දස පණත ඳුයී/නය කළ සේක. අපගේ හෘදය සාක්ෂිය මාර්ගයෙන් ද දේව අභිමතය දැනගැනීමට ඉඩ සැලසේ.

ආරම්භයේදී දෙවියන්වහන්සේ විශ්මයජනක වූ ද, විවිධ වූ ද ක්‍රියා පිළිවෙලක් අනුව ලෝකයේ පැවැත්ම ඇති කළ සේක. ඔවුන් වහන්සේ එක එක මැවිල්ලට ඊට ම විශේෂ වූ ස්වභාවයක් දුන් සේක. එයට ම ගැලපෙන නීති රීති සහ පැවැත්මේ ක්‍රමයක් ද දානය කළ සේක.

මේ සැලැස්ම ස්වාභාවික නීතිය වශයෙන් හැඳින්විය හැකි ය. විචාර බුද්ධියක් නැති මැවිලි ස්වකීය අවශ්‍යතා අනුව නිතැතින් ම වාගේ දෙවියන්වහන්සේ විසින් ඒ ඒ මැවිලිවලට කා වැද්දූ ස්වාභාවික බලවේග සහ න්‍යාමයන් අනුගමනය කරයි.

එහෙත් මනුෂ්‍යයන් වන අපි මැවිල්ලේ මෙම පටිපාටිය දැනගෙන කැමැත්තෙන් ම එය අනුගමනය කළ යුත්තෙමු.

ස්වභාව ධර්මයේ ක්‍රියාපටිපාටිය දෙවියන් වහන්සේගෙන් නික්මෙන නිසා එය පිවිතුරු ය, යහපත් ය.

ස්වාභාවික නීතියට විරුද්ධව කටයුතු කරන කවරෙක් නමුත් ඔහු කරන්නේ බරපතල වරදකි.

මැවිල්ලේ ස්වාභාවික නීතිය අනුගමනය කිරිම අන් අයට වඩා කිතුනුවාට පහසු විය යුතු ය. විශ්වාසයේ ආලෝකයෙන් සහ ශුද්ධ සභාවේ ඉගැන්වීම් තුළින් එය වඩා පැහැදිලි ලෙස අවබෝධ කර ගැනීමත්, ඒ සඳහා අවශ්‍ය වරප්‍රසාද බහුල ලෙස දෙවියන් වහන්සේගෙන් අත්ව තිබීමත් ඊට හේතුව ය.

**දස පණත සහ ප්‍රේමයේ පණතේ පැතිකඩ දෙක**

දෙවියන් වහන්සේ සීනයි කන්දේ සිට මහා බලපරාක්‍රමයෙන් යුතුව දස පණත ප්‍රකාශ කර වදාළ සේක. එම පණත් මාර්ගයෙන් ඔවුන් වහන්සේ තම අභිමතය පැහැදිලි ලෙස ද, ගැඹුරු ලෙස ද අපට දන්වා වදාළ සේක. මැවිල්ල තුළ කාවද්දන ලද ස්වාභාවික නීතිය ස්ථිර කළ සේක. අප විසින් කළ යුතු දෑ ද, නොකළ යුතු දෑ ද නියත ලෙස සහ ඒකාන්ත ලෙස දස පණතෙන් ප්‍රකාශ වේ. එම පණත් අපට දෙලෝ වැඩ සලසන මහ සලකුණු පද්ධතියකි.

දිනක් එක්රැස්ව සිටි පරිසිවරුන් අතරෙන් විනයධරයෙක් ජේසුස් වහන්සේ පරීක්ෂා කරමින්

**'ගුරු දේවයිනි'** ව්‍යවස්ථාවලියෙහි ශ්‍රේෂ්ඨතම ආඥාව කිමෙක්දැ. යි ඇසීය.

..ඔවුන් වහන්සේ ඔහුට කථා කොට, .නුඹේ මුළු හෘදයෙන් ද නුඹේ මුළු සිතින් ද නුඹේ මුළු බුද්ධියෙන් ද නුඹේ දෙවි ස්වාමීන් වහන්සේට ප්‍රේම

කරන්න.. මෙය ශ්‍රේෂ්ඨතම පළමුවන ආඥාව ය. දෙවන ආඥාවද එයට සමාන ය.

.එනම් නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාටත් ප්‍රේම කරන්න.ඞ යනුයි. මුළු ව්‍යවස්ථාවලිය සහ දිවැසාවලිය රඳා ඇත්තේ මේ ආඥා දෙක මතය. යි වදාළ සේක.. (මතෙව් 22:35-40).

ප්‍රේමයේ මෙම පණත පැතිකඩ දෙකකින් යුක්ත ය. එනම් දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම සහ අසල්වැසියාට ප්‍රේම කිරීම ය.

ප්‍රේමයේ මෙම ප්‍රධාන ජණත පිළිපැදීමෙන් අපි අන් හැම පණතක්ම පිළිපදින්නෙමු.

පාවුළු තුමා රෝම වරුන්ට ලියන ලද හසුනෙන් එය මෙසේ පැහැදිලි කර ඇත.

කාම මිත්‍යා චාරය නොකරන්න. මිනී නොමරන්න. සොරකම් නොකරන්න, ලෝභ නොවන්න යන ආඥා ද, තවත් අමතර ආඥා ඇත්නම් ඒවා ද නුඹ නුඹට ප්‍රේම කරන්නාක් මෙන් නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න යන පාඨයෙහි සම්පිණ්ඩනය වී ඇත. ප්‍රේමය අසල්වැසියාට නපුරක් නොකරයි. එබැවින් ප්‍රේමය නම් ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් ඉටු කිරීම ය. (රෝම. 13:9-10)

**දස පණත පූර්ණත්වයට පත් කළ ක්‍රිස්තුන් වහන්සේ**

කන්ද උඩ දේශනයේදී ස්වාමීන්වහන්සේ විසින් කරන ලද ප්‍රකාශයක් මතෙව් තුමා වාර්තා කර තිබේ. එය මෙසේ ය.

,මම ව්‍යවස්ථාවලිය සහ දිවැසාවලිය අවලංගු කරන පිණිස ආවෙමිඞ යි නොසිතන්න. මා ආවේ ඒවා අවලංගු කිරීමට නොව සම්පූර්ණ කිරීමට ය. සැබවින්ම මම ඔබට කියමි. අහස සහ පොළොව පහව ගියත් සියල්ල සම්පූර්ණ වනතුරු ව්‍යවස්ථාවලියෙහි ඉස්පිල්ලක්වත්, පාපිල්ලක්වත් පහවී නොයන්නේ ම ය, (5:1 7-18).

මේ අනුව ඔවුන් වහන්සේ දන්දීම යාච්ඤාව සහ උපවාසය පිළිබඳ නව අර්ථ කථනයන් ඉදිරිපත් කළ සේක.

,මිනිසුන්ට පෙනෙන පිණිස ලෝකයා ඉදිරියෙහි ඔබේ පුණ්‍ය ක්‍රියා නොකරන්න බලාගන්න. එසේ කළහොත් ස්වර්ගයෙහි වැඩ වසන ඔබේ පියාණන් වහන්සේගෙන් කිසි විපාකයක් ඔබට නොලැබෙන්නේ ය. එබැවින් ඔබ දන් දෙන කල මිනිසුන්ගෙන් ප්‍රශංසා ලබන පිණිස ධර්ම ශාලා වලදීත්, වීථිවලදීත් කෛරාටිකයන් කරන්නාක් මෙන් ඔබට පෙරටුවෙන් හොරණෑ නොපිඹින්න. සැබවින් ම මම ඔබට කියමි........

ඔබ දන් දෙන කල දකුණත කරන දෙය වමතට නොදැනේවා. දන්දීම රහසක්ව තිබිය යුතු ය. රහසින් එය දකින ඔබේ පියාණන් වහන්සේ ඔබට පල විපාක දෙන සේක.

ඔබ යාච්ඤා කරන කල ඔබේ ම ඇතුළු කාමරයට වැද දොර වසාගෙන රහසිගතව...... යාච්ඤා කරන්න. රහසින් ඔබ කරන දේ දකින පියාණන්වහන්සේ ඔබට පලවිපාක දෙන සේක. මෙසේ කියා ආදර්ශ යාච්ඤාවක් වශයෙන් ස්වාමි  වාක් ආරාධනය ඉගැන්වූ සේක.

ඔබ උපවාස කරන කල දොම්නස් මුහුණු ඇතිව නොසිටින්න. තමන් උපවාස කරන බව මිනිසුන්ට පෙනෙන පිණිස කෛරාටිකයෝ මුහුණ විරූප කර ගනිති. ............... එහෙත් ඔබ උපවාස කරන කල හිසතෙල් ගල්වා මුහුණ සෝදාගන්න. ඔබ උපවාස කරන බව දැනගත යුත්තේ මිනිසුන් නොව දෙවියන් වහන්සේය, (6:1-18)

ජුදා නායකයෝ ව්‍යවස්ථාව තමන්ට රිසි පරිදි අර්ථ කථනය කරගෙන කුමන වරදක් තමන් කළත් එයින් නිදහස්වන ආකාරයට ජීවත් වූහ. කාම මිත්‍යාචාරය පිළිබඳ වැරදිවලට දඬුවම් ලැබුවේ කාන්තාවන් පමණ ය. පිරිමින් ඒ පිළිබඳ කුමන වරදක් කළත් ඔවුන්ට කිසිවෙක් චෝදනා නො කළහ. දුරාචාරයේ යෙදීමේ වරදට එක් කාන්තාවකට ගල් ගසා මරා දැමීමට පැමිණි පිරිසට ජේසුස්වහන්සේ කීවේ, ඔබ අතරින් මෙවැනි වරදක් නොකළ තැනැත්තා, පළමු වැනි ගල ගැසිය යුතු බව ය. එසේ කියූ ඔවුන්

වහන්සේ බිම යමක් ලියන්නට නැඹුරු වූ සේක. පසුව හිස ඔසොවා බලද්දී අභියෝග කළ සැම දෙනාම හෙමින් සීරුවේ එතැනින් මාරුවී ගොස් ය.

සමිඳාණෝ, කාම මිථ්‍යාචාරය ගැන ඇති පණත මෙසේ සංශෝධනය කළහ. කාම මිථ්‍යාචාරය නොකරන්නැයි කී බව ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි. යමෙක් ස්ත්‍රියක දෙස කාම රාගයෙන් බැලූ කෙණෙහිම ඔහු ඈ සමග සිතින් කාම මිථ්‍යාචාරය කර ඇත.

එසේම දික්කසාදය පිළිබඳව මෙසේ ප්‍රකාශ කළ සේක.

තමාගේ භාර්යාව දික්කසාද කරන කවරෙකු වුව ද ඇයට දික්කසාද සහතිකයක් දිය යුතු යැයි කියා ඇත. එහෙත් මම ඔබට කියමි. වෛශ්‍යාකම හැර අන් කරුණක් නිසා සිය භාර්යාව දික්කසාද කරන කවරෙකු වුව ද ඇය කාමමිථ්‍යාචාරයට පමුණුවන්නේ ය. එසේ දික්කසාද කරනු ලැබූ ඇය විවාහ කරගන්නා යමෙක් වේ ද ඔහුත් කාම මිථ්‍යාචාරය කරන්නේ ය.

**දිවුරුම පිළිබඳ ඉගැන්වීම.**

,දිවුරුම් කඩ නොකරන්න. ස්වාමීන් වහන්සේට නුඹ දුන් දිවුරුම ඉටු කරන්නැයි පැරැන්නන් කී බව ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි. කොහෙත් ම නොදිවුරන්න. ස්වර්ගය දෙවියන් වහන්සේගේ සිංහාසනය බැවින් ඒ නමින්වත් පොළොව දෙවියන් වහන්සේගේ පාපුටුව බැවින් ඒ නමින්වත්, ජෙරුසලම මහ රජුගේ රාජධානිය බැවින් ඒ නමින්වත් නොදිව්රන්න. .......... ඔබේ අදහස එසේය. කීම නම් .එසේය. කියා ද .නැත. කීම නම් .නැත. කියා ද වේවා ඊට වැඩිමනත් යමක් ඇද්ද එය එන්නේ නපුරාගෙන් ය.,

**පළිගැනීම පිළිබඳ ඉගැන්වීම**

**.**ඇසට ඇස ය, දතට දත ය.. යන කීම ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි. එදිරිකාරයාට විරුද්ධව එකට එක නොකරන්න. යමෙක් ඔබේ දකුණු කම්මුලට ගැසුවොත් ඔහුට අනෙක් කම්මුල ද හරවන්න. යමෙක් නඩු කියා ඔබේ කමිසය ගන්නට කැමති වුවොත් ඔහුට ඔබේ උතුරු සළුවත් ගන්නට අවසර දෙන්න. නිලධාරියෙක් තම බඩු පොදිය එක කිලෝමීටරයක්

දුර උසුලාගෙන යන්නට ඔබට බල කළොත් ඔහු සමග එය කිලෝමීටර දෙකක් උසුලාගෙන යන්න. ඔබෙන් ඉල්ලන්නාට දෙන්න. ඔබෙන් ණයට ගන්නට කැමති අයට පිටු නො පාන්න.

**සතුරන් කෙරෙහි මෙත් සිත් වැඩීම**

,නුඹේ අසල්වැසියාට ප්‍රේම කරන්න. සතුරාට වෛර කරන්නැඩ යි කී බව ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි. ඔබගේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න. ....... මෙසේ ඔබ ස්වර්ගයේ වැඩ සිටින ඔබගේ පියාණන් වහන්සේගේ පුත්‍රයෝ වන්නාහු ය. කුමක් නිසාද ඔවුන් වහන්සේ දුදනන්ට සහ සුදනන්ට තම හිරු එළිය උදා කරවන සේක . ඔබට ප්‍රේම කරන්නන්ට පමණක් ඔබ ප්‍රේම කරන්නාහු නම් එයින් ඇති විපාකය කුමක් ද? අයකැමියෝ පවා එසේ නොකරත් ද? ඔබේ සහෝදරයන්ට පමණක් ඔබ ආචාර කරන්නාහු නම් එහි ඇති විශේෂය කුමක් ද? විජාතිකයෝ පවා එසේ නොකරත් ද? එබැවින් ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ සර්ව සම්පූර්ණව සිටින්නාක් මෙන් ඔබද සර්ව සම්පූර්ණ වන්න.,

කන්ද උඩ දේශනය මගින් කිතුනු ප්‍රතිපත්ති මාලාවක් පෙළගස්වා ඇති මතෙව් තුමා ක්‍රියාකාරී ක්‍රිස්තියානි ජීවිතයට ආදේශ කර ගත හැකි භාග්‍ය අටක් ද ඉදිරිපත් කර ඇත. එහෙත් ලූක් තුමා තම ග්‍රන්ථයෙන් තැනිතලා ස්ථානයේ දේශනයක් ඉදිරිපත් කරත.

**තැනිතලා ස්ථානයේ දේශනය - සැපත සහ විපත**

ලූක් තුමා සැපතට හේතුවන කරුණු හතරක් ද, විපත්දායක කරුණු හතරක් ද ඉදිරිපත් කරයි.

**සැපතට හේතුවන කරුණු**

1. දිළිඳු වූ ඔබ භාග්‍යවන්තයෝ ය. මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබගේ ය.

2. දැන් සාගිනි ඔබ භාග්‍යවන්තයෝ ය. මන්ද ඔබ තෘප්තිමත් වනු ඇත.

3. දැන් කඳුළු හෙලන ඔබ භාග්‍යවන්තයෝ ය. මන්ද ඔබ සිනාසෙනු ඇත.

4. මනුෂ්‍ය පුත්‍රයාණන් නිසා මිනිසුන් ඔබට වෛර බැඳ ඔබ පිටුවහල් කොට, ඔබට නින්දාකොට ඔබේ නාමය හෙලා දකින කල ඔබ භාග්‍යවන්තයෝ ය.

මිනිස් ජීවිතයේ අවසාන පරමාර්ථය විය යුත්තේ දේව රාජ්‍යය හිමිකර ගැනීම. දේව පුත්‍රයාණන් මිනිස් බව ගෙන මෙලොවට පැමිණියේ දිළිඳුන්ට සහ පීඩිත වූවන්ට දුක් වේදනා විඳින්නන්ට මඕනා ලද්දවුන්ට සුබාරංචිය ප්‍රකාශ කරන්නට ය. එනිසා ඔවුහු භාග්‍යවන්තයෝ ය. දිළිඳු අසරණ ලාසරස් ආබ්‍රහම්ගේ තුරුලට ගියේ ඒ භාග්‍යයේ උරුමය නිසා ය.

සුබෝපභෝගීව ජීවත්වන, සැප සම්පත් විඳින දුක් වේදනා නොහඳුනන, ලෝකයේ තාන්න මාන්න නම්බුව කීර්තිය හඹායන අයට දේව රාජ්‍යයට ඇතුළුවීම ඔටුවකු ඉඳිකටු සිදුරකින් රිංගන්නා වැනි දුෂ්කර කාර්යයකි. ඒ බව තැනිතලා ස්ථානයේ දී ජේසු සමිඳුන් විසින් ජනතාවට ප්‍රකාශ කරනු ලැබූ බව විපත් හතර තුලින් පෙන්වා දී ඇත.

**විපත් :**

1. අහෝ! ධනවත් ඔබට වන විපතක මහත! ඔබේ සැපවත් ජීවිතය ඔබ විඳ හමාර ය.

2. අහෝ! දැන් පුෂ්ටිමත්ව සිටින ඔබට වන විපතක මහත! ඔබට සාගිනි වනු ඇත.

3. අහෝ! දැන් සිනාසෙන ඔබට වන විපතක මහත! ඔබ හඬා වැලපෙනු ඇත.

4. අහෝ! මිනිසුන් ඔබ පසසන විට ඔබට වන විපතක මහත! ඔවුන්ගේ පියවරුන් බොරු දිවැසිවරයන්ටත් කළේ එය ම ය.

**බුද්ධිය නිදහස් කැමැත්ත සහ හැඟීම්**

සැම මනුෂ්‍යයකු තුළම දේව ස්වරූපය ඇත. එයින් අදහස් කරන්නේ සැම මනුෂ්‍යයකු තුළම බුද්ධිය නිදහස් කැමැත්ත සහ හැඟීම් ඇති බව ය. මැවුම්කරුවාණන් විසින් මවන ලද මැවිල්ලෙහි පිළිවෙල දැන ගත හැක්කේ බුද්ධිය මගිනි. බුද්ධිය නිසා අපට අපගේ දැනුම වර්ධනය කරගත හැකි ය. අපගේ අවබෝධය ගැඹුරු කර ගත හැකි ය.

අපට ලැබී ඇති නිදහස් කැමැත්ත මගින් යහපත්වූ දේත්, සත්‍ය වූ දෙත් සොයාගෙන ඊට ආශාවක් සහ ආදරයක් ඇතිකර ගත හැකි ය. යමකු යහපත් දේ කරන තරමට ඔහුට නිදහස් පුද්ගලයකු විය හැකි ය. නිදහස් කැමැත්ත යනු යහපත් දේ තෝරා ගැනීමට ඇති අයිතියයි. අයහපත් දේ තෝරා ගැනිම නිදහස අයුතු ලෙස භාවිත කිරීමකි. එවැන්නා නපුරට වහල් වේ. සත්‍ය නිදහස යනු නිතරම යහපත තෝරා ගැනීම ය.

හැඟීම් මගින් අපි සතුට, ආශා, තරහ, විශ්මය බලාපොරොත්තුව භය, ප්‍රීතිය අත් දකිමු. හැඟීම් අපගේ නිදහස සීමා කරයි. නැතහොත් එය වර්ධනය කරයි. මේ හැඟීම් යහපත තෝරා ගැනීමට ඉවහල්වන ගුණධර්ම බවට හෝ නිදහස අයුතු ලෙස භාවිත කරන දුසිරිත් බවට හෝ පත් විය හැකි ය.

ස්ථානෝචිත ප්‍රඥාව නිතරම ප්‍රඥාවත් තීරණ ගැනීමට අප පොළඹවයි.

සාධාරණත්වය දෙවියන් වහන්සේටත් අසල් වැසියාටත් හිමි විය යුතු දේ දෙයි.

ධෛර්යය නිසා අමාරුකම් හා දුක්වේදනා මැද යහපත කෙරෙහි ස්ථිරව සිටීමට හැකි වෙයි.

ආත්ම දමනය අපගේ ආශාවන් සීමාකර, හැඟීම් පාලනය කර ලෞකික දේ පරිහරණය කිරීමට අවශ්‍ය සමබරතාවය අපට ලබා දෙයි.

**දේව සම්බන්ධ ධර්ම ගුණ**

දේව සම්බන්ධ ධර්ම ගුණ තුනක් ඇත්තේ ය. මේවා මගින් අපට දේව වරප්‍රසාද ලැබෙයි.

විශ්වාසයෙන් අපි අපේ මුළු ජීවිතම දෙවියන් වහන්සේට බාර දෙමු. බලාපොරොත්තුව නම් දෙවියන් වහන්සේ විසින් අපට පොරොන්දු වන ලද සියල්ල ඉටුකරන බව තරයේ අදහාගෙන තම උත්සාහය මත නොව, ඔවුන් වහන්සේ කෙරෙහි යැපීමෙන් ඇතිවන ප්‍රීතියයි.

ප්‍රේමය යනු දෙවියන් වහන්සේටත් අසල්වැසියාටත් ප්‍රේම කිරීමේ පණත සතුටින් ඉටුකිරීම ය.

ප්‍රේමය අනෙක් ධර්ම ගුණ දෙක දරා සිටියි. කිතුනු ජීවිතයේ පදනම ප්‍රේමයයි. දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා ඒකාබද්ධ කරන බන්ධනය ප්‍රේමයයි. එසේම ප්‍රේමය නිසා දෙවියන් වහන්සේ තුළ ජීවත්වීමේ භාග්‍යය අපට අත්වේ.

**හෘදය සාක්ෂිය**

මා ඔබට අද නියමකරන මේ පණත දුෂ්කර එකක්වත් ඉටු කරන්නට අපහසු එකක්වත් නොවේ. එය ඇත්තේ අහසෙහි නොවේ. එබැවින් එය අසා ඉටුකරන පිණිස අප වෙත ගෙන එන්නට කවරෙක් අහසට නඟින්නේද කියා කිසිවකුට කිව නොහැකි ය. එය ඇත්තේ මුහුදින් එතෙරද නොවේ. එබැවින් එය අසා ඉටු කරන පිණිස අප වෙත ගෙන එන්නට කවරෙක් මුහුද තරණය කරන්නේද කියා කිසිවකුට කිව නොහැකි ය. එහෙත් ඒ වචනය ඔබ ඉටු කරන පිණිස එය ඔබට ඉතා ළංව ඔබේ තොල් මත ද, ඔබේ සිතෙහි ද ඇත්තේ ය. (ද්වි. නීති. 30:11-14)

අපගේ තේරුම් ගැනීමේ ශක්තියෙන් මඟ පෙන්වනු ලැබ දේව අභිමතය අප විසින් ඉටුකරනු ලැබීම දෙවියන් වහන්සේගේ අභිලාෂය වන්නේ ය. අප විසින් කළ යුතු සහ නොකළ යුතු දෑ තෝරා ගැනීමේ ශක්තියක් දෙවියන් වහන්සේ අපට දී ඇත. මේ ශක්තිය හෘදය සාක්ෂිය වශයෙන් අපි හඳුන්වමු.

අප යමක් කිරීමට පෙර එය යහපත් ද, නැතහොත් අයහපත් ද කියා අපගේ හෘදය සාක්ෂිය අපට දැනුම් දෙයි. යමක් කළ පසු එය යහපත් නම් හෘදය සාක්ෂිය එය අගය කරයි. අයහපත් නම් අපට දොස් නඟයි. අප සිදුකළ දේ පිළිබඳව යහපත් හෘදය සාක්ෂියක් හෝ අයහපත් හෘදය සාක්ෂියක් හෝ තිබෙන බව, අප තේරුම් ගත යුතු ය.

මෙය කළ යුතු ය නැතහොත් නොකළ යුතු ය යනුවෙන් අපගේ හෘදය සාක්ෂිය පැහැදිලි ලෙසම අපට ප්‍රකාශක කරද්දී අප එක්විටම එයට අවනත විය යුතු ය. ස්වකීය හෘදය සාක්ෂියේ පැහැදිලි විනිශ්චයට විරුද්ධව කටයුතු කරන කවරෙක් හෝ වේවා ඔහු දෙවියන් වහන්සේට විරුද්ධව පාපයක් කරයි. එහෙයින් අන්‍යයන්ගේ විධාන හෝ තර්ජන හෝ අප අපගේ හෘදය සාක්ෂියට විරුද්ධව කටයුතු කිරීමේ හේතු නොවිය යුතු ය.

අපගේ හෘදය සාක්‍ෂියට අනුකූලව අවංකව අපි කටයුතු කරමු නම් දෙවියන්වහන්සේ අපට ප්‍රීතිය හා චිත්ත සාමය දෙන සේක. අයහපත් හෘදයසාක්‍ෂියක හිංසාවෙන් මිදී, නිවැරදිව කටයුතු කළෙමු යන විශ්වාසයෙන් සතුටු විය හැකි ය.

නිතර නිතර හෘදයසාක්ෂියේ හක්‍ෂ ශබ්දයට විරුද්ධව ක්‍රියා කරන්නාගේ හෘදය සාක්ෂියේ හක්‍ෂ හීන වේ. මෙය පුරුද්දක් වීමට ඉඩ තැබීමෙන් අවසානයේ දී හෘදය සාක්ෂියේ ක්‍රියාකාරිත්වය මුළුමනින්ම ඇන හිටියි. එවැන්නම දිනෙන් දින වඩ වඩා නපුරට පෙළඹී අවසානයේ දී ඉතා බරපතල අපරාධකාරයෙක් වෙයි. මහා ප්‍රපාතයක් දෙසට ගමන් කරන අන්ධයකුට හෙතෙම සමාන වන්නේ ය.

ඇතැම් විට අපගේ හෘදය සාක්ෂියට වැරදි සිදුවිය හැකි ය. පාපයෙන් එය අඳුරු විය හැකි ය. එවන් අවස්ථාවක නිවැරදි තීරණවලට එළඹෙනු සඳහා, ස්වාභාවික නීතියෙන් ද, දස පණතෙන් ද, ක්‍රිස්තුන් වහන්සේගේ ආදර්ශයෙන් ද, ශුද්ධ සභාවේ ඉගැන්වීම් වලින් ද එය මඟ පෙන්වනු ලැබිය යුතු ය. මෙවැනි අසීරු අවස්ථාවක දී අප නිසි ආලෝකය ලැබෙන ලෙස දෙවියන්වහන්සේට යාච්ඤා කළ යුතු ය. තම දෙමාපියන්ගේ ආගමික

ශ්‍රේෂ්ඨයන්ගේ ගුරුවරුන්ගේ සහ වගකිවයුතු වැඩිහිටියන්ගේ උපදෙස් ලබා ගැනීම ද මැනවි.

## දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම

මුල් පණත් තුන දෙවියන් වහන්සේ හා අප අතර ඇති සම්බන්ධතාවය ගෙන හැර දක්වයි.පළමු පණතින් දෙවියන් වහන්සේ ගේ ඒකියභාවය ගැන උගන්වයි. ඞඞර්ජිප්තු දේශයේ වහල්කමින් නුඹ මුදාගත් නුඹගේ ස්වාමී වූ දෙවියන් වහන්සේ මම ය. මා ඉදිරියෙහි බොරු දෙවිවරුන් නොතබන්න.ඞඞ (නික්මයාම 20:1-3) ,නුඹ, සහ ,මම, යන වචන භාවිත කරමින් දෙවියන් වහන්සේ මනුෂ්‍යාට පුද්ගලිකව ම අමතන බව මේ දෙබසින් පැහැදිළි වේ. දෙවියන්වහන්සේ තම ජනතාවට කරන ලද දේ සඳහන් කරන හැදින්වීම පළමුවන පණතට පමණක් නොව පණත් සියල්ලටම පොදු වේ.

**පළමුවන පණතඃ**

පළමුවන පණතින් අපට නියම වන්නේ දෙවියන් වහන්සේට වන්දනා කිරිමත්, කීකරුවිමත්, මෙහෙ කිරිමත් ය. දෙවියන්වහන්සේ ඉදිරියෙහි බොරු දෙවිවරුන්ට වන්දනා කිරීම මේ පණතින් තහනම් වේ. මවන ලද කිසිවක් දෙවියන් වහන්සේට සමාන කළ නොහැකි ය.

දෙවියන් වහන්සේට පමණක් දීමට සුදුසු වූ වන්දනාව, මවන ලද කිසිවකට දෙන විට **,රූප වන්දනාව,** නම් වේ. අප කරන ව්‍යාපාර, සාර්ථකත්වය හා ජයගැනීම ආදියෙහි ඇලී ගැලී, ඒවාට ජීවිතයේ ප්‍රමුඛතාවය දෙන විට, දෙවියන් වහන්සේව අමතක කර දෙවියන්ට හිමි තැන ඒවාට දෙන විට මේ පණතට පටහැනිව අපි ක්‍රියා කරමු.

**දෙවන පණතඃ**

**,නුඹ දෙවියන් වහන්සේගේ නාමය අගරු ලෙස භාවිත නොකරව, (නික්ම 20:7).**

දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමය සහ ඊට දිය යුතු ගෞරවය ගැන මේ පණතින් දැක්වේ. නික්මයාම පොතේ 3 වන පරිච්ඡේදයේ සඳහන් පරිදි දෙවියන් වහන්සේ මෝසස් තුමාට නොදැවෙන පඳුරක් මැදින් ගිනි ජාලාවක ආකාරයෙන් දර්ශනය වූහ. මෙහිදී මෝසස් තුමා ඔබගේ නම කුමක් දැයි දෙවියන් වහන්සේගෙන් ඇසූ විට ඔවුන් වහන්සේ පිළිතුරු දුන්නේ **YHWH** යන්න ඔවුන් වහන්සේගේ නාමය බවයි.මෙය කෙසේ ශබ්ද කළ යුතු දැඩයි කව්රුත් නොදනි. බයිබල් විශාරදයින් සිතන අන්දමට ඞඞදෙවියන් වහන්සේගේ වැඩ සිටීමඞඞ පිළිබදව කිසිවක් ඉන් කියවෙන බවයි. මේ නම දරන තැනැත්තා මෝසස්තුමාට ස්ථිර වශයෙන් ම කියා සිටියේ ඉජිප්තුවේ වහල්කමින් මිදී මිසර දේශයට යන ගමනේ දී දෙවියන් වහන්සේ ඔහු සමඟ වැඩ සිටින බවයි.

පුරාණ කාලයේ යම් කිසි කෙනෙකුට නමක් දීමේදී, නම දුන් තැනැත්තාට, නම ලැබූ තැනැත්තා හෝ දෙය කෙරහි බලයක් ඇති බව පෙන්ණුම් කෙරිණි. උත්පත්ති පොතේ, ආදම් සතුන්ට නම් කියා කථා කිරිමෙන් පෙන්නුම් කළේ ඔහුට සතුන් කෙරෙහි බලයක් ඇති බව ය. දෙවියන් වහන්සේ, ඉශ්රායෙල් ජනතාවට, තමන් වහන්සේගේ නම ප්‍රකශ කිරීමෙන් ඒ ජනතාවට දෙවියන් වහන්සේට යම් කිසි බලපෑමක් කළහැකි බව ප්‍රකාශ කරයි. දෙවන පණත මෙම බලය අයුතු ලෙස භාවිත නොකළ යුතු බව මතක් කරයි.

දෙවියන් වහන්සේගේ ශුද්ධ නාමය අයුතු ලෙස හෝ අගෞරවය ලෙස හෝ භාවිත කිරීම දේවාපහාසයකි. එලෙස ම බොරුවක් සනාථකිරීමට දෙවියන් වහන්සේගේ ශුද්ධ නාමය භාවිතා කිරීම, දේව ප්‍රේමයත්, දේව සම්බන්ධතාවයත් සුළුකොට තැකීමකි.

**තුන්වන පණතඃ**

**,සබත් දවස ශුද්ධ ලෙස පැවැත්විමට සිතට ගන්න, (නික්මයාම 20:8).**

ලෝකය මවා, සත්වන දින දෙවියන් වහන්සේ නිවාඩු ගත් බව ජුදා ජනතාව විසින් සබත් දවසේ දී සිහිපත් කරන ලදී. එලෙස ම ඊජිප්තුවේ වහල්කමින් මිදීම, විමුක්තිය ලබා ගැනීම ආදිය සබත් දවසේ දී සිහිපත් කළ හ. දේව ප්‍රශංසා ගැයීම සඳහා ඒ දින වෙන්කරන ලද හෙයින් එදින ගිවිසුමේ සංකේතයක් ලෙස ගත කළ හ. සබත් දවස, නිවාඩු දවසක් හැටියට ගත කිරීම මනුෂ්‍ය සංස්කෘතියට වැදගත් වර්ධනයක් ඇති කිරිමට හේතු විය. එදින වැඩ කිරිමෙන් වැළකී සිටියේ ශරීරයට නවතාවයක් ගෙනදීම සඳහා ය. එදින නිවාඩු ගැනීම, වැඩට වහල් වීමට හා වස්තුවට වන්දනා කිරිමට විරුද්ධත්වය ප්‍රකාශ කිරීම හා සමාන විය. සභාව, සබත් දවස ඉරිදාට යොදාගෙන ඇත. එය සතියේ පළමුවන දිනයයි. ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වු දිනයයි. ස්වාමින් වහන්සේ විසින් සාදන ලද දිනයයි. සතියේ පළමුවන දින, අපට දේව මැවිල්ල සිහිපත් කරයි. සතියේ අවසාන දින උත්ථානය ප්‍රමුඛ කොට ඇති වූ නව මැවිල්ල සිහිපත් කරයි.

ඉරිදා, දිව්‍ය පූජාව නිසා පූජනීය දිනයකි. සතියේ දිනවල පැවැත්වෙන දිව්‍ය පූජා වලට වඩා ඉරු දින දිව්‍ය පූජාව පූජනීය වන්නේ එය අපෝස්තුළුවරුන්ගේ කාලයේ තිබුණු සම්ප්‍රදායට නෑකම් කියන නිසා ය. මුළු කිතුනු සංඝය ම ඉරු දින දිව්‍ය පූජාව සඳහා රැස්වේ. ගරු ගාම්භීකාරයෙන් පැවැත්වෙන එදින දිව්‍ය පූජාවට සහභාගිවීම කිතුනු ණය යුක්තිය!වී එය, ණය යුක්තිය වුවත් නීතියට වඩා ප්‍රේමයෙන් නික්මෙන ක්‍රියාවක් විය යුතු ය.

තමන්ගේ දිළිදුකම හා අසරණ කම නිසා ඉරුදින වත් නිවාඩුවක් ලබා ගැනීමට නොහැකි අය ගැන සිහිකිරීම අපගේ යුතුකමක් බව නව ධර්මෝපදේශය මතක්කර දෙයි. ක්‍රිස්තුන් වහන්සේ කළාක් මෙන් අපත්, ඉරුදින දිළිඳුන් උදෙසා අපගේ ශ්‍රමය වැය කිරිමට උත්සහ දැරිය යුතු ය.

## අසල් වැසියාට ප්‍රේම කිරීම

ඉතිරි පණත් සත, අපගේ සහෝදර සහෝදරියන් වෙත අවධානය යොමු කෙරේ. ,ඔබට මෙන් ඔබේ අසල්වැසියාට ප්‍රේම කරන්න., යන ක්‍රිස්තුන්වහන්සේගේ පණතින් මේ පණත් ද ඉටුවේ.

**සතර වන පණතඃ**

**,නුඹේ පියාට ද, මවට ද ගෞරව කරව. එවිට නුඹේ දෙවියන් වහන්සේ නුඹට දෙන රටේ නුඹ බොහෝ කාලයක් ජීවත් වන්නෙහි ය, (නික්ම20ඃ12).**

මේ පණත අපගේ සබඳතා පිළිබඳව ය. දරුවන්ට තමන්ගේ දෙමාපියන් කෙරෙහි ඇති යුතුකම් සහ ඔවුන්ට ආදරය ගෞරව දැක්විම පිළිබඳ මේ පණත අපට විශේෂයෙන් මතක් කර දෙයි. විලකට ගලක් විසිකල විට දිය රැල්ල ක්‍රමයෙන් විශාල වී විහිදී යන චක්‍රයක් මෙන් අපගේ සම්බන්ධතා පවුලෙන් පටන් ගෙන ක්‍රමයෙන් පුළුල් වේ. පළමු සම්බන්ධතා ගොඩනැගෙන්නේ පවුල තුල බව නව ධර්මෝපදේශය අවධාරණය කරයි. පවුල තුළ ඇතිවන සවිමත් සබඳතා සමාජය තුල ඇතිවන සබඳතාවලට පදනමක් වේ.

දරුවාට පෞද්ගලික සංවර්ධනය ලැබීමේ පලමු අධ්‍යාපනයට මුල පුරන්නේ පවුල තුළ ය. දෙමව්පියෝ ඔවුගේ අති වැදගත් හා පලමු ගුරුවරු වෙති. එකිනෙකාගේ වගකීම් එකිනෙකාට සහයෝගය දැක්වීම ආදී සාංසික ජීවිතයට අවශ්‍ය ගුණධර්ම පලමුව ඉගෙන ගන්නේ පවුලෙනි. විශ්වාසයේ ජීවිතයටත්, යාච්ඤා ජීවිතයටත් මුල පුරන්නේ ද පවුල තුලිනි.

වැඩිහිටි භාවයට පත්වන දරුවෝ ක්‍රමයෙන් තම සබඳතාවල වර්ධනයක් ඇති කර ගනිති. සමාජයක ජීවත්වන සාමාජිකයන් ලෙස සමාජ සුභසිද්ධිය සඳහා වැයවීමට සේවය කිරීමට ඔවුහු බැඳීසිටිති. රටක ජීවත්වන රටවැසියන් ලෙස අය බදු ගෙවීමටත් තම නිදහස් ඡන්දය භාවිත කිරීමටත් රටේ ආරක්ෂාව සඳහා කටයුතු කිරීමටත් ඔවුහු බැඳීසිටිති.

**පස්වන පණතඃ**

**,මිනී නොමරව, (නික්ම 20:13).**

මේ පණතින් මිනිස් ජීවිතයේ පූජනීයත්වය ගෙන හැර පායි. දරුවෙකු පිළිසිඳුන මොහොතේ සිට ඔහුගේ මරණය දක්වා සෑම දෙනෙකුගේ ම ජීවිතය ඉතා උතුම් ය. අහිංසක පුද්ගලයෙකු නිරපරාදේ මරාදැමීම මිනිස් උදාරත්වයට විරුද්ධ බරපතල පාපයකි. මනුෂ්‍ය ජීවිතය පටන් ගන්නා මොiඥ/රිතේ සිට සැම දරුවෙකුටම ජීවත්වීමට අයිතියක් ඇත. ඒ නිසා ගබ්සා කිරීම පස්වන පණතට විරුද්ධ වූ පාපයකි. දරුවකු ඉපදීමට පෙර තාක්ෂණික වශයෙන් කරන පරීක්ෂණ සභාවේ ඉගැන්වීම්වලට පටහැනි නොවන්නේ, ඒවා කළල ජීවීත්වය  ආරක්ෂා කිරීමට හෝ එම කළල ජීවිතයට සුවය හා ආරක්ෂාව ලබා දෙන ඒවා වූවොත් පමණි. මෙම ප්‍රතිපත්තිය ම මිනිස් බීජාඅංකුර සඳහාත් යෙදේ. **(HUMAN ENBRIO)** අත්හදා බැලීම් සහ වෙනත් පරීක්ෂණ සඳහා මිනිස් බීජාංකුර භාවිත කිරිම මේ පණතට පටහැනි ය.

මනුෂ්‍ය ජීවිතයේ අවසානය උතුම් ය. ඒ නිසා ආබාධිත, රෝගී, මහලු හා මරණාසන්නවූ අයගේ මරණය ඉක්මන් කිරිම සඳහා යම් යම් දේ කිරිම මේ පණතට විරුද්ධ ය. එලෙසමජීවිතයට හානිකර බෙහෙත්වර්ග භාවිත කිරිම ද මේ පණතින් තහනම් කෙරේ. සාමාන්‍ය ස්වාභාවික වූ මරණයට පත් වීම මිස මරණය සිදුකිරීම සඳහා යම් යම් දේ කිරීම බරපතළ වරදකි. මනුෂ්‍යයෙකුගේ මරණයේ මොහොත දක්වා ම ඔහු ජීවත් කරවීමට හැම උත්සාහයක් ම දැරීම කාගෙත් යුතු කමකි. කළ හැකි සැම දෙයක් ම කර යමෙකුට ජීවත්කිරීමට නොහැකි බව දැනගත් පසු මැරෙනතුරු ඔහුට උපරිම උපකාර කර සැළකීම උතුම් සත්කාර්යයක් බව, නව ධර්මෝපදේශය පෙන්නුම් කරයි. අපගේ පෞද්ගලික සම්බන්ධතා ඉක්මවා යන හෙයින් සාමය සඳහා කටයුතු කිරීමට ද මේ පණතින් අපට නියම වේ. යුද්ධය පිටුදැකීමට ද, යුද්ධ උපකරණ නිපදවීම වැළැක්වීමට ද මේ පණතින් අපට උගන්වන තවත් දේවල් ය.

**හයවන පණතා:**

**,කාම මිත්‍යාචාරය නොකරව, (නික්ම 20:14).**

මරණය තෙක් එකිනෙකාට විශ්වාසවන්තව සිටීමට පොරොන්දුවන විවාහ බන්ධනයෙන් තම ජීවිතය කැපකරන යුවළකගේ සබඳතාව ශුදධ වූ ලෙස ගතකිරීමට මේ පණතින් අපට උගන්වයි. මේ පණත ව්‍රත ශුද්ධියෙන් තම විවාහ ජීවිතය ගත කරන ලෙසට විවාහ යුවලට ඇරයුම් කරයි. ජීවිතයේ එක එක තත්ත්වයන්ට විශේෂ වු ව්‍රත ශුද්ධියෙන් ජීවත් වීමක් ඇත.

ශුද්ධ අම්බ්‍රෝස්තුමා තුන් ආකාරයෙන් ව්‍රත ශුද්ධිය ගැන කථා කරයි. පළමුව විවාහ වු ස්ත්‍රී, පුරුෂ දෙදෙනා ද, දෙවැනි වැන්දඹුවන් ද, තෙවැනි කන්‍යාවන් ද විසින් පිළි පැදිය යුතු ව්‍රත ශුද්ධියයි.

විවාහ වන දෙදනොගේ ප්‍රේමයේ උතුම් ඵලය වන්නේ දරුවා ය. විවාහ යුවළකගේ විවාහක ක්‍රියාදාමය නිතරම ජීවිතය දානය කිරීම පරමාර්ථ කරගෙන විය යුතු ය.

මැවුම්කාර දෙවියන් වහන්සේගේ කැමැත්තට හා සැලැස්මට අනුව මේ පිළිබඳ සෑම පර්යේෂණයක් ම සිදුවිය යුතු ය. විවාහ වූ යුවළකට දෙමාපියන් වීමේ කාර්යය එකිනෙකාගේ මාර්ගයෙන් සිදුවිය යුත්තේ ය. වර්තමානයේ සිදුවන ලෙස වෙනත් මාර්ග වලින් දරුවන් ලබාගැනීම කිතුනු සභාව ප්‍රතික්ෂේප කරයි. විවාහ වූ ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේ වෛවාහක ක්‍රියාව දරුවන් ලබා ගැනීම සඳහා විද්‍යාව අනුව නොව ස්වාභාවික දේව සැලැස්ම අනුව සිදුවන්නක් බව මේ පණත අවධාරණය කරයි.

**සත්වන පණතඃ**

**,සොරකම් නොකරව, (නික්ම 20:15).**

මනුෂ්‍ය ශ්‍රමයේ ප්‍රතිඵල ද, මෙලොව ඇති වස්තු සම්පත් ආදිය සාධාරණව හා දයාවෙන් යුතුව පරිහරණය කිරීම ද මේ පණතින් නියම වේ. පෞද්ගලික වස්තු සම්පත්වල අයිතිවාසිකම රැක දීමත්, එලෙස ම මෙලොව ඇති සම්පත් සියල්ල මුළු විශ්වයේ වසන සෑම මිනිසෙකුට ම අයිති බව තහවුරු කිරීමත් මේ පණතේ පරමාර්ථය වන්නේ ය. පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳ සැලකිලිමත් වීම ද මේ පණතින් අපට මතක් කර දෙයි. මෙලෝ සම්පත් දෙවියන් වහන්සේගෙන් අපට ලැබී ඇත්තේ අපගේ ප්‍රයෝජනය සඳහා ය. ඒවා දූෂණය කිරීම මේ පණතට පටහැනි වේ.

සමාජ ධර්මය පිළිබඳව කිතුනු සභාවේ ඉගැන්වීම අනුව, විශේෂයෙන් 13 වන ලියෝ පොදු පියතුමා විසින් නිකුත් කරන ලද විශ්ව ලේඛනයෙන් කම්කරුවන්ගේ, එනම් වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් රැක දිය යුතු බව ද, ඔවුන්ගේ ආර්ථික ජීවිතය ගැන සැළකිල්මත් විය යුතු බව ද පෙන්වා දෙයි. සමාජ සාධාරණත්වය පිළිබඳ කිතුනු සභාවේ ඉගැන්වීම් රාශියක් එහි අඩංගු වේ.

**අටවන පණතඃ**

**,නුඹේ අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියව, (නික්ම 20:16).**

සත්‍යය සැඟවීම, අසත්‍ය දේ ප්‍රකාශ කිරීම මේ පණත තහනම් කරයි. බොරු කීම, කේලාම් කීම, බොරු චෝදනා කිරීම, බොරුවට දිව්රීම, ආදී පාප මේ පණතට විරුද්ධ වේ. සත්‍යය තුළ ජීවත් වීමටත්, ජීවිත මගින් සත්‍යයට සාක්ෂි දැරීමට ත්, අටවන පණතින් අප සෑම කැඳවන්නේ ය. සත්‍යවාදී නොවී කිසිවෙකුට සංසයක ජීවත් විය නොහැකි ය. සංසයක හෝ පවුලක ජීවත්වීමට සත්‍යවාදී බව හා එකිනෙකාට විශ්වාසවන්ත වීම ඉතා වැදගත් වේ. සත්‍යවාදී තැනැත්තා ප්‍රකාශ කළ යුත්තේ කුමක් ද, රහසක්ව තබාගත යුත්තේ කුමක් ද යන බව හොඳින් දනී. ඒ තැනැත්තා අවංක හා ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව කටයුතු කරයි.

සත්‍යය මත පදනම් වූ ප්‍රවෘත්ති දැන ගැනීමට සියළු දෙනාට අයිතිවාසිකමක් ඇත. සත්‍ය තොරතුරු දැන ගැනීමට ඉමහත් ආශාවක් දක්වන ජනතාවට ඔවුන්ගේ ඩීඳුයී/රත්වයට හා අයිතිවාසිකම් වලට නිසි ගෞරවය දක්වමින් සත්‍ය ප්‍රකාශ කිරීම ජනමාධ්‍යයේ වැදගත් යුතුකමක් වේ. ඒවාට ඇහුම්කන් දෙන ජනතාව ඔවුන්ට ප්‍රකාශ කරන ප්‍රවෘත්ති ගැන අවදිව සිටීමජි හා බොරු ප්‍රවෘත්ති ප්‍රකාශ කරන විට ඊට විරුද්ධව ක්‍රියාකාරීවීමට වගබලා ගත යුතු ය. අප ආලෝකවත් කර, අපගේ හෘද සාක්ෂිය, සමාජයීය සදාචාරාත්මක හා දේශපාලනමය ප්‍රශ්න කෙරෙහි සාධාරණ අවබෝධයක් ලාබ දීම, හරිමග යැවීම මාධ්‍යවේදින්ගේ යුතුකම වන්නේ ය.

**නව වෙනි හා දසවෙනි පණත්:**

**ිපරදාර ආලය නොකරවී අන්වස්තු ආශා නොකරව, (නික්ම 20:17).**

මේ පණත් දෙක බොහෝ දුරට සම්බන්ධ වන්නේ හදවතට යි. හොඳ නරක, ආශා හා අදහස් සෑම හදවතකින් ම පිටවන්නේ ය. මාංශික තෘෂ්ණා අභිබවා යනු සඳහා පිරිසුදු හදවතක් ඇතිව සිටීම වැදගත් බව 9 වෙනි පණත අපට උගන්වයි. තන්හාව ජය ගැනීම සඳහා සිතින් දිළිඳු වීම වැදගත් බව 10 වෙනි පණත පෙන්වා දෙයි. මේ පණත් දෙක අනිත් සියළු පණත් අනුව ජීවත් වීමට අනුබල දෙයි. පණත් ඉෂ්ට කිරීම හෝ කඩ කිරීම හෝ රඳා පවතින්නේ මනුෂ්‍ය කැමැත්ත මත ය.

නව ධර්මෝපදේශය උගන්වන අන්දමට, දස වන පණත හෘදයේ ආශා පිළිබඳ දේ ගැන උනන්දු වේ. නව වන පණත ව්‍යවස්ථාවේ අඩංගු සියළුම නීති කැටිකර දක්වයි.

දස පණත ,දෙවියන් වහන්සේ අපට ප්‍රේම කරන සේක., යන ජේසුස් වහන්සේගේ පණිවිඩය පිළිපැදීමට ඇති ආඥාව ද, ඔවුන් වහන්සේ අපට ප්‍රේම කළාක් මෙන් අප ද ඔවුන් වහන්සේට ප්‍රේමය දැක්විය යුතුය යන ගිවිසුම ද නැවත අපට මතක් කිරීමක් කරයි. ජෙරමියස් සහ එසකියල් යන දිවැසිවරු දෙදෙනා ම මේ පිළිබඳව පවසන්නේ මෙසේ ය. ඬඬඉශ්රායෙල් සෙනඟ හා බ්ජ්ඳුයී/ සෙනඟ සමග ද මා අලුත් ගිවිසුමක් කරන කාලය පැමිණෙන්නේ ය. ඉශ්රායෙල් සෙනඟ සමඟ මා කරන ගිවිසුම මේ ය. මම මාගේ අණ පණත් ඔවුන් තුළ පිහිටුවා එය ඔවුන්ගේ සිත් තුළ ලියන්නෙමි.

මම ඔවුන්ගේ දෙවියන් වහන්සේ වන්නෙමි. ඔවුහු මාගේ සෙනඟ වන්නෝ ය. මෙසේ පවසන්නේ ස්වාමින් වහන්සේ වන මම ය.ඬඬ (ජෙරමියා 31:31-33)

## දස පණතින් මතුවිය යුතු සාරධර්ම

### පළමුවන පණත

මුළු මහත් මැවිල්ල අගය කිරීම. මැවිල්ල තුලින් මැවුම්කරුවාණන් හඳුනා ගැනීම, මැවිල්ලට දේවත්වය ආරෝපණය නොකිරීම. මනුෂ්‍යයාගේ ඉරණම තීරණය කරන්නේ දෙවියන් වහන්සේ බව පිළිගැනීම. ප්‍රසිද්ධියේ දේව වන්දනාව පැවැත්වීම, දේව අභිමතය ඉටු කිරීම. අයහපතින් යහපත උදාකර ගැනීම, පවිත්‍ර අදහසින් යුතුව කටයුතු කිරීම, දේව මිත්‍රත්වය පවත්වා ගැනීම. සාන්තුවරයන්ට ගරු කිරීම, සාන්තුවර ආදර්ශ චරිතායනය කර ගැනීම. මරිය තුමියට විශේෂ ගෞරවයක් දැක්වීම.

### දෙවන පණත

දෙවිඳුන්ගේ නාමය ගෞරවයෙන් සැලකීම, දේව අපහාසයෙන් වැළකීම. දේවස්ථානයේ විනීත හැසිරීම, ප්‍රසාද නිධාන ගෞරවාකාරයෙන් ලබා ගැනීම, දේව සේවයට කැපවූ අයට ගරු කිරීම, දිව්රුම් පොරොන්දු කඩ නොකිරීම, බාරහාර නිසි ලෙස ඉටුකිරීම, බාරහාර වීමට පෙර ඒ ගැන ගැඹුරින් සිතා බැලීම.

### තුන්වන පණත

ඉරුදින දේව සේවය සහ ජනතා සේවය සඳහා යොදා ගැනීම ඉරුදින දේව මෙහෙයේ දේශනයට සාවධානව සවන් දීම, නුසුදුසු විනෝද ක්‍රීඩාවන්ගෙන් ඈත් වීම. කුසීතව කාලය නාස්ති නොකිරීම. දේව සබඳතා වර්ධනය කර ගැනීම, සබත් දිනය පිළිබඳ ක්‍රිස්තු ආදර්ශය චරිතායනය කරගැනීම, නිසි ලෙස උපවාස ශීලය ආරක්ෂා කිරීම. උපකාර ආධාර අවශ්‍ය අය වෙනුවෙන් පරිත්‍යාග කිරීම.

### හතරවන පණත

සාමුහික සහජීවනයට සම්බන්ධ වීම, පොදු යහපත සඳහා ක්‍රියා කිරීම. පවුලේ ගෞරවය ආරක්ෂා කිරීම. වැඩිහිටියන්ට ගරු බුහුමන් දැක්වීම.

මහළු වියට පත් අයට ආරක්ෂාව සැලසීම. පවුල තුළ අන්‍යෝන්‍ය සේවයට මුල් තැන දීම. තම නිදහස නිසි ලෙස භාවිත කිරීම. යහපත් මිතුරන් ඇසුරු කිරීම සැම දෙනාම ක්‍රිස්තුන් වහන්සේ තුළ සහෝදරයන් මෙන් සැලකීම. ශ්‍රේෂ්ඨයන්ට ගරු කිරීම. නීතිගරුක රාජ්‍ය පාලකයන්ට කීකරුවීම. පොදු නීතියට අවනත වීම සහා පාලකයන්ට ගරු කිරීම සහ පිළිගැනීම, අන් අයගේ ගැලවීමේ කාර්යයට සහාය වීම.

**පස්වන පණත**

තම සෞඛ්‍යය ආරක්ෂා කරගැනීම, තම ශරීරයද ජීවිතයද ශුද්ධවත් ලෙස සැලකීම, යෝග්‍ය ආකාරයට විවේකය සහ විනෝදය ලැබීම. පරිසරය සුරැකීම, පරිසරය දූෂණය නොකිරීම, තම මානසික ශක්තීන් සහ බුද්ධි ප්‍රභාව අන් අයගේ යහපත සඳහා යොදා ගැනීම, අලසකමින් සහ නොසැලකිල්ලෙන් කටයුතු නොකිරීම, සුදුසු ජීවනෝපායක යෙදීම, වැඩ කිරීම තුලින් දේව මහිමය ප්‍රකාශ කිරීම, ස්ව ත්‍යාජයට යොමුවීම මගින් විනයානුකූලව ජීවත් වීම, චරිත ඝාතනය නොකිරීම, ශාරීරික පුණ්‍ය ක්‍රියාවල නිරත වීම, පළිනොගැනීම, අසල්වාසීන් කෙරෙහි සංවේදීව ක්‍රියා කිරීම.

**හයවන හා නවවන පණත්**

ස්ත්‍රීන් සහ පුරුෂයන් විනීතව හැසිරීම, සැම දෙනාම තම සොහොයුරන් හෝ සොහොයුරියන් ලෙස සැලකීම, චපල පෙම් බැඳීම්වලින් ජීවිතය කිළිටි කර නොගැනීම, සුදුසු ඇඳුම් පැළඳුම් භාවිතය සංවරයෙන් යුතු කතාබහ, චරිත පාරිශුද්ධිය ඉතා උතුම්කොට සැලකීම, දූෂිත විලාසිතාවලට වහල් නොවීම, අසැබි පොතපත අයහපත් මිතුරන්, අසභ්‍ය දර්ශන ප්‍රතික්ෂේප කිරීම.

**හත්වන හා දහවන පණත්**

සාධාරණ ලෙස වස්තුව ලබා ගැනීම, ලෞකික වස්තුව පොදු යහපත සඳහා යොදා ගැනීම, දිළිඳුකම තුලින් උදාකරගත හැකි භාග්‍යය අගය කිරීම. අන් අයගේ වස්තුවට ගරු සැලකිලි දැක්වීම. ආත්මාර්ථකාමී නොවීම. තමාට අයිති නැති වස්තුවක් අයිතිකාරයා සොයා දීම. හිමිකරුවා සොයාගත නොහැකි වස්තුව පොදු යහපත සඳහා දීම. අනුන්ගේ වස්තුවට යම් හානියක් සිදුවුවහොත් එම පාඩුව පිරිමැසීම.

**අටවන පණ**

සත්‍යවාදීතාවය අගය කිරීම, විනෝදය සඳහා හෝ බොරු නොකීම, සමාජය තුළ විශ්වාසනීයත්වය තබා ගැනීම, රහස් ආරක්ෂා කිරීම. තමන්ගේ හොඳ නම රැක ගැනීම. කේලාම් කීමෙන් වැළකීම. අපරීක්ෂක විනිශ්චය නොකිරීම. අනුන් උපහාසයට ලක් නොකිරීම. තමා කළ වරද කමා කරවා ගැනීම.

**තවත් සාරධර්ම කීපයක්**

* අනුන් විනිශ්චය නොකරන්න.

* අනුන් වරදට පත් නොකරන්න.

* සමාව දෙන්න.

* අන්ධයකුට මඟ පෙන්වීමට අන්ධයකුට හැකි ද?

* ගෝලයා ගුරුවරයාට වඩා උසස් නොවේ.

* ඔබගේ ම ඇසෙහි ඇති ලී කොටය නොබලා සහෝදරයාගේ ඇසෙහි තිබෙන ලී කුඩ සොයන්නේ මන්ද?

* නරක පල දෙන හොඳ ගසක්වත්, හොද පල දෙන නරක ගසක්වත් නැත.

* මිනිස්සු කටු ගස්වලින් අත්තික්කා පල නෙලා නොගනිති.

* ගොකටු පඳුරකින් මිදිපල කඩා නොගනිති. ය සිතෙහි උතුරා යන දෙය කටින් පිටවේ.

* දැහැමි අනුශාසනා අසා ඒවා පිළිපදින, ඒ අනුව ජීවත්වන තැනැත්තා, ගැඹුරට පොළොව කැණ, පර්වතයක් මත අත්තිවාරම දමා ගෙයක් සෑදූ මිනිසකුට සමාන ය.

* ජල ගැල්මක් පැමිණ සැඩ පහර ඒ ගෙට ගැසූ නමුත් එය මනාසේ ඉදිකොට තිබුණු බැවින් සොලවන්නට නොහැකි විය.

එහෙත් දැහැමි අනුශාසනා නොතකා ජීවත්වන්නා, අත්තිවාරමක් නැති බිමෙහි ගෙයක් තැනූ මිනිසකුට සමාන ය. සැඩ පහර ඒ ගෙට ගැසී ය. එවෙලේම එය ඇද වැටුණේ ය. එහි විනාශය ද භයංකර ය. (ලූක් 6:20-49)

## කතෝලික අනන්‍යතාවය

විවිධ ක්‍රිස්තියානි සභා දස දහස් ගණනක් දැනට ලෝකයේ ව්‍යාප්තව තිබේ. එවන් සභා බොහොමයක් අන්තවාදී මූලධර්ම වාදී ව්‍යාපාරයන් වශයෙන් හැඳින්විය හැකිය. ක්‍රිස්තුන් වහන්සේ ආරම්භ කළ ඔවුන්

වහන්සේගේ සභාවේ නොවෙනස් මූලාශ්‍රයක්ව ඇත්තේ කතෝලික සභාව පමණ ය.

# IV ඒකකය - යාච්ඤාවේ ජීවිතය

## විෂය විස්තරය

අප දෙවියන් වහන්සේගේ දරුවන් නිසා, දෙමාපියන් සමග දරුවන් කථා කරන්නා සේ අපට දෙවියන් වහන්සේ සමග කථා කළ හැකිය. ,ඔබ පුත්‍රයන් බව සනාථ කිරීමට පියාණන් යයි අප හදවත් තුළ හඬ නඟන්නා වූ තම පුත්‍රයාණන්ගේ ආත්මයාණන් එවා වදාළ සේක,' යි පාවුළු තුමා ගලාතිවරුන්ට ලියා යැව්වේ ඒ නිසා ය.

දෙවියන් වහන්සේට යාච්ඤා කිරීමට අවස්ථාව ලැබීම අප ලබන මහත් වරප්‍රසාදයකි. එමගින්, අප දෙවියන්වහන්සේ විසින් ප්‍රේම කරනු ලබන දරුවන් මෙන් ඔවුන් වහන්සේ සමග කථා කිරීමට අපට අවකාශ ලැබේ.

යාච්ඤා කිරීම අපේ යුතුකමක් ද වන්නේ ය. දෙවියන් වහන්සේ අපගේ ස්වාමියාණෝ ය, පියාණෝ ය. ප්‍රසාද ස්නාපනය මාර්ගයෙන් අපි යාච්ඤා කිරීම සඳහා කැඳවීම ලබා ඇත්තෙමු.

දෙවියන් වහන්සේගේ අති උතුම් මහිම ප්‍රතාපය ගැන අපි ඔවුන් වහන්සේට ගෞරවයත් ප්‍රශංසාවත් පිදිය යුත්තෙමු. පව්කළ විට කමාව අයදිමු. ප්‍රධාන වැඩ පටන් ගැනීමේ දී දේව සහාය පතමු. දුර්පරීක්ෂාවේ දී ශක්තිය පතමු. නොකඩවා යාච්ඤා කරන්න,' යි පාවුළු තුමා කියන්නේ ඒ නිසා ය.

යාච්ඤා කළ යුතු විශේෂ අවස්ථා ඇත්තේ ය. අළුයම නින්දෙන් අවදි වූ විට ද, රාත්‍රියෙහි නින්දට යනවිට ද, ආහාර ගැනීමට පෙර සහ පසු ද, දේව මෙහෙයයන් හිදී ද අප යාච්ඤා කල යුතු ය.

අප දෙව්පියාණන්ටත්, පුත්‍රයාණන් වන ක්‍රිස්තුන් වහන්සේටත් ශුද්ධාත්මයාණන්ටත් යාච්ඤා කළ යුතු ය. අප වෙනුවෙන් මැදහත් වන ලෙස මරිය මාතාවන්ට ද, සාන්තුවරයන්ට ද, දේවදූතයන්ට ද යාච්ඤා කිරීම අවශ්‍ය ය.

අපගේ යාච්ඤාවල දී අසල්වාසීන් ජීවතුන් සහ මළාවුන් මිතුරන් සහ සතුරන්, අප හා කිට්ටු සම්බන්ධය ඇති පුද්ගලයන් පවුලේ සියලුම සාමාජිකයන්, රෝගීන්, මරණාසන්න වූවත්, සභා පාලකයන්. රටේ පාලකයන් ගැන මෙන්ම පව්කාරයන්, අන්‍යාගමිකයන් ද අප සිහිකළ යුතු ය. එසේම ලෝක සාමය වෙනුවෙන් ද යාච්ඤා කිරීමට අමතක නොකළ යුතු ය.

**පුරාණ ගිවිසුමේ යාච්ඤාවඃ**

බයිබල ගිලවීමේ ඉතිහාසය ආරම්භයේ දී ආබ්‍රහම්තුමාගේ ජීවිත කථාව ගැන අපට අසන්නට ලැබේ. යාච්ඤා ජීවිතයේ වර්ධනයක් දක්වන ජීවිතයක් සැටියට අපට එය හැඳින්විය හැජි!ජීඥගක. තමා ජීවත් වූ දේශයත්, තම ගෘහයත්, තමා සන්තක සියළු සම්පත් පවා අත්හැර දෙවියන් වහන්සේ විසින් පෙන්වන දේශයකට යාමට දෙවියන් වහන්සේ ඔහුට ආරාධනා කළ සේක. එවිට ඞඥජු දුන්නේ යාච්ඤාමය පිළිතුරකි. එතුමා කීකරු කමින්, දේවාරාධනයට පිළිතුරු දීමට නිතර ම සූදානම්ව සිටියේ ය. ඔහුගේ පිළිතුරට වචන නොමැති විය. එය නිශ්ශබ්දතාවයෙන් දුන් පිළිතුරකි. නව ධර්මෝපදේශය ප්‍රකාශ කරන අන්දමට, හෘදයට අවධානය යොමු කිරීමකි.

කල් යත් යත් ආබ්‍රහම් තුමා දෙවියන් වහන්සේ හා සමග ඉතා කුළුපග විය. මාම්රේ නැමැති ස්ථානයේදී ඔහු ඔවුන් වහන්සේ අමුත්තෙක් සැටියට පිළිගත්තේ ය. සොදොම් සහ ගොමෝරා යන නගර විනාශ කිරීමට යන බව අසා දෙවියන් වහන්සේ සමග දීර්ඝ සාකච්ඡාවක යෙදී ඔහුගේ ඉල්ලීම අසාර්ථක වුවත් ඒ නගර දෙක විනාශ නොකරන ලෙස ඔවුන් වහන්සේගෙන් අයැදී ය.

මෝසෙස් තුමා යාච්ඤා ජීවිතයක් ගත කළ පුද්ගලයකු හැටියට පුරාණ ගිවිසුමේ දකින්නට ලැබෙන තවත් උදාහරණයකි. තම ජනතාව ඊජිප්තු දේශයේ වහල්කමින් මුදවා ගැනීමට දෙවියන් වහන්සේ මෝසෙස් තුමා කැඳවූ සේක. නො දැවෙන පඳුරේ සිද්ධිය මගින් දෙවියන් වහන්සේ මෝසෙස් තුමාගේ යාච්ඤාවට සවන් දී ඔවුන් වහන්සේ කවරෙකු දැයි ඔහුට එළිදරව් කළ සේක. පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේ හා සමග ඉතා කිට්ටු සබඳතාවක් ඇති කරගත් පුද්ගලයා මෝසෙස් තුමා බව දැක්වීම නිවැරදිය. නික්මයාම පොතේ මෙසේ සඳහන් වේ. ,ස්වාමි වූ දෙවියන් වහන්සේ මෝසෙස් තුමා සමග මුහුණට මුහුණලා කථා කළ සේක,

(නික්මයාම 33:11). මෝසෙස් හා දෙවියන් වහන්සේ අතර කිට්ටු සබඳතාව මගින් භාවනාත්මක යාච්ඤාව කුමක් දැ. යි අපට පැහැදිලි කර දෙයි.

මේ පුද්ගලයන් හැරුණු විට මුළු ඉශ්රායෙල් ජනතාවගේ ජීවිත වලට යාච්ඤාව කොතෙක් දුරට බලපා තිබේ දැ. යි පුරාණ ගිවිසුම අපට පෙන්වා දෙයි. යාච්ඤාවේ ශ්‍රේෂ්ඨතම කෘතිය වන ,ගීතාවලිය, මේ ජනතාවගෙන් අපට ලැබුණේ ය.

ගීතාවලිය පෞද්ගලික යාච්ඤාව හා සාංඝික යාච්ඤාව යන දෙවර්ගය ඉදිරිපත් කරයි. දේව ජනතාවගේ ඉතිහාසයත්, රචනා කරන ලද පුද්ගලයන්ගේ විවිධ අත්දැකීම් ආදියත් ගීත තුළ ගැබ්වී ඇත. ගීතාවලියේ සංගීත ගායනා කිරීමේ දී අපි දෙවියන් වහන්සේට ඇහුම්කන් දෙමු. එලෙස ම අපි ඔවුන් වහන්සේ සමග කථා කරමු. ඉශ්රායෙල් ජනතාව ගැයූ ඒ සංගීත ඉතා සරල ය. ස්වභාවික ය. මිනිස් හැඟීම් කදිමට ප්‍රදර්ශනය වේ. ප්‍රශංසාව, තුති දීම, ප්‍රමෝදය, භය, තරහ, දුක, සතුට, කළකිරීම ආදිය ගීත තුළ අඩංගු මිනිස් හැඟීම් ය.

කිතුනු සභාවේ නිල යාච්ඤාව සඳහා ගීතාවලිය භාවිත කරයි. සංගීත ගායනා කරන විට, කිතුනු සභාවේ සාමාජිකයන් හැටියට අපි සාංඝිකව ගායනා කරමු. සභාව තුළ දුක් විඳින, ප්‍රීති සංතෝෂ වන කිතුනු ජනතාව සමග එකට එක්වී ගායනා කරමු. මෙයාකාරයෙන් ගීතාවලියේ ඇති සංගීත, මුළු කිතුනු සභාවේ සිටින සියළු ම සාමාජිකයන් සමග එක්වී අපි ගායනා කරමු. සියළු දෙනාම සහෝදර සහෝදරියෝ යන ගැඹුරු හැඟීම ඇතිකර ගනිමු.

**නව ගිවිසුමේ යාච්ඤාවඃ**

**සුවිශේෂඃ** විශේෂයෙන් ලූක් තුමාගේ සුවිශේෂය ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළේ කෙසේ ද කියාත්, අපට යාච්ඤා කිරීමට ඔවුන් වහන්සේ ඉගැන්වූයේ කෙසේ ද කියාත් පෙන්වා දෙයි. ජනතාව කෙතරම් බලපෑම් කළත් ඔවුන් වහන්සේ නිතර ම හුදකලා ස්ථානයකට ගොස් යාච්ඤා කළ සේක. සමහර අවස්ථාවල දී මුළු රාත්‍රිය ම යාච්ඤාවෙන් ගත කළ සේක. බොහෝ අවස්ථාවල දී තමන් වහන්සේ ප්‍රකාශ කළ, පියාණන් වහන්සේගේ රාජ්‍යය

මෙලොව පිහිටුවනු සඳහා පියාණන් වහන්සේ සමග දැඩි භාවනාවක යෙදුන සේක.

ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේ ජීවිතයේ සහ දූත කාර්යයේ වැදගත් අවස්ථාවල දී දීර්ඝ වූ සහ ගැඹුරු වූ යාච්ඤාවක යෙදුන සේක. ඔවුන් වහන්සේ ස්නාපනය ලැබීම. ශ්‍රාවකයන් දොළොස් දෙනා තෝරා ගැනීම, අන්‍ය රූප විලාශවීම, සහ ඔවුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය යන අවස්ථාවල දී විශේෂ අන්දමින් යාච්ඤා කළ සේක. ලූක් සුවිශේෂයේ 11 වන පරිච්ඡේදයේ ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළ ආකාරය සිත් කාවදින ලෙස ඉදිරිපත් කරයි. ක්‍රිස්තුන් වහන්සේ එක්තරා අවස්ථාවක යාච්ඤා කරමින් සිටි සේක. යාච්ඤා කර අවසන් වූ පසු ශ්‍රාවකයෙක් ඔවුන් වහන්සේ වෙත පැමිණ, ,ස්වාමිනී අපට යාච්ඤා කිරීමට ඉගැන්වුව මැනව, යි කීය. මෙහි දී අපට පෙනී යනුයේ යාච්ඤා කරමින් සිටි ජේසුස් වහන්සේට කරදර කිරීමට ඔවුන් අකමැති වූ බව ය. ඔවුන් වහන්සේ ඉතා ගැඹුරු යාච්ඤාවක යෙදී සිටින අයුරු දුටු ගෝලයන්ගේ හදවත් පුබුදු විය. ක්‍රිස්තුන් වහන්සේ තුළ දක්නට ලැබුණු මේ ගැඹුරු සම්බන්ධතාවයේ අත්දැකීම ඔවුන්ටත් ලබා ගැනීමට ඔවුහු ඉතා ආශා වූහ.

ක්‍රිස්තුන් වහන්සේගේ යාච්ඤාවේ සෑම අත්දැකීමක් ම ප්‍රීතිය දනවන ඒවා නොවී ය. දුක්ප්‍රාප්තියේ දී ඔවුන් වහන්සේ කළ යාච්ඤාව පිළිබඳව හෙබ්‍රව්වරුන්ට ලියූ සංදේශයේ මෙලෙස සඳහන් වේ. ,ක්‍රිස්තුන් වහන්සේ මිනිසත් බව ගෙන සිටිය දී තමන් මරණයෙන් ගලවා ගන්නට පිළිවන් වූ තැනැන්වහන්සේට බලවත් හැඬීමෙනුත්, කඳුළු සැලීමෙනුත් යාච්ඤා ද, කන්නලව් ද ඔප්පු කළ සේක. ඔවුන් වහන්සේගේ දේව ගරුත්වය නිසා දෙවියන් වහන්සේ එයට සවන්දුන් සේක, (හෙබ්‍රව් 5:7). සුවිශේෂවල ක්‍රිස්තුන් වහන්සේ ගෙත්සමනී උද්‍යානයේ කළ යාච්ඤාව සිත් බඳනා ආකාරයෙන් ඉදිරිපත් කරයි. විඳින්නට යන විචිද්‍ර දුක් වේදනා වලින් නිදහස් කරන ලෙස ඉල්ලා යාච්ඤා කරන ඔවුන් වහන්සේ පියාණන් වහන්සේගේ කැමැත්තට සම්පූර්ණයෙන්ම අවනත වන බව තරයේ ම කියා සිටින සේක.

ශ්‍රාවකයින් යාච්ඤා කිරීමට උගන්වන්නැ. යි කී විට ඔවුන් වහන්සේ ඒ ඉල්ලීම ඉතා බැරෑරුම් ලෙස පිළිගත් සේක. තමන් වහන්සේගේ දූත කාර්යයේ වැදගත් ම උත්සාහය වූයේ දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර වූ සම්බන්ධතාව නිසිලෙස පවත්වාගෙන යාමට උදව් වීම ය. යාච්ඤාව ගැන ඉගැන්වීමේ දී ඔවුන් වහන්සේ තදින් අවධාරණය කළේ සිත් හැරීමේ ඇති අවශ්‍යතාව වේ. නව ධර්මෝපදේශය උගන්වන ආකාරයට. ,අපගේ හෘදය දෙවියන් වහන්සේගෙන් දුරස්ව පවතීනම් අප කරන යාච්ඤා නිශ්ඵල ය., අපගේ සහෝදර සහෝදරියන් හා සමගි වීම, අපගේ සතුරන්ට ප්‍රේමය දැක්වීම, අපට පීඩා කරන්නන් වෙනුවෙන් යාච්ඤා කිරීම, අන්‍යයන්ට සමාව දීම ආදිය පූර්ණ වූ යාච්ඤාව සඳහා සුදුසුකම් වේ.. දෙවියන් වහන්සේගේ යහපත්කම කෙරෙහි විශ්වාසය, දෙවියන් වහන්සේ අපගේ හෘදයන් තුළට වැඩම කිරීම ගැන අවදිව සිටීම, ඔවුන් වහන්සේගේ දූ පුතුන්ගේ එඩිතර බව ආදිය යාච්ඤාවේ වැදගත් අංග වේ.

ක්‍රිස්තුන් වහන්සේගේ මෑණියන් වන මරිය තුමියගේ යාච්ඤාව ගැන ද නව ගිවිසුම සඳහන් කරයි. ඇගේ යාච්ඤාවේ විශේෂ අංගයක් වූයේ සිය ගැලවීමේ කාර්ය භාරය කොන්දේසි විරහිතව විශ්වාසයෙන් දේව කාර්යයට යටත් කිරීම ය. දෙවියන් වහන්සේ පුහු වටිනාකම් සහ බලවත් අය සිය ආසන වලින් පහකර, දිළිඳු වූ සහ බැහැපත් වූවන් උසස් කර ඔවුන් දේව රාජ්‍යයේ උරුමකාරයින් වන බව ප්‍රකාශ කළ සේක. සාමය හා සාධාරණකම ලොවෙහි රජකරවන බවත් සිය උදාන ගීයෙන් ගැයුවා ය.

**<u>යාච්ඤාව පිළිබඳ විශේෂ ඉගැන්වීම්</u>**

ශ්‍රාවකයන්ගේ ඉල්ලීම අනුව ස්වාමීන් වහන්සේ ඔවුන්ට ඉගැන්වූ යාච්ඤාව පිළිබඳව ඉදිරියේදී සවිස්තරව කරුණු ඉදිරිපත් කෙරේ. දැන් ලූක් සුබාරංචියෙන් ගත් මේ උපුටනය අධ්‍යයනය කරන්න. (ලූක් 11ඃ 1 -13) ,ඔවුන් වහන්සේ ශ්‍රාවකයන්ට කථා කරමින් ඔබ අතර මිතුරකු ඇති කෙනෙක් මහ රෑ ඔහු වෙත ගොස්, .මිත්‍රය, මට රොටි තුනක් දෙන්න. ගමනක් යන මාගේ මිත්‍රයෙක් මා වෙත අවුත් සිටියි. ඔහුට දෙන්නට මා ළඟ කිසිවක් නැතැ. යි කියන්නේ නම්, ගේ ඇතුළේ සිට ඒ මිතුරා උත්තර

දෙමින්, .මට කරදර නොකරන්න. දැන් දොර වසා තිබේ. මාගේ දරුවෝ ද මා සමග ඇඳේ නිදා සිටිති. නැඟිට යමක් ඔබට දෙන්නට නොහැකි ය. යි කියයි ද? මම ඔබට මෙය කියමි. ඔහු සිය මිත්‍රකම සලකා ඔහු ඉල්ලන දේ ඔහුට නො දෙතත් ඔහුගේ ලජ්ජා නැති පෙරැත්තය නිසා නැඟිට, උවමනා පමණ ඔහුට දෙනු ඇතැ. යි වදාළ සේක. මම ද ඔබට කියමි. ඉල්ලන්න ඔබට දෙනු ලැබේ. සොයන්න ඔබට සම්බ වේ. තට්ටුකරන්න ඔබට දොර අරිනු ලැබේ. මන්ද ඉල්ලන සැමට ම ලැබේ. සොයන්නාට සම්බ වේ. තට්ටු කරන්නා දොර හරිනු ලැබේ. ඔබ අතරෙන් කවර පියෙක් තම පුත්‍රයා මාලුවකු ඉල්ලුවිට මාලුවා වෙනුවට දිය නයකු දෙයි ද? නොහොත් බිත්තරයක් ඉල්ලුවිට ඔහුට ගෝනුස්සකු දෙයි ද? මෙසේ අයහපත් වූ ඔබ ඔබේ දරුවන්ට යහපත් දේ දෙන්නට දන්නාහු නම්, ඊට කොපමණ වැඩියෙන් ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ, තමන් වහන්සේගෙන් ඉල්ලන්නන්ට ශුද්ධාත්මයාණන් නො දෙන සේක් ද?,

**<u>සභා ජීවිතය තුළ යාච්ඤාව</u>**

යාච්ඤාවෙන් ලැබෙන සම්පත් හා යාච්ඤාව පිළිබඳ වැදගත් අත්දැකීම් රාශියක් ඇතුළත් ඉගැන්වීම් ද සභාරම්භයේ සිට යුගයෙන් යුගයට පැමිණියේ ය. වනවාසි තාපසයින්ගේ භාවනාත්මක යාච්ඤාව, සභා පියවරුන්ගේ යාච්ඤා පිළිබඳ ලේඛන 12 වන ශත වර්ෂයේ ලියවුණු සිස්ටර්ෂන් පියවරුන්ගේ යාච්ඤා පිළිබඳ ලිපි ලේඛන ආදිය මෙයට හොඳම උදාහරණ වේ. ක්‍රිස්තියානි යාච්ඤාව ගැන විමසා බැලීමේ දී විවිධ මාර්ග වලින් අප දෙවියන් වහන්සේ කරා යොමුවන බව පෙන්නුම් කළ හැකි ය.

ක්‍රිස්තියානි යාච්ඤා හැමෙකක් දෙස බැලීමේ දී, දෙවියන් වහන්සේ කෙරෙහි යොමුවිය යුතු පොදු ආකල්ප හතරක් ඇති බව පෙනේ.

**1 ප්‍රශංසාවඃ**

දෙවියන් වහන්සේගේ මහිමය ගැන ප්‍රශංසා කිරීම ය. එනම් දෙවියන් වහන්සේ විසින් කරන ලද දේ ගැන නොව, දෙවියන් වහන්සේ දෙවියන් වහන්සේ වන නිසා අපි ප්‍රශංසා කරමු.

**2 තුතිදීම:**

දෙවියන් වහන්සේගේ මැවීමේ හා ගැලවීමේ ක්‍රියාවලියට තුති දීම.

**3 යැදුම:**

දේව මැවිල්ල වූ අප ඔවුන්වහන්සේගේ හස්තයේ මුළුමනින් ම යැපෙන බවත්, ඔවුන් වහන්සේට ණය ගැති බවත්, ඔවුන්වහන්සේ සර්ව සම්පූර්ණ බවත් පිළිගැනීම ය.

**4 මැදිහත් යැදුම:**

අන් අය වෙනුවෙන් කරන යාච්ඤාව වේ. මේ නිසා අපි අන් අය තුළින් දෙවියන් වහන්සේට සම්බන්ධ වෙමු. සාන්තුවරයන්ගේ සමෝස ධර්මලාභයේ පංගුකාරයෝ වෙමු.

කිතුනු සභාවේ සහ යාච්ඤාවේ සම්ප්‍රදායන්ට අනුව අප ආමන්ත්‍රණය කරන්නේ දෙව් පියාණන්ටත්, ශුද්ධාත්මයාණන්ටත් ය. ජන වන්දනාවේ අපේ යාච්ඤා අවසාන වන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින් ශුද්ධාත්මයාණන් තුළ දෙව් පියාණන් වහන්සේට ය. ප්‍රසාද ස්නාපනය මගින් අප දේව ජීවිතයට ඇතුළු වූ පසු, අපට යාච්ඤාවේ ගුරුවරයා වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ ය. පියාණන් හා පුත්‍රයාණන් විසින් අප වෙත ශුද්ධාත්මයාණන් එවන ලද්දේ යාච්ඤා මාර්ගයේ අප ගෙන යාමට ය.

**යාච්ඤාවේ ජීවිතය :**

යාච්ඤාව, දෙවියන් වහන්සේ හා සම්බන්ධ වූ ජීවිතයකි. නවතාවකට පත්කරන ලද ජීවිතයක් තුළ ජීවත් වීමකි. අප නිතර ම යාච්ඤා කළ යුතු ය. මින් අදහස් කරන්නේ නිතරම වාචිකව යාච්ඤා කිරීම නොවේ. යාච්ඤා මගින් දෙවියන් වහන්සේ වෙත යොමු වූ ජීවිතයක් ගත කිරීම ය. යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීමට නම් අප දේවාභිමුඛයෙහි ජීවත්වන බව සිහි තබා ගත යුතු ය. විශේෂ අවස්ථාවල හා නියමිත වෙලාවල යාච්ඤාවේ යෙදීමෙන් යාච්ඤාවේ පරිසරයක ජීවත්වීමට අපට ආධාර වෙයි.

ක්‍රිස්තියානි සම්ප්‍රදායන්, තුන් ආකාරයකට යාච්ඤා කළ හැකි බව පෙන්වා දෙයි. වාචික යාච්ඤාව, භාවනාත්මක යාච්ඤාව, චෛතසික යාච්ඤාව ආදිය යි.

**වාචික යාච්ඤාව**

මනුෂ්‍යයා ආත්මික හා ශාරීරික නිසා ආත්මයෙන් ද, ශරීරයෙන් ද දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ යුතු ය. වාචික යාච්ඤා අතරින් ජන වන්දනාවේ නිල යාච්ඤාව ප්‍රධාන වේ. ජන වන්දනාමය යාච්ඤාව කිතුනු සභාවේ යාච්ඤාවයි. දේව ජනතාව එකට එකතු වී යාච්ඤා කිරීමයි. දෙවියන් වහන්සේ ගෙන් බැහැර වූ සිතින්, නිතර නිතර උච්චාරණය කිරීමෙන් පමණක් යාච්ඤා කිරීම නිෂ්ඵල ය.

**භාවනාත්මක යාච්ඤාව**

භාවනාව යනු, දෙවියන් වහන්සේගේ කැමැත්ත සොයා බැලීම ය. අප එකිනොකාගෙන් ඔවුන් වහන්සේ බලාපොරොත්තු වන්නේ කුමක් ද? අප එකිනෙකා ඊට දිය යුතු පිළිතුර කුමක් ද යන්න භාවනාත්මකව සොයා බැලීම ය. මේ සඳහා ගැඹුරින් සිතීමත්, අවධානයත්, අධිෂ්ඨානයත් අත්‍යවශ්‍ය ය. මේ භාවනාවට උදව් පිණිස ආගමික පොතක්, බයිබලය, යම්කිසි ප්‍රතිමාවක් හෝ භාවනාව සඳහා පෙරදිග රටවල භාවිත කරන යම්කිසි සංකේතයක් භාවිත කළ හැකි ය.

භාවනාව විවිධ ආකාරයකින් කළ හැකි ය. දේවාභිමුඛයෙහි සිටිමින් ඔවුන් වහන්සේ වෙත අපගේ ගත, සිත, හදවත යොමු කළ හැකි එකිනෙකාට සුදුසු ක්‍රමයක් සොයාගත හැකි ය. එම භාවනාව මගින් වඩ වඩා ක්‍රිස්තුන් වහන්සේට සමාන වීමට අප කැඳවන, ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරිත්වයට වඩ වඩා විවෘත වීම මෙහි දී වැදගත් වෙයි. භාවනාමය යාච්ඤාව යොමුවිය යුත්තේ, ..ස්වාමිනී, මා කුමක් කරනවාට ඔබ කැමති සේක් ද?.. යන ප්‍රශ්නයට පිළිතුරු දීමට ය. ශු. බයිබලයේ කොටසක්, ජපමාලය කීම, වෙනත් ආගමික පොත් පත් භාවිත කිරීම භාවනාවට උපයෝගී කරගන්නා තවත් දේවල් වේ.

**සිතෙන් හෙවත් හදවතෙන් කරන යාච්ඤාව (චෛතසික යාච්ඤාව) :**

.හදවතෙන් කරන යාච්ඤාව.. යන්න මීට වඩා සුදුසු ය. මේ යාච්ඤාව මගින් අපගේ කල්පනා, වචන, සිතුවිලි සියල්ලක් ම පසෙක ලා, දෙවියන් වහන්සේ අත්දකිනු සඳහා, මුළු හදවතින් ම අපි ගැඹුරු සංවාදයක යෙදෙමු. මෙය නික්මෙන්නේ සිතින් නොව හදවතින් ය. මානසික ලෙස නොව ප්‍රේමය මගින් අපි දෙවියන් වහන්සේ ගැන දැනගන්නෙමු. අත්දකින්නෙමු. ක්‍රිස්තුන් වහන්සේ දෙස අප සිත් ඉතා අවධානයෙන් හා ප්‍රේමයෙන් බලාසිටීම භාවනාවයි. ඊට වචන, ක්‍රියා අදහස් අවශ්‍ය නැත. දෙවියන් වහන්සේ ඉදිරියෙහි නිශ්චලව හා නිශ්ශබ්දව සිටීම පමණක් සෑහෙයි. ට්‍රැපිස්ට් තාපසයකු වූ තෝමස් මර්ටන් තුමා භාවනාත්මක යාච්ඤාව පිළිබඳ පොත් කීපයක් ලියා ඇත.

**යාච්ඤා කිරීමේ දී ඇතිවන දුෂ්කරතා:**

සුවිශේෂයේ වටිනාකම් අනුව ජීවත් වීම කිතුනුවන්ට පහසු කාර්යයක් නොවේ. මේ පොරබැදීම යාච්ඤා ජීවිතය තුළින් පිළිබිඹු වේ. ..යාච්ඤා කරමින් ජීවත් වන්න. ජීවත් වෙමින් යාච්ඤා කරන්න... කියා තෝමස් මර්ටන් නැමැති ට්‍රැපිස්ට් තාපසයා පවසයි. කිතුනු ජීවිතයේ අධ්‍යාත්මික සටන යාච්ඤා ජීවිතයෙන් වෙන් කළ නොහැක. යාච්ඤා කරන වේලාවේ සිතේ ඇතිවන ව්‍යාකූලත්වය හෙවත් සිත වෙන වෙන දේවල් කෙරෙහි දිව යෑම සාමාන්‍යයෙන් සැමදෙනාට ම යාච්ඤා කිරීමේ දී ඇතිවන පොදු බාධාවකි. අපි සැම මහත් කළබලකාරී, වැඩ බහුල, නොයෙකුත් ශබ්දවලින් පිරුණු පරිසරයක ජීවත්වෙමින් යාච්ඤාවට පිවිසෙන්නෙමු. සාර්ථක ලෙස යාච්ඤා කිරීමට නම් අපගේ ජීවිත රටාව ගැන සලකා බැලිය යුතුය. අප ගත කරන්නේ, කළබලකාරි වැඩ බහුල, අරමුණක් නැති ජීවිත පරිසරයක නම් යාච්ඤා කිරීමේ දී අපගේ සිත සැම තැන විසිර යාම වැළැක්විය නොහැකි ය. අපි ජීවත්වන අන්දමට යාච්ඤා කරමු.

යාච්ඤා කරන විට අප සිත් නොයෙකුත් දේ කෙරෙහි විසිර යාම ගැන වුවමනාවටත් වඩා කරදර නොවිය යුතුය. මේවා පැමිණීම අනිවාර්ය ය. අවශ්‍ය වන්නේ අපගේ යාච්ඤාවට විශ්වාසවන්ත වීම ය. හොඳින් යාච්ඤා කිරීමට ශුද්ධාත්මයාණන් අපට උදව් වන බව අවබෝධ කරගෙන ඔවුන්

වහන්සේට යාච්ඤාව බාර දෙමු. මෙහිදී පාවුලු තුමාගේ රෝම 8:26-37 දක්වා සිහිපත් කිරීම වටී.

එලෙස ම ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ දුර්වලකම් වල දී අපට ආධාර දෙන සේක. නිසිලෙස යාච්ඤා කළ යුත්තේ කෙසේ දැ. යි අපි නොදනිමු. එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ ම වචන වලින් කිය නොහැකි අපේ සුසුම්ලෑම් වලදී දෙවියන් වහන්සේ වෙත අප වෙනුවෙන් යදින සේක.,

යාච්ඤා ජීවිතය වර්ධනය වෙත් ම, යාච්ඤාවේ දී මුහුණ පෑ බාධක බොහෝ දුරට මග හැරෙනු ඇත. මෙයින් අදහස් වන්නේ මෙම බාධා නැති කිරීම හෝ අමතක කිරීම හෝ නොවේ. මෙවැනි බාධා අප ජීවිතයට ප්‍රායෝගික නොවන බව, යාච්ඤා තුළින් අධ්‍යාත්මික ජීවිතය වර්ධනය වීමේ දී පැහැදිලිව පෙනේ. ජීවිතයේ වෙනත් වැදගත් ප්‍රශ්න සහ අවස්ථාවලට අධ්‍යාත්මික ජීවිතය තුළින් අවධානය යොමුකරන විට ලෞකික දේවල් කෙරෙහි අපගේ අවධානය යොමු නොවේ.

## ස්වාමිවාක් ආරාධනාව හෙවත් පරමණ්ඩල යාච්ඤාව

**,.ස්වාමිවාක් ආරාධනය මුළු සුවිශේෂයේම සාරාංශයකි., - ටර්ටුලියන් තුමා**

අප බොහෝ දෙනෙක් මේ යාච්ඤාව දන්නා නිසා වේගයෙන් හා කඩ පාඩමින් කීමට පුරුදුවී සිටිති. නමුත් ඉතා සෙමින් කල්පනාකාරීව උච්චාරණය කිරීමෙන් මෙම යාච්ඤාවේ ඇති මහඟු වටිනාකම අපට පැහැදිලි වේ.

**කිතුනු සභාවේ යාච්ඤාවඃ**

ස්වාමිවාක් ආරාධනය ක්‍රිස්තුන් වහන්සේ අපට දෙන ලද අනගි දීමනාවකි. ආරම්භක දේව ප්‍රසාද නිධාන සඳහා සූදානම් වන නවකයින්ට, කිතුනු සභාවෙන් දෙන ලද ප්‍රථම දීමනාව නම්, ස්වාමින් වහන්සේ විසින් ම අපට උගන්වා දුන් මේ යාච්ඤාවයි. යාච්ඤා අතරින් උතුම් ම

යාච්ඤාවයි. සභාවේ දිනපතා නිල යාච්ඤාවේදී ද, දිව්‍ය පූජාවේ දිව්‍ය සත්ප්‍රසාද ලැබීමට පෙර ද අපි මේ යාච්ඤාව කියමු. කතෝලික හා රෙප්‍රමාදු යනුවෙන් මෙම යාච්ඤාව නොවෙනස් බවත්, එලෙස ම අද පූජා පිළිවෙතට ඇතුළුකර ඇති බවත් සඳහන් කළ යුතු ය.

## ආමන්ත්‍රණය

**අපගේ පියාණනී,**

අප මෙය පෞද්ගලිකව උච්චාරණය කළත් ඇත්තෙන් ම සාංඝික යාච්ඤාවකි. කිතුනු සංඝයේ උතුම් ම යාච්ඤාවයි. ශු ජෝන් ක්‍රිසොස්තම් තුමාගේ වචන නව කතෝලික ධර්මෝපදේශය ගෙන හැර පායි. ..අප ස්වාමින් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපට මේ යාච්ඤාව ඉගැන්වූයේ අප සහෝදර සහෝදරියන් සමග එකට එකමුතු වී උච්චාරණය කිරිම සඳහා ය. ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණනි.. යනුවෙන් පියාණන් වහන්සේට ආමන්ත්‍රණය කරමු. අපි, .මාගේ පියාණනි. යි කියා නොකියමු.

මේ යාච්ඤාව මමත්වයෙන් මිදී සියළු දෙනා උදෙසා යාච්ඤා කිරීමට අප පොළඹවයි. යාච්ඤාවෙන් අපට මතක්කර දෙන්නේ දෙවියන් වහන්සේ අප සැමගේත්, මුළු මැවිල්ලේත් පියාණන් බව ය.

**ස්වර්ගයේ වැඩ සිටින,**

දෙවියන් වහන්සේ අපෙන් ඈත එපිට සිටින කෙනෙක් නොවෙති. ඔවුන් වහන්සේ මහිමාන්විත ය. මහිමයෙන් යුත් දෙව් පියාණන් වහන්සේ බැහැපත් වූ සහ හෘදයෙන් ශාන්ත වූ අය වෙතට බෙහෙවින් සමීප වන්නෝ ය.

ක.ස.ධ ශු. අගුස්තිනු තුමාගේ වචන මෙසේ සඳහන් කරයි. .ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණනි. මින් අදහස් කරනුයේ, දෙවියන් වහන්සේ ශුද්ධ මණ්ඩපයේ වැඩ සිටින්නාක් මෙන් ධර්මිෂ්ඨ වූ අයගේ හෘදයන් තුළ ද වැඩ සිටින බව ය. එලෙස ම දෙවියන් වහන්සේට .පියාණනී. කියා අමතන අයගේ හෘදයන් තුළ වැඩ සිටීමට ආශා වන බව ය. දෙවියන් වහන්සේට .පියාණනී. කියා ඇමතීමෙන් අපගේ ඉල්ලීම් සහ ඔවුන් වහන්සේ ඉදිරියෙහි තැබීමට අපට ධෛර්යය ලැබේ. පළමු ඉල්ලීම්

තුනෙන්, අප ප්‍රේම කරන දෙවියන් වහන්සේ වෙතට අපි යොමු වෙමු. දෙවියන් වහන්සේගේ නාමයට ගෞරවය හා මහිමය දැක්වීමටත්, දේව රාජ්‍යය මෙලොව පැතිරීමටත්, ඔවුන් වහන්සේගේ කැමැත්ත එලොවෙහි මෙන් මෙලොව ද සිදු වීමටත් ඉල්ලා සිටිමු. මේ ඉල්ලීම් තුනේ දී අපගේ ඉල්ලීම් සඳහන් නොකරමු. මෙහි දී අපව අමතක කරන නිසා විශ්වාසයෙන් ධෛර්යවත් වී, බලාපොරොත්තුවෙන් පිරී, ප්‍රේමයේ ගින්නෙන් දල්වනු ලබමු.

ඉතිරි ඉල්ලීම් සතරෙහි මනුෂ්‍යයාගේ මූලික අවශ්‍යතා සඳහන් වේ. පෝෂණයත්, සුවයත්, පරීක්ෂා වලින් මිදීමත්, අයහපතින් මිදීමත්, අන්තිමේ දී සදාතන ජීවිතය දිනා ගැනීමත් ය.

**ඔබගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා,:**

දෙවියන් වහන්සේගේ ශුද්ධ වූ ශ්‍රී නාමය සියල්ලන් හඳුනා ගන්නා ලෙසත්, දෙවියන් වහන්සේගේ නාමය ශුද්ධ වූ නාමයක් සැටියට ගෞරව ලෙසත් ඉල්ලමු. ශුද්ධ වූ බව යන්නෙන් අදහස් කරන්නේ කිසිවෙකුට ළඟා විය නොහැකි සදාතනික අභිරහසකි. ලෝකය මැවීමේ දී මේ ශුද්ධ වූ බවෙන් කොටසක් ප්‍රකාශ වුණි. එය සම්පූර්ණයෙන් ම ප්‍රකාශයට පත් වූයේ ක්‍රිස්තු අභිරහස තුළ ය.

මතෙව් තුමාගේ සුවිශේෂයේ 11:27 හි මෙසේ සඳහන් වේ. ,මාගේ පියාණන් වහන්සේ සියල්ල මට පවරා දී ඇත. පියාණන් වහන්සේ හැර අන් කිසිවෙක් පුත්‍රයාණන් වහන්සේ නොහඳුනති. පුත්‍රයාණන් සහ පියාණන් වහන්සේ එළිදරව් කිරීමට පුත්‍රයාණන් විසින් තෝරා ගනු ලැබූ යමකේ වේ ද, ඔහු හැර අන් කිසිවෙක් පියාණන් වහන්සේ නොහඳුනති.,

මේ ඉල්ලීමේ ආරම්භය පුරාණ ගිවිසුමේ ඇත්තේ ය. පුරාණ ඉශ්රායෙල් ජනතාවගේ ගිවිසුම ගරුගාම්භීරාකාරයෙන් මුද්‍රා තබන ලද්දේ දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමය උච්චාරණය කිරීමෙනි. දිවැසිවරුන් විසින් බොහෝ විට ඉශ්රායෙල් ජනතාවගේ පාප දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමයට අගෞරව කිරීමක් ලෙස ප්‍රකාශ කරන ලදී. තම දේශයෙන් පිට කරන ලද

ඉශ්රායෙල් ජනතාව, නැවත එම දේශයට පැමිණියේ, දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමයට ගෞරව කිරීම සඳහා ය.

**ඔබගේ රාජ්‍යය පැමිණේවා,:**

**.බැසිලේයියා. (BASILEIA)** යන ග්‍රීක් වචනයට අර්ථයෙන් බොහෝ සමාන වූ වචන 3 ක් විය. ඒවා නම් රාජවංශය, රාජධානිය, රජකම ආදියයි. දේව රාජ්‍යය අපට ළඟා වූයේ **.දේව පුත්‍රයා.** මනුෂ්‍යයා වීමෙන් පසුව ය. ක්‍රිස්තුන් වහන්සේ දේව රාජ්‍ය ගැන දේශනා කළ සේක. එය පූර්ණත්වයට පැමිණියේ ගැලවීමේ අභිරහස තුළ ය. ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහස මගින් පාපයත්, මරණයත්, පරාජය කරනු ලැබ ජේසුස් වහන්සේ තුළ දේව රාජ්‍යය සම්පූර්ණයෙන් ම ස්ථාපිත විය. ඔවුන් වහන්සේ තුළ දේව රාජ්‍යය ළඟා විය.

**,ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් මෙලොවෙහි ද ඉටුවේවා,:**

මේ ඉල්ලීම, පළමු ඉල්ලීම් දෙකට එකතු කරන ලද්දකි. මෙහි පළමුවන කොටසින් .ඔබගේ කැමැත්ත ඉටුවේවාඬඬ මේ කොටස ක්‍රිස්තුන් වහන්සේ මල් උයනේ දී කළ යාච්ඤාවට බොහෝ සෙයින් නැකම් කියයි. මතෙව් සුවිශේෂයේ 7:21 වගන්තියෙන් අපට තවත් දෙයක් මතක් කර දෙයි. ,ස්වර්ගයේ වැඩ සිටින පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටුකරන අය මිස මට ස්වාමීනි, ස්වාමිනි, කියන සියල්ලෝ ම ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නේ ය., මේ ඉල්ලීම හා එය සම්බන්ධ කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ මෑණියන් වන මරියතුමිය සමගත්, දේව කැමැත්ත ඉෂ්ට කිරීමට ආශාවෙන් දෙවියන් වහන්සේට ප්‍රසන්න ජීවිතයක් ගතකරන ජනතාව සමගත් ය.

දෙවියන් වහන්සේගේ කැමැත්ත කුමක් ද? ..එකිනෙකාට ප්‍රේම කරන්න.. යන්නෙහි එය අන්තර්ගත වේ. ක්‍රිස්තුන් වහන්සේ අපට ප්‍රේම කළාක් මෙන් අප ද එකිනෙකාට ප්‍රේම කළ යුතු ය. මෙහි අදහස වනුයේ, දේව කැමැත්ත වන්නේ, දෙවියන් වහන්සේ විසින් ක්‍රිස්තුන් වහන්සේ තුළ අපට ප්‍රකාශ කරන ලද දේව අභිරහස පූර්ණත්වයට පැමිණවීම ය. එහි අදහස නම් ජුදෙව්වරුන් හා අන්‍ය ජාතිකයන් අතර වූ බාධක බිඳ දැමීම ය. ක්‍රිස්තුන් වහන්සේ තුළ සියල්ල සමතාවකට පත්කිරීම ය. මෙය

පූර්ණත්වයට පත්වූ විට සැබවින් ම දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමයට ගෞරව ලැබී, ඔවුන් වහන්සේගේ රාජ්‍යය මෙලොවට පැමිණේ.

දේව සැලැස්ම පරිපූර්ණත්වයට පැමිණෙන්නේ දේව කැමැත්තට පූර්ණ ලෙස අවනත වීමෙනි. දෙවියන් වහන්සේගේ පුත්‍රයා වූත්, මරිය තුමියගේ පුත්‍රයා වූත්, ජේසුස් වහන්සේ කීකරු කමේ පූර්ණ ආදර්ශය වූ සේක. ඔවුන් වහන්සේ නිතර ම තම පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටුකළ සේක. ඔවුන් වහන්සේ මනුෂ්‍යයෙකුව සිටි නිසා, දේව කැමැත්තට නතු වී, එය සම්පුර්ණයෙන් ඉෂ්ට කිරීම පහසු කාර්යයක් නොවී ය. හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද සංදේශයේ මෙසේ සඳහන් වේ. ,ඔවුන් වහන්සේ පුත්‍රයාණන් වූ නමුත්, තමන්ගේ දුක්විඳීමෙන් කීකරුකම ඉගෙන ගත් සේක. ඔවුන් වහන්සේ කීකරුකම ඉගන ගත්තේ දුක් විඳීම නැමැති පාසල තුළ ය, (හෙබ්‍රෙව් 5:8).

අප ද කීකරුකම උගත යුත්තේ ඒ පාසල තුළ ය. දේව කැමැත්ත කුමක් දැයි දැන ගැනීමට නම් අප විමර්ෂණයක යෙදිය යුතු ය. මීට උපකාර වන මඟ පෙන්වීම දස පනත මගින් හා සභාවේ ඉගැන්වීම් මගින් ලබා ගත හැකි ය. ශුද්ධාත්ම මඟ පෙන්වීම තුළ අපට මෙය අර්ථවත්ව කළ හැකි ය. මේ ලෝකය තුළ දේව කැමැත්ත පූර්ණත්වයට පැමිණවීම, මේ ඉල්ලීම මගින් අපි බලාපොරොත්තු වෙමු. ශු. ජෝන් ක්‍රිසොස්තම් තුමා කියන අන්දමට ..මෙලොව ඇති නපුර දුරුකර සත්‍ය උදාවේවා( සියළු අවගුණ දුරුවී ධර්මගුණ ඇති වේවා.. ඇත්තෙන් ම අප ඉල්ලන්නේ මෙලොව ස්වර්ග රාජ්‍යයක් වීමට ය. නව ධර්මෝපදේශය තුන්වන ඉල්ලීම සාරාංශ කරමින් මෙසේ පවසයි. ඔවුන් වහන්සේගේ පුත්‍රයාණන්ගේ කැමැත්ත එකක්වන ලෙස අපි පියාණන්ගෙන් ඉල්ලමු. මේ ලෝකය තුළ දේව කැමැත්ත පූර්ණත්වයට පැමිණෙන ලෙසත් අපි ඉල්ලමු.

**..අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව..:**

දෙවියන් වහන්සේගේ විශ්වාසවන්ත ප්‍රිය දරුවන් හැටියට අපගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය දේ සපයා දෙන ලෙස අපි ඉල්ලා සිටිමු. අපගේ ශාරීරික පෝෂණය සඳහා දිනපතා භෝජනයට ආහාර ඉල්ලා සිටිමු. එලෙස ම එක් එක් දිනයට අවශ්‍ය අධ්‍යාත්මික වරප්‍රසාද සහ දේව දීමනා මෙ මගින් අපි බලාපොරොත්තු වෙමු.

අපගේ දිනපතා ආහාරය දෙවියන් වහන්සේගෙන් ඉල්ලීමේ දී ලොවින් හරි අඩක් ජනතාව බඩට අහරක් නැතිව කුසගින්නේ නින්දට යන බව අපි සිහියට නගා ගත යුත්තෙමු. දිළිඳුකම නිසා තම මූලික අවශ්‍යතාව පවා ලබාගත නොහැකි අපගේ ම සහෝදර සහෝදරියන් වෙත ඇති වගකීම මෙහි දී අපට සිහි ගන්වයි. සියළු මනුෂ්‍යයන්ගේ අවශ්‍යතා සපුරාලනු සඳහා ලොව ඇති අසාධාරණ සංස්ථා බිඳ දමා, සාධාරණ සමාජයක් ගොඩනැගීමේ වගකීම ද අප වෙත පැවරේ. නව ධර්මෝපදේශය අවධාරණය කරන අන්දමට සාධාරණත්වය අගය කරන මිනිසුන් නොමැතිව සාධාරණ සමාජයක් ගොඩනැගිය නොහැකි ය. පරමණ්ඩල යාච්ඤාවේ සඳහන් මේ සතරවන ඉල්ලීමත්, ක්‍රිස්තුන් වහන්සේ වදාළ පොහොසතා සහ ලාසරස්ගේ උපමාවත්, අන්තිම නඩු තීන්දුවත් මේ හා සම්බන්ධ වේ.

මේ ඉල්ලීම අපට තවත් කුසගින්නක් ගැන මතක්කර දෙයි. එය නම් දේව වචනයට අප තුළ ඇති කුසගින්නයි. කාන්තාරයේ පරීක්ෂාවට භාජනය වූ ක්‍රිස්තුන් වහන්සේ විසින් වදාරණ ලද ද්විතීය නීති සංග්‍රහයේ සඳහන් මේ වාක්‍යය මීට සුදුසුතම නිදසුනකි. ,මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව, දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන් සියළු වචන වලින් ය, (මතෙව් 4:4). එලෙස ම ආමොස් දිවැසිවරයා විසින් ලෝකයේ ඇතිවන සාගතයක් පිළිබඳ කියන ලද වචන ද අප සිහියට නැගේ. ,දේශය මුළුල්ලේ මහා සාගතයක් එවන කාලය ළංවන්නේ ය. ඒ සාගින්න කෑම සඳහා නොවේ. පිපාසය වතුර සඳහා නොවේ. එය ස්වාමින් වහන්සේගේ වචනය ඇසීමට ඇතිවන සාපිපාසය වේ. මෙසේ කියන්නේ ස්වාමින් වන මම ය, (ආමොස් 8:11). කිතුනුවන් සැටියට අපගේ ප්‍රධාන දූත කාර්යය, දිළිඳුන්ට දේව වචනය ප්‍රකාශ කිරීම ය.

අවසාන වශයෙන් අපගේ දිනපතා භෝජනය වශයෙන් ක්‍රිස්තුන් වහන්සේ විසින් අපට දානය කරන ලද ජීවිත දායක පූපය ඉල්ලා සිටිමු. ඒ දිව්‍ය සත්ප්‍රසාදය යි. දේව රාජ්‍යය පැමිණි විට, අපට සූදානම් කර තිබෙන සදාතනික මංගල භෝජනයට පෙර නිමිත්තක් වන දිව්‍ය සත්ප්‍රසාදය මින් අදහස් කෙරේ.

**,අපට වරද කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන්, අපගේ වැරදි ද අපට කමා කළ මැනව,෴**

මේ ඉල්ලීම සඳහා අපට ධෛර්යය අවශ්‍ය ය. අප අන්‍යයන්ට කමාකරන ප්‍රමාණයට අපට කමාකරන ලෙස අපි දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්නෙමු. වෙනත් අන්දමකට කියමු නම් අප අන්‍යයන්ට කමා නොකරමු නම් ඔවුන් වහන්සේගෙන් කමාව ඉල්ලීමට අපට හයියක් නැත. කමා නොවූ දාසයා පිළිබඳ උපමාවෙන් මෙය අපට මනාව පැහැදිලි වේ. ණය කරුවාගේ ස්වාමියා තමාට විශාල මුදලක් ණයව සිටි ණය කරුවාට එය ගෙවා ගැනීමට මාර්ගයක් නොමැතිවූ නිසා ඒ විශාල ණයෙන් ඔහු නිදහස් කරන ලදි ඒ ණයකරුවා තමාට සුළු මුදලක් ණයව සිටි තම සේවකයා ඒ ණයෙන් නිදහස් කිරීම ප්‍රතික්ෂේප කළ නිසා, මේ ඇසූ ස්වාමියා ඔහුගේ දැඩි ස්වභාවය ගැන කෝප වී සිරගෙදරට නියම කළේ ය. ..ඔබත් එකිනෙකා තමාගේ සහෝදරයාට මුළු සිතින් කමා නොකරන්නාහු නම්, ස්වර්ගයෙහි වැඩසිටින මාගේ පියාණන් වහන්සේ ද එසේ ම ඔබටත් කමා නොකරනු ඇත.. (මතෙව් 18:35). දයා සාගරය වූ, දෙවියන් වහන්සේ අපගේ නිමක් නැති පව් කමාකරන සේක් නම්, අපට සුළු වරදක් කළ අපේ සහෝදරයාට කමාව දීමට මැළිවන්නේ මන්දැ. යි ඔවුන් වහන්සේ අපෙන් අසන සේක. අප අන්‍යයන්ට සමාව නොදෙන්නේ නම් දෙවියන් වහන්සේ අපට සමාව නොදෙන සේක. සමාව දීමට නොහැකි හදවතක් ඇති තැනැත්තා දැඩි පුද්ගලයෙකි.

අපගේ තද හිත් දේව වරප්‍රසාද වලට විවෘත කරවීමෙන් එම වරප්‍රසාද අප තුළට ගලාවිත්, අප තුළින් අන් අය වෙත ගලා යා යුතුයි. ජේසුස් ස්වාමින් වහන්සේ පැහැදිලිව ම සඳහන් කරන ආකාරයට අන් අය යන්නෙන් අදහස් වන්නේ, අපගේ යාළු මිත්‍රයන් පමණක් නොව අපට හතුරුකම් කරන සෑම කෙනෙක් ද වෙති. අපගේ සමාව දීමේ ක්‍රියාවලියට සීමාවක් නැත. මන්ද, දෙවියන් වහන්සේගේ සමාව දීමේ ක්‍රියාවලිය අසීමිත නිසා ය.

**,පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදී,෴**

,පරීක්ෂාවට අසුනොවන පිණිස අවදිව සිට යාච්ඤා කරන්න.. ගෙත්සමෙනි උද්‍යානයේ මරණාසන්න දුකින් යාච්ඤා කළ ජේසුස් වහන්සේ නිදි කිරමින් සිටි තම ශ්‍රාවකයින් තිදෙනාට මේ වචන වදාළ සේක, (මතෙව් 26:41). අපට එදිනෙදා ජීවිත ගැටළු, ප්‍රශ්න පරීක්ෂා ආදියට මුහුණ දීමට සිදු වේ. මේවායින් ගැලවීමට අපට නොහැකි ය. එසේ නම්

මේ ඉල්ලීමෙන් අප යදින්නේ මොනවා ද? අපට මුහුණ දෙන්නට සිදුවන පරීක්ෂා වලට අසුවී පාපයට නොවැටෙන ලෙස ආරක්ෂා කරන මෙන් අපි ඉල්ලමු. එලෙස ම ශුද්ධාත්මාලෝකයෙන් පිරි නිවැරදි දේ කිරීමට අවශ්‍ය ශක්තිය ලැබෙන ලෙස ඉල්ලමු. පරීක්ෂා වලින් ජය ගැනීම අපගේ අධ්‍යාත්මික වර්ධනයට හේතුවක් වේ. පරීක්ෂා වලට අසුවීමෙන් අපි පාපයට වහල්වී අධ්‍යාත්මික පරිහානිය ළඟාකර ගනිමු.

**,අභයපතින් අප මුදා ගත මැනව,෴**

මේ අවසාන යැදුමෙන් සියළු ම නපුරෙන් හා අයහපතින් අප මුදල ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලමු. එදිනෙදා ජීවිතයේ දී දරන්නට සිදුවන දුක වේදනාව, කොන්කරනු ලැබීම්, කළ කිරීම් ආදී අනිවාර්යයෙන්ම අපට අත්දකින්නට සිදුවන අවසථා වල දී අවශ්‍ය ශක්තිය දෙන ලෙස ඔවුන් වහන්සේගෙන් ඉල්ලමු. නපුරට විරුද්ධව සටන් කිරීමට සිදුවන විට නොසැලී යහපත කිරීමට උදව් ඉල්ලමු. ක්‍රිස්තුන් වහන්සේ මේ සියළු නපුරෙන් අප මුදාගත් සේක. පියාණන් වහන්සේට ලෝකය පවරා දීමට අන්තිම දවසේ දී ඔවුන් වහන්සේ මහත් තේජශ්‍රීයෙන් නැවත පැමිණෙන විට මෙතෙක් අප බලාපොරොත්තු වූ සියලු දේ සම්පූර්ණයෙන්ම ලබා ගැනීමට අපට හැකිවේ.

මේ අදහස, දිව්‍ය පූජා වේලාවේ පරමණ්ඩල යාච්ඤාව අවසානයේ දී අපි ප්‍රකාශ කරමු. .දෙවි පියාණනී, සියලු අයහපතින් අප මුදා ඔබ වහන්සේගේ සාමය අපට දුන මැනව. ඔබ වහන්සේගේ මහත් කරුණාවෙන් පාපයෙන් අප මුදා සියළු කරදර වලින් අප ආරක්‍ෂා කළ මැනව. එවිට සමිඳාණන් නැවත පැමිණීමේ බලාපොරොත්තුවෙන් ජීවත් වීමට අපට හැකි වන්නේ ය.. .ආමෙන්. යන වචනයෙන් අවසාන වන්නේ ස්වාමින් වහන්සේගේ ආරාධනාව පමණක් නොවේ. නව කතෝලික ධර්මෝපදේශය ද මෙම වචනයෙන් නිමාවට පත් වේ. දෙවියන් වහන්සේ විසින් අනාවරණය කරන ලද සියල්ලට ද ක්‍රිස්තුන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද සියල්ලටද .ආමෙන්. යන පිළිතුර අපට දිය හැකි ය. ශු. පාවුළු තුමා කොරින්ති වරුන්ට ලියන ලද දෙවෙනි සංදේශයේ 1:19 වගන්තියෙන් මෙය අවසාන කිරීම වටී.

,අප විසින් ඔබ අතර දේශනා කළ දෙවියන් වහන්සේගේ පුත්‍ර වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුල .ඔව්., .නැහැ. කියා දෙගිඩියාවක් නැත. ඇත්තේ .ඔව්. යන්න පමණකි. දෙවියන් වහන්සේගේ සියළුම පොරොන්දු ඉටු කිරීම

පිළිබඳ .ඔව්. යන්න ක්‍රිස්තුන් වහන්සේ වන සේක. දෙවියන් වහන්සේට ගරු බුහුමන් කරනු පිණිස අප ක්‍රිස්තුන් වහන්සේ තුලින් .ආමෙන්. කියන්නේ ඒ නිසාය., (2 කොරින්ති 1:19-20).

## විවිධ භක්ති අභ්‍යාස

**ජපමාලය**

මරිය තුමියගේ පිහිට මධ්‍යස්ථකම සහ ආශිර්වාදය ලෝකයට අවශ්‍ය වූ සෑම අවස්ථාවක ම එතුමිය ක්‍රියා කර ඇති ආකාරය ලෝක ඉතිහාය තුළ ඇතුළත් ය.

දහතුන්වැනි ශතවර්ෂයේ දී **.ඇල්බිජෙන්සියන්.** නැමති භයානක වේද භේදයන් නිසා කතෝලික සභාව ඉතා දුර්භාග්‍ය අවස්ථාවකට මුහුණ පෑවා ය. ඒ කාල සීමාවේ දී දේව මාතාවෝ ශාන්ත දොමිනික් තුමාට දර්ශනය වී, යාච්ඤාවෙන් මිස කඩුවෙන් වත් තර්ක විතර්ක වලින්වත් මේ වේද භේදය ජය ගන්නට බැරි බව කියා එතුමාට ජපමාල භක්තිය ඉගැන්වූහ. එයින් සාර්ථක ප්‍රතිඵල ලැබුණි. වේද භේදකයෝ පරාදවූහ.

ශුද්ධ සභාව ඔක්තෝබර් මාසය ජපමාලය වෙනුවෙන් කැපකර ඇත. අද ජපමාලය ලෝපුරා ව්‍යාප්තවූ ප්‍රබල භක්ති අභ්‍යාසයකි. ලෝකයේ රැකවරණය, ජපමාලය ය. පවුලේ යාච්ඤාව ජපමාලය ය. ජපමාලය යනු ක්‍රිස්තුන්වහන්සේගේ මුළු ජීවිතය ගැඹුරු ලෙස මෙනෙහි කරන භක්ති අභ්‍යාසයකි. එය ශුද්ධ දේශයට සිතින් යන වන්දනා ගමනක් වැන්න. ඒ ඒ දිනවල ජපමාලය මෙනෙහි කරන විට අපේ අවධානය යොමුකළ යුතු අබිරහස් විස්සක් ඇත. ඒවා තේමා හතරක් යටතේ වර්ගකර ඇත.

**1. සොම්නස් අභිරහස් (සඳුදා, සෙනසුරාදා සහ ආගමන කාලයේ ඉරුදිනවල මෙනෙහි කිරීම සඳහා)**

I දෙව් මවුන්ට මංගලම් කීම.

II එළිසබෙත් තුමිය බැහැදැකීම.

III ජේසු කුමාරාණන්ගේ උත්පත්තිය.

IV ජේසු කුමරාණන් දේවමාළිගයේ පුද කිරිම.

V ජේසු කුමරාණන් දේව මාළිගයේ දී නැතිවීම සහ සම්භවීම.

**2. දොම්නස් අභිරහස් (අඟහරුවාදා, සිකුරාදා සහ චතාරිකයේ ඉරුදිනවල මෙනෙහි කිරීම සඳහා)**

I ජේසු සමිඳුන් මල් උයනේ දුක් විදීම.
II ජේසු සමිඳුන් ගල් කණුවේ බැද කස පහර විදීම.
III ජේසු සමිඳුන් හිස මත කටු ඔටුන්නක් පළඳවනු ලැබීම.
IV ජේසු සමිඳුන් කුරුසය උසුලාගෙන යෑම.
V ජේසු සමිඳුන් කුරසයේ ඇණ ගසණු ලැබ උකුත්වීම.

**3. මෝක්ෂ අභිරහස් (ඉරිදා සහ බදාදා දිනවල මෙනෙහි කිරීම.**

I ජේසු සමිඳුන් මළවුන්ගෙන් උත්ථාන වීම.
II ජේසු සමිඳුන් ස්වර්ගාරෝහණය වීම.
III දෙව් මවුන් සහ අපෝස්තුළුවරුන් වෙත ශුද්ධාත්මයාණන් වැඩමකිරීම.
IV දෙව් මවුන්ගේ ස්වර්ගාරෝපණය.
V දෙව් මවුන්ට ස්වර්ග රාජ්‍යයෙහි ඔටුනු පැළඳවීම.

**4. ආලෝකයේ අභිරහස් (බ්‍රහස්පතින්දා දිනවල මෙනෙහි කිරීමට)**

I ජේසු සමිඳුන්ගේ බෞතීස්ම ස්නාපනය.
II කානා නුවර විවාහ මංගලෝත්සවය.
III දේව රාජ්‍යය ප්‍රකාශ කිරීම.
IV ජේසු සමිඳුන් අන්‍ය රූප විලාශ වීම.
V ජේසු සමිඳුන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම.

## නුවාන

කිසියම් සුවිශේෂ අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා දින නවයක් පවත්වන භක්ති අභ්‍යාසයෙන් නුවාන වශයෙන් හැඳින්වේ.

සභා ඉතිහාසයේ මුල්ම නුවාන පවත්වා ඇත්තේ අපෝස්තුවරුන් විසිනි. ඒ ශුද්ධාත්මාගමනය අපේක්ෂාවෙන් සමූහයා එක්වී දින නවයක් නොකඩවා යාච්ඤා කළහ. දසවෙනි දින ශුද්ධාත්මයාණන් ඔවුන් වෙත වැඩම කළහ. ඒ වැඩම කිරීම තුළින් ලෝකය තුළ ක්‍රිස්තුන් වහන්සේගේ සභාව ක්‍රියාත්මක කිරීමට ඔවුහු සමත් වූහ. ගමේ දෙව් මැදුර කැප කර ඇති සාත්තුවරයාගේ හෝ සාත්තුවරියගේ වාර්ෂික මංගල්‍යයට සූදානමක් වශයෙන් නුවාන පවත්වනු ලැබේ. එයින් බලාපොරොත්තු වන්නේ එතුමන්ලාගේ වැදගත්කමින් විශ්වාසිකයන්ට ආත්මික ශාරීරික වරප්‍රසාදයන් ලැ▲ග සුව සහනය අත්වී දේව මහිමය වඩ වඩාත් ප්‍රකාශය වීම ය. දෙවිඳුන්ට තුති පැසසුම් පිදීම ය.

ඒ හැර විවිධ සාන්තුවර භක්තීන් පාදක කරගෙන පවත්නා නුවාන ද ඇත්තේ ය. ඒවා නියමිත දිනයන්හි සතිපතා පවත්වති. එවන් නුවාන ටිව්රිවීරි අද අප රටේ සුවිශේෂී තැනක් ගන්නේ මරිය මවුන්ගේ මැදහත්කම පතන .සදා සරණ. නුවානයන් ය. ඇතැම් තැනක ජේසු බිළිඳුන්ගේ නුවානයන් ය. තැනක ශාන්ත අන්තෝනිතුමන් නමින් ද, ශාන්ත ජූඩ්තුමා නමින් ද ආදී වශයෙන් පවත්වන නුවාන වලට විශ්වාසිකයන් සහභාගිවන්නේ තම අවශ්‍යතාවයන් සඳහා දේව අනුග්‍රහය පතමිනි. මේ නුවාන අර්ධ ජන වන්දනා භක්ති අභ්‍යාසයන් ය. දෙවෙනි ජුවාම් පාවුළු පාප්වහන්සේ නුවාන ගැන සඳහන් කරමින්, ඒවා ඇතැම් විශ්වාසිකයන්ගේ ඇදහිල්ල රඳා පවත්නා ආධාරකයන් බව ප්‍රකාශ කර ඇත.

ප්‍රධාන ම ජන වන්දනා මෙහෙය දිව්‍ය පූජාව බව අප අමතක නොකළ යුතු ය.

## <u>ශුද්ධ පැය</u>

ශුද්ධ පැය භක්ති අභ්‍යාසය ජේසුස් වහන්සේ විසින් ම ස්ථාපිත කරන ලද්දකි. ශාන්ත මාර්ගරීතා මරිය තුමිය මගින් ඒ ලෝකයා හඳුන්වා දුන්හ. ශුද්ධ පැය ගැඹුරු භාවනාවකි. අධ්‍යාත්මික භාවනාවකි. ජේසු සමිඳුන්ගේ

ජීවිතයේ අවසාන පැය කීපය ගැන කෙරෙන මෙනෙහි කිරීමකි. මේ මගින් කිතුනු ජීවිතයට ප්‍රබල ආත්මශක්තියක් ලැබේ. යටත් පිරිසයින් සතියකට

වරක්වත් කිතුනු ඒකක වශයෙන් හෝ පවුල් මට්ටමින් කිසියම් අපෝස්තලික සේවාවක් මගින් හෝ ශුද්ධ පැයක් පවත්වන්නේ නම් මැනවි.

දැනට අප විසින් පවත්වනු ලබන මේ සාම්ප්‍රදායික භක්ති අභ්‍යාසය ගැන නැවත වරක් සිතා බැලීමේ කාලය පැමින ඇතැ. යි සිතේ. අපට අවශ්‍යව ඇත්තේ ජේසු සමිඳුන්ගේ දුක්ප්‍රාප්තිය පිළිබඳව සංවේදී වීමක් පමණකත් නොවේ. නූතන ලෝකය තුළ ඔවුන් වහන්සේගේ ගැලවීමේ කාර්යයට දායක වීම සඳහා ආධ්‍යාත්මිකත්වයක් ලැබීම ය. අපගේ ජීවිත තුළ ගුණාත්මක වෙනසක් ඇති කර ගැනීම ය. සතියකට එක් ශුද්ධ පැයක භක්ති අභ්‍යාසයක් කළොත් එය සතියේ ඉතිරි පැය 167 ම කිතුනු ආකල්පයන් ඇතිව ජීවත් වීමට අවශ්‍ය ශක්තිය ලබා දෙන මුහුන් පිඤක් හෝ ලවණයක් කර ගැනීම ය. ශුද්ධ පැයෙන් පසු එයට සහභාගි වූවන් තුළ මෙවැනි ජීවිත වෙනසක් ඇති නොවේ නම් එය හුදු පැයක වාචික උච්චාරණයක් පමණ ය.

## කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2017 (2018)

(01) කතෝලික විශ්වාසය

II කොටස

**ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

03. (I) මැවිල්ල තුළින් අපට ලැබෙන දෑ පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(II) අද මැවිල්ල විනාශ වී යන අවස්ථා පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

04. (I) උත්පත්ති පොතේ පළමු පරිච්ඡේදයේ සඳහන් මිනිසා මැවීම හා වගකීම් පිළිබඳ කරුණු පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(II) "අලෝකය නම් මිනිස් වර්ගයාගේ ආරම්භයේ සිට ඔවුන් හසුරුවනු ලැබූ හෘදය සාක්ෂියයි." යන වදන්වලට ඔබේ වචනයෙන් සාක්ෂි දරන ආකාරය කරුණු පහකින් යුක්තව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

05. (I) කිතුනුවන්ගේ නපුරේ බලවේග පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(II) ඔබ සඳහන් කළ නපුරු බලවේග ජයගැනීමට ඔබ දරන උත්සාහයන් කරුණු පහක් සහිතව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

06. (I) භාග්‍ය අටෙන් ඉගැන්වෙන තේමා පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(II) සමස්ත භාග්‍ය අටෙන් ඔබේ ජීවිතයට ගත හැකි පාඩම් පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

07. (I) ක්‍රිස්තුන් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්ය පහක් නම් කරන්න. (ලකුණු 05)

(II) වපුරන්නා පිළිබඳ උපමාවෙන් ඔබේ ජීවිතයට ගත හැකි පාඩම් පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

08. (I) "ප්‍රාතිහාර්යයක්" යනු කවරේ ද යන්න කරුණු තුනකින් විස්තර කර, ඉන් දෙකකට උදාහරණ දෙක බැගින් ස!දහන් කරන්න. (ලකුණු 05)

(II) මිනිසුනට දෙවියන් වහන්සේගේ ප්‍රබල ක්‍රියා අත්දැකිය හැකි අවස්ථා පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

09. (I) ශුද්ධාත්ම ඵල පහක් ස!දහන් කරන්න. (ලකුණු 05)

(II) ශුද්ධාත්ම දීමනාවලින් ඔබ ඔබේ ජීවිතය බලවත්ත කරගන්නා ආකාරය කරුණු පහකින් දක්වන්න. (ලකුණු 10)

## කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2017 (2018)

(02) කතෝලික ජීවිත පැවැත්ම

II කොටස

**ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

03. (I) උත්ථානයෙන් පසු ජේසුස් ස්වාමීන් වහන්සේ ප්‍රකාශ වූ අවස්ථා පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(II) ජේසුස් වහන්සේගේ මෙලොවට පැමිණ සිදු කළ දූත කාර්යයන් පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

04. (I) දිව්‍ය පූජාවේ ආරම්භක පිළිවෙත පැහැදිලි කරන්න. (ලකුණු 05)

(II) දිව්‍ය පූජා මෙහෙය අර්ථවත් කර ගැනීමට ඔබට ගත හැකි ක්‍රියාමාර්ග පහක් විස්තර කරන්න. (ලකුණු 10)

05. (I) දේව ප්‍රසාද නිධානවල පොදු ලක්ෂණ පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(II) ආරම්භක දේව ප්‍රසාද නිධානයක් ලෙස ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන දේව වරප්‍රසාද පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

06. (I) 'දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉතා උතුම් වූ සහ විශිෂ්ට වූ දේව ප්‍රසාද නිධානයකි' මෙම අදහස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(II) ශුද්ධ වූ ජස්ටින්තුමා ඉදිරිපත් කළ දිව්‍ය පූජාවේ දළ සැලැස්ම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

07. (I) පව්කාරයාට සමාව ලබා ගැනීමේ වරප්‍රසාදය දීමට බලා සිටින දෙවියන් වහන්සේ ගැන ජේසුස් ස්වාමීන් වහන්සේ වදාළ උපමා තුන නම් කර, එම උපමාවලින් පෙන් වූ පොදු පණිවිඩය සඳහන් කරන්න. (ලකුණු 05)

(II) ශු. ලූක් සුවිශේෂයේ 24:13-32 හි සඳහන් 'එම්මාවුස් ගමන' තුළින් ඔබේ ජීවිතයට ගත හැකි මගපෙන්වීම් පහක් ලියා ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

08. (I) පේවාචාර්ය ධූරයට ඔසවනු ලැබූවන්ගේ වගකීම් පහක් ලියන්න. (ලකුණු 05)

(II) පූජා ප්‍රසාදිතුමෙකුගේ වගකීම් පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

09. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන එකකට පේළි පහක් පමණ වන සේ කෙටි සටහන් ලියන්න.

(I) දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපනය කිරීම පිළිවෙතේ කතාව
(II) අභිවෘද්ධි ආලේපනයේ දේව ප්‍රසාද නිධානය
(III) විවාහ ජීවිතයේ පරමාර්ථ
(IV) කිතුනු සභාව පූජක ජනතාවකි
(V) දිව්‍ය පූජාව (ලකුණු 05 බැගින්)

## කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2018 (2019)

(01) කතෝලික විශ්වාසය

### II කොටස

**ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

03. (I) උත්පත්ති 1:28 අනුව දෙවියන් වහන්සේ මනුෂ්‍යයා මවන ලද්දේ කවුරුන් ලෙස දැයි සඳහන් කර, මවන ලද සතුන් කෙරෙහි බලය පැවැත්විය යුතු සතුන් වර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(II) දෙවියන් වහන්සේ විසින් මවන ලද පරිසරය පිළිබඳ ව මනුෂ්‍යයාට පැවරෙන වගකීම් තුනක් සඳහන් කර, නූතන මනුෂ්‍යයා මෙම වගකීම් කොතෙක් දුරට ඉටු කරන්නේ දැයි කරුණු දෙකක් ඇසුරින් පහදන්න. (ලකුණු 10)

04. (I) කන්ද උඩ දේශනාවේ ප්‍රධාන තේමා පහක් ලියන්න. (ලකුණු 05)

(II) එම තේමා පහ ඔබේ ජීවිතයට සම්බන්ධ කර, විස්තර කරන්න. (ලකුණු 10)

05. (I) භාග්‍ය අටෙන් ආකල්ප පිළිබඳ සඳහන් භාග්‍ය පහක් නම් කරන්න. (ලකුණු 05)

(II) ''සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය.'' මෙම භාග්‍යයට අනුව කිතුනු අපගේ ප්‍රතිචාරය කරුණු පහකින් විස්තර කරන්න. (ලකුණු 10)

06. (I) රූපාන්තර පරිවර්තනය විස්තර කිරීමට උදාහරණ තුනක් සඳහන් කර, රූපාන්තර පරිවර්තනය සඳහා ශුද්ධ වූ බයිබලයෙන් උපුටන දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(II) යම් දිනක උත්ථානයට සුදුසු වන ආකාරයට මෙලොව ජීවිතය ගත කළ යුතු අයුරු කරුණු පහකින් විස්තර කරන්න. (ලකුණු 10)

07. (I) ශුද්ධ වූ ලූක්තුමා සඳහන් කරන ගැලවුම්කරුවාණන් පිළිබඳව ශුද්ධ වූ ජොහාන්තුමා තම සුපුවතින් දක්වන්නේ කෙලෙස දැයි කරුණු පහකින් විස්තර කරන්න. (ලකුණු 05)

(II) තරුණ ජීවිත අඳුරු ප්‍රපාතයකට ඇද දමන යුගයක ආලෝකයේ දරුවන් ලෙස ජීවත් වීමට ඔවුන්ට ලබා දිය හැකි අවවාද පහක් සඳහන් කරන්න. (ලකුණු 10)

08. (I) කිසියම් විශ්මයජනක සිදුවීමක් ප්‍රාතිහාර්යයක් වශයෙන් සලකන්නේ කෙලෙස ද, යන්න කරුණු තුනක් මගින් පහදා, එම පදනම මත ඇති ප්‍රාතිහාර්ය දෙකක් සඳහන් කරන්න. (ලකුණු 05)

(II) වර්තමාන සමාජය තුළ මනුෂ්‍යයා විවිධ සුව මෙහෙයන් සඳහා සුවය පතා සහභාගී වේ. මේ පිළිබඳව ඔබ දරන අදහස කරුණු පහකින් විස්තර කරන්න. (ලකුණු 10)

09. (I) ශුද්ධ වූ සභාව කෙරෙහි ගිහියාට හිමි වගකීම් පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(II) දේව කැඳවීමක් අපේක්ෂාවෙන් සිටින ඔබේ මිතුරකුට පූජක/පැවිදි ජීවිතය තුළ දැකිය යුතු වැදගත් ගුණාංග පහක් විස්තර කරන්න. (ලකුණු 10)

# කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2018 (2019)

(02) කතෝලික ජීවිත පැවැත්ම

II කොටස

**ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

03. (I) දිව්‍ය පූජාවේ දිව්‍ය සත්ප්‍රසාදයේ පිළිවෙත පැහැදිලි කරන්න. (ලකුණු 05)

(II) දිව්‍ය පූජාවට සහභාගි වීම පැහැර හරින ඔබේ මිතුරකුට එහි උතුම්කම අවබෝධ කර දීම සඳහා ඔබ ඉදිරිපත් කරන කරුණු පහක් කෙටියෙන් විස්තර කරන්න.(ලකුණු 10)

04. (I) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ හඳුන්වන වෙනත් නම් පහක් ලියන්න. (ලකුණු 05)

(II) දිව්‍ය සත්ප්‍රසාදීය ජේසු සමිඳුන්ගෙන් ඔබට ලැබෙන මඟපෙන්වීම් පහක් ලියන්න. (ලකුණු 10)

05. (I) සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය හඳුන්වන වෙනත් නම් පහක් ලියන්න. (ලකුණු 05)

(II) සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට පූජා ප්‍රසාදිවරයෙකු වෙත යාම අවශ්‍ය නැතැයි පවසන ඔබේ මිතුරකුට ඔබ දෙන අවවාද පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

06. (I) ''අභිවෘද්ධි ආලේපය හා ප්‍රසාද ස්නාපනය, දිව්‍ය සත්ප්‍රසාදය සමඟ ඉතා කිට්ටු සම්බන්ධතාවක් දක්වයි'' මෙම අදහස පැහැදිලි කරන්න. (ලකුණු 05)

(II) අභිවෘද්ධි ආලේපය ලැබීමෙන් පසු ඔබේ ජීවිතයේ ඇති විය යුතු වෙනස්කම් පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

07. (I) ප්‍රසාද ස්නාපනයේ ඇති අවශ්‍යතාව පිළිබඳව ක්‍රිස්තුන් වහන්සේ වදාළ දේ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(II) ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ සමාජයට ඔබ කරන්නා වූ දූත සේවා පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

08. (I) සාර්ථක කතෝලික විවාහ ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය වන සාධක පහක් ලියන්න. (ලකුණු 05)

(II) ආශිර්වාදකාර බන්ධනය පැවැත්වීම පිළිබඳව කරුණු පහක් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

09. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන, කෙටි සටහන් ලියන්න.

(I) තේවාචාරී ධූරය

(II) දිව්‍ය පූජාවේ ආරම්භක පිළිවෙත

(III) අවසාන ත්‍රිත්වික යාච්ඤාව

(IV) සත්ප්‍රසාදික රැස්වීම

(V) සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය දානය කිරීමේ පිළිවෙත් තුන

(ලකුණු 05 බැගින්)

## කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2018 (2019)

(03) කතෝලික සදාචාරාත්මක ජීවිතය

### II කොටස

**ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

03. (I) ''දරුවාට පෞද්ගලික සංවර්ධනය ලැබීමේ අධ්‍යාපනය පළමුවෙන්ම ලැබෙන්නේ පවුල තුළිනි'' මෙයට අදාලව කරුණු පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(II) අද පවුල් ජීවිතයට ඇති අභියෝග පහක් විස්තර කරන්න. (ලකුණු 10)

04. (I) කන්ද උඩ දේශනයට අනුව කිතුනු ජීවිතයට උචිත ප්‍රතිපත්ති පහක් ලියන්න. (ලකුණු 05)

(II) ''යහපත් සාරධර්ම කිතුනු ජීවිතය පෝෂණය කරයි'' මෙම කියමන වචන 100 කින් පමණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

05. (I) කතෝලික සභාව අනුමත කර ඇති ණය මංගල්‍යය පහක් ලියන්න. (ලකුණු 05)

(II) ඉරු දින දිව්‍ය පූජාව අමතක කර විවිධ සුව මෙහෙයන් සඳහා යන මිතුරකුට ඔබ දෙන අවවාද පහක් සඳහන් කරන්න. (ලකුණු 10)

06. (I) පළමුවෙනි දේව පනතින් අවධාරණය කරන ප්‍රධාන ඉගැන්වීම් පහක් ලියන්න. (ලකුණු 05)

(II) ඊශ්‍රායෙල් ජනතාවට යහපත් දිවි පෙවෙතක් ගොඩනගා ගැනීමට දස පනත ඉවහල් වූ අයුරු වචන 100 කින් පමණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

07. (I) ''කිතුනු ජීවිතයේ පදනම ප්‍රේමයයි'' මෙය කරුණු පහකින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(II) ''දරුවෙකු ගබ්සා කිරීම පස්වන දේව පනතට විරුද්ධ පාපයකි.'' මෙය වචන 100 කින් පමණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

08. (I) ධනපතියා සහ ලාසරස්ගේ කථාව සැකෙවින් ලියන්න. (ලකුණු 05)

(II) ධනපතියා සහ ලාසරස්ගේ කථාවෙන් දෙන පණිවිඩ පහක් විස්තර කරන්න. (ලකුණු 10)

09. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන, කෙටි සටහන් ලියන්න.

(I) පළිගැනීම පිළිබඳ ඉගැන්වීම

(II) දෙවියන් වහන්සේගේ නාමයට දිය යුතු ගෞරවය

(III) යුද්ධය පිටුදැකීම

(IV) සත්‍යවාදී භාවය

(V) සාරධර්ම (ලකුණු 05 බැගින්)

## කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2017 (2018)

(04) යාච්ඤාවේ ජීවිතය

II කොටස

**ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

03. (I) අන් අය වෙනුවෙන් කිතුනු අප කරන යාච්ඤාවේ ඇති වැදගත්කම කරුණු පහකින් ලියන්න. (ලකුණු 05)

(II) ''යාච්ඤාව දෙවියන් වහන්සේ හා සම්බන්ධ ජීවිතයක්'' යන ශීර්ෂය යටතේ වචන 100 ක පමණ රචනයක් ලියන්න. (ලකුණු 10)

04. (I) නව ධර්මෝපදේශයට අනුව අබ්‍රහම් දේව කැමැත්තට අවනත වීම හෘදයට අවධානය යොමු කිරීමක් බව සනාථ කිරීමට කරුණු පහක් ලියන්න. (ලකුණු 05)

(I) ''දෙවියන් වහන්සේගේ අති උතුම් මහිම ප්‍රතාපයට යාච්ඤාවෙන් මෙන් ම ගෞරවයෙන් ප්‍රසංශාව පිදිය යුතුයි.'' යන ශීර්ෂය යටතේ සඟරාවක පළ කිරීම සඳහා වචන 100 කින් පමණ වූ ලිපියක් ලියන්න. (ලකුණු 10)

05. (I) 'දුර්පරීක්ෂාවනට නොපමුණුවන' ලෙස දෙව්පියාණන්ට අප යාච්ඤා කරන්නේ කුමන හේතු නිසා දැයි දැක්වීමට කරුණු පහක් ලියන්න. (ලකුණු 05)

(II) ''මෝසෙස්තුමාගේ යාච්ඤා ජීවිතය එතුමා දෙවිඳුන්ගෙන් ලබාගත් දායාදයකි.'' යන ශීර්ෂය යටතේ පවත්වන දේශනයකට අවශ්‍ය මූලික කරුණු කිහිපයක් ලියන්න. (වචන 100 කින් පමණ) (ලකුණු 10)

06. (I) ''අපගේ හෘදය දෙවියන් වහන්සේගෙන් දුරස්ව පවතී නම්, අප කරන යාච්ඤා නිශ්ඵල ය.'' නව ධර්මෝපදේශයේ සඳහන් පරිදි එයින් මිදීමට කරන යෝජනා පහක් ලියන්න. (ලකුණු 05)

(II) අපගේ යාච්ඤාවලට ඇහුම්කන් නොදෙන බව කියමින් දෙවියන්ට දෝෂාරෝපණය කරන ඔබේ මිතුරකුට ඔබ දෙන උපදෙස් පහක් ලියා, ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

07. (I) අප යාච්ඤා කරන විට 'අපගේ පියාණනි' කියා ඇමතීම තුළින් සනාථ වන දේවධාර්මික කරුණු පහක් ලියන්න. (ලකුණු 05)

(II) ''රාජ්‍යය ද, බලය ද, මහිමය ද, සදහට ම ඔබ වහන්සේගේ' යන ප්‍රකාශය තුළින් කිතුනු අප කුමන කාරණා අවධාරණය කරයි ද යන්න කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

08. (I) මරියතුමිය දෙව්පියාණන්ට කළ යාච්ඤාව උන් වහන්සේගේ ප්‍රේමණීය සැලැස්ම සමඟ මානව සම්බන්ධතා ගොඩනැගීමට උපකාර වූ බව කරුණු පහකින් ලියන්න. (ලකුණු 05)

(II) ''යාච්ඤාවේ දී ඉතා වැදගත් වන්නේ බැහැපත්කමයි'' පරිසිවරයා සහ අයකැමියා උපමාව තුළින් මෙය වචන 100 කින් පමණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

09. පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.

(I) නුවාන පැවැත්වීමේ ආධ්‍යාත්මික ඵලය

(II) දොමිනස් අභිරහස් තුළ මෙනෙහි කරන කරුණු

(III) වාචික යාච්ඤාවේ වැදගත්කම

(IV) උන් වහන්සේ දුක් විඳීමෙන් කීකරුකම ඉගෙන ගත්තේ ය. (හෙබ්‍රෙ 5.8)

(V) මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව දේව වචනය තුළින් ය. (මතෙව් 4.4)

( ලකුණු 05 බැගින්)

## කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2017 (2018)

### (03) කතෝලික සදාචාරාත්මක ජීවිතය

### I කොටස

01. ප්‍රශ්න අංක (I) සිට (X) තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ අංකය, ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

(I) පෞද්ගලික දේපල පරිහරණය කළ යුතු අකාරය පිළිබඳ ව සමිදාණන් අපහට නියෝග කරන දේව පණත් දෙක නම්,

(1) අට සහ දසවන දේව පණත් (2) හත සහ අටවන දේව පණත්

(3) පළමු සහ දෙවන දේව පණත් (4) හත සහ දසවන දේව පණත් ( ..... )

(II) ස්වාභාවික නීතියට විරුද්ධව කටයුතු කරන තැනැත්තා

(1) සුළු පාපයක් කරයි. (2) සභාවෙන් ඈත්වෙයි

(3) බරපතල වරදක් කරයි (4) ස්වභාවධර්මයට පිටුපායි ( ..... )

(III) "ගුරුදේවයිනි ව්‍යවස්ථාවලියේ ශ්‍රේෂ්ඨතම ආඥාව කුමක් දැයි" කියා ප්‍රශ්න කළේ කවරෙක් ද?

(1) අයකැමියෙක් (2) විනයධරයෙක්

(3) ජුදා ජාතිකයෙක් (4) රාජ්‍ය නිලධාරියෙක් ( ..... )

(IV) ප්‍රේමයේ පණත පිළිබඳව ශු. පාවුළුතුමා ප්‍රකාශ ඇත්තේ කුමන හසුන්පතේ ද?

(1) රෝම ලිපිය (2) 1 කොරින්ති ලිපිය

(3) 2 කොරින්ති ලිපිය (4) ගලාති ලිපිය ( ..... )

(V) ''බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ භාග්‍යවන්තයෝ'' ය මෙම ඉගැන්වීම අනුසාර කරන්නන් ලෙස හඳුන්වන්නේ,

(1) සෑම කාරණයක දී ම දේව සංරක්ෂණය තුළ යැපෙන්නන් ය.
(2) බැහැපත් ලෙස ජීවිතය ගෙනයන්නන් ය.
(3) නිහතමානීව ජීවිතය ගෙනයන්නන් ය.
(4) කරදර අවස්ථාවලදී දෙවියන් සරණයන්නන් ය. ( ..... )

(VI) සැපතට හා විපතට හේතුවන කරුණු ඉදිරිපත් කරන සුවිශේෂකවරයා වන්නේ,

(1) ශු. මාර්ක්තුමා ය. (2) ශු. ලූක්තුමා ය.
(3) ශු. ජොහාන්තුමා ය. (4) ශු. මතෙව්තුමා ය. ( ..... )

(VII) දෙවියන් වහන්සේ මවා ඇති මැවිලිවල පිළිවෙල දැනගත හැක්කේ,

(1) දැනුම මගිනි (2) අවබෝධය මගිනි
(3) බුද්ධිය මගිනි (4) අධ්‍යයනය කිරීම මගිනි ( ..... )

(VIII) ශාරීරික පුණ්‍යක්‍රියාවක් වනුයේ,

(1) මර්ධන ක්‍රියා කිරීම ය. (2) එක්වරුශීලය රැකීම ය.
(3) උපවාස ක්‍රියා කිරීම ය. (4) වහලුන් නිදහස් කිරීම ය. ( ..... )

(IX) ''ඔබගේ ශරීරය ඔබට දෙවියන් වහන්සේ වදාළ ඔබ තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරයය'' එය කෙලෙසීම කුමන පනත් කඩ කිරීමක් ද?

(1) හය හා නවවන පණත් (2) හය හා අටවන පණත්
(3) නවය හා දහවන පණත් (4) හය හා හත්වන පණත් ( ..... )

(X) කතෝලික සභාවේ පළමු විශ්ව ලේඛනය වන්නේ කුමක් ද?

(1) ලෝක සාමය ලේඛනය (2) වෙහෙසෙන මිනිස්සු ලේඛනය
(3) ජනතා ප්‍රගතිය ලේඛනය (4) අයුක්තියට පිළිතුර ලේඛනය

( ..... )

(ලකුණු 02 X 10 = 20 )

02 ප්‍රශ්න සියල්ලට ම කෙටි පිළිතුරු දී ඇති තිත් ඉරි මත ලියන්න.

(I) රූප වන්දනාව යනු කුමක් ද?

.....................................................................................................

.....................................................................................................

(II) දේව අණ පනත් පිළිපැදීම අපගේ යුතුකමක් වන්නේ කුමක් නිසා ද?

.....................................................................................................

.....................................................................................................

(III) ඉරුදින දිව්‍ය පූජාවට සහභාගිවීමේ ණය යුක්තිය බලනොපාන අවස්ථා දෙකක් ලියන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

(IV) සමාජයේ කුඩාම ඒකකය වන පවුල තුළින් ගොඩනැගෙන සාරධර්ම දෙකක් ලියන්න.

(අ) ..........................................................................................

(ආ) ..........................................................................................

(V) ස්වභාවධර්මයේ ක්‍රියාපටිපාටිය පිවිතුරු සහ යහපත් වන්නේ කුමන හේතුවක් නිසා ද?

..........................................................................................

..........................................................................................

(VI) දේව රාජ්‍යයේ පදනම කුමක් ද?

..........................................................................................

..........................................................................................

(VII) භාග්‍ය අට අනුව ස්වර්ග රාජ්‍යය හිමිකර ගැනීමට හැකිවන්නේ කවුරුන් හට ද?

..........................................................................................

(VIII) දස පණත සර්වකාලීන නීති පද්ධතියක් යැයි කියන්නේ ඇයි?

..........................................................................................

..........................................................................................

(IX) නිදහස් කැමැත්ත යනු කුමක් ද?

..........................................................................................

..........................................................................................

(X) සෑම දෙනම ක්‍රිස්තුන් වහන්සේ තුළ සහෝදරයන් මෙන් සැලකීම කිනම් දේව පණතට අයත් ද?

..........................................................................................

..........................................................................................

..........................................................................................

( ලකුණු 02 X 10 = 20 )

**ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය**

19, බැල්කම් පෙදෙස,
කොටා පාර, කොළඹ 08.
දුරකථනය : 011-2685459
ෆැක්ස් : 011-2665021
විද්‍යුත් තැපෑල: natcatbible@gmail.com

PRINTED BY : NUWANA PRINTERS 032 20 56 888